වාර්ෂික වාර්තාව

2018

අපගේ දැක්ම

ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත්
තිරසාර ලෙස කළමනාකරණය
කරමින් ව්‍යවසායකත්ව
කෘෂිකර්මය පෝෂණය කිරීම
සඳහා කැප වූ ඉතා සුවිශේෂී
විශිෂ්ඨ ආයතනයක් බවට පත්
වීම

<u>අපගේ මෙහෙවර</u>

අතිශයින්ම ඵලදායී වන පර්යේෂණ තොරතුරු ජනනය කිරීම සහ නිර්මාණශීලී ව්‍යවසායකත්වයක් සඳහා වන උපායමාර්ගික, සහභාගීත්ව සහ සාධනීය සමාජයක් උදෙසා මනාව හැඩගැස්වූ සහ ස්ථිරසාර වූ විශිෂ්ය අධ්‍යාපනික ක්‍රමවේදයක් තිරසාර ස්වභාවික සම්පත් කළමනාකරණයක් තුලින් නිර්මාණය කිරීම.

අධ්‍යක්ෂවරයාගේ පණිවිඩය:

ශ්‍රී ලංකාව ප්‍රධාන වශයෙන්ම කෘෂිකාර්මික රටක් වන අතර ග්‍රාමීය ජනතාවගෙන් බහුතරයක්ම තම ජීවිකාව ලෙස ගොවිතැනෙහි යෙදී සිටී. එසේ වුවද, කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ ඵලදායිතාව අඩු වීම හා වාණිජ මට්ටමින් අගය එකතු කළ කෘෂිකාර්මික නිෂ්පාදන කෙරෙහි දක්වන නැඹුරුතාව අඩු වීම හේතුවෙන් අද දක්වාම දේශීය අවශ්‍යතා සපුරාලීම සඳහා ආනයනික ආහාර මත යැපීමට ශ්‍රී ලංකාවට සිදුව තිබේ. මෙම තත්ත්වය කෙරෙහි බලපාන ප්‍රධාන සාධකවලින් එකක් වන්නේ පාර්ශ්වකාර දාමය තුළ විශේෂයෙන් ගොවි ප්‍රජාව තුළ පවත්නා දැනුම් පරතරය යි.

කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ (UCIARS) දැක්ම වන්නේ අවබෝධය හා අධ්‍යාපනය ඉහළ නැංවීම තුළින් ගොවි ප්‍රජාව වැඩි දියුණු කොට දැනුම් පරතරය ඵලදායී අන්දමින් පියවීමත්, කෘෂිකාර්මික නිෂ්පාදනය තුළින් ස්වයංපෝෂිතභාවයට මං පෙත් විවර කරන්නා වූ දැනුම් හැකියාව හුවමාරු කරගැනීමේ සංසදයක් නිර්මාණය කිරීමත් ය.

කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය (UCIARS) යනු පවත්නා රාමුවෙන් ඔබ්බට ගොස් කටයුතු කරන ශ්‍රී ලංකාවේ පළමු වැනි ආයතනය වන අතර එමඟින් මෙරට කෘෂි ව්‍යවසායකයින් සඳහා ඩිප්ලෝමා, උසස් ඩිප්ලෝමා සහ කෘෂි තාක්ෂණි උපාධි පිරිනමනු ලැබේ. ශ්‍රී ලංකාවේ විශ්ව විශ්ව විද්‍යාල තුළ පවත්නා සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමය අභිබවා කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය (UCIARS) මඟින් පිරිනමනු ලබන අන්තර්ජාලගත පාඨමාලා කෙරෙහි වර්තමානයේ විශේෂ අවධානයක් යොමු වී ඇති අතර කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ පවත්නා දැනුම් පරතරය අවම කිරීමට මෙන්ම කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ තිරසාර බව ස්ථාපිත කිරීම සඳහා ද එය මනා රුකුලක් වී තිබේ.

ගොවිපල ඵලදායිතාව ඉහළ නැංවීමේ අරමුණින් කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය (UCIARS) මඟින් උසස් තත්ත්වයේ පටක රෝපිත කෙසෙල් පැළ හා වෙනත් රෝපණ ද්‍රව්‍ය ගොවි ප්‍රජාව වෙත සපය යි. කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ (UCIARS) තවත් සුවිශේෂී නවෝත්පාදනයක් වනුයේ දරිද්‍රතාව තුරන් කිරීමේ රජයේ වැඩසටහන ශක්තිමත් කරමින් අපනයනය කිරීමේ අරමුණින් අඹ ප්‍රවර්ධනය කිරීම සඳහා තාක්ෂණික යෙදවුම් (Tom-EJC) හඳුන්වා දීම යි.

කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ (UCIARS) අධ්‍යක්ෂ ලෙස 'පළමුව ගුණාත්මකභාවය' යන ආදර්ශ පාඨය අනුගමනය කරමින් අප තැබූ සෑම පියවරකදී ම අපගේ උපකුලපතිවරයා විසින් ලබා දුන් විශිෂ්ඨ සහයෝගය සහ මාර්ගෝපදේශනය සිහිපත් කරමින් මගේ හෘදයාංගම කෘතඥතාව එතුමා වෙත පුද කර සිටිමි. කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ (UCIARS) අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා නන් අයුරින් සහයෝගය දැක්වූ සියළු දෙනා වෙත ද මගේ ස්තූතිය පිරිනම මි.

මහාචාර්ය එස්.සුභසිංහ
කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි-තාක්‍ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය
අධ්‍යක්ෂ

පටුන

	පිටු අංක
1. සමාලෝචනය	
1.1 හැඳින්වීම	01
1.2 කළමනාකරණ මණ්ඩලය	02
1.3 විගණන කමිටුව	03
1.4 සංවිධාන ව්‍යුහය	04
2. සමස්ත කාර්යසාධනය	05
2.1 අධ්‍යයන වැඩසටහනේ කාර්යසාධනය	07
2.2 පැළ තවාන්/ විද්‍යාගාර කාර්යසාධනය	19
2.3 2018 වර්ෂය තුල UCIARS හි තාක්ෂණිකමය සංවර්ධනයන්	29
3. පර්යේෂණ සහ නවෝත්පාදන	32
4. පුහුණු, වැඩමුළු සහ කාර්ය මණ්ඩල සංවර්ධනය	33
5. නවීකරණය කිරීම් සහ ඉදිකිරීම් ව්‍යාපෘති	34
6. මූල්‍ය	36
පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර	
ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර	
ව්‍යාපෘති වියදම් පිළිබඳ (දේශීය/විදේශීය අරමුදල් සපයන) විස්තර	
මූල්‍ය ප්‍රගතිය (ඉපැයූ ආදායම) පිළිබඳ විස්තර	
2018 මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය	
2018 වර්ෂය තුළ ලැබුණු යටිතල පහසුකම් පිළිබඳ විස්තර	
2018 මූල්‍ය ප්‍රකාශන	
2018 තිරසර සංවර්ධනය මත පදනම් වූ අනාගත අපේක්ෂිත වාර්තාව	
2018 විගණකාධිපති වාර්තාව	
2018 විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු	

අරමුණු සහ ඉලක්ක

අරමුණ 01 : අත්‍යවශ්‍ය ගුණාංගයන්ගෙන් හෙබි උපාධිදාරීන් බිහි කිරීම ඉහළ නැංවීම

ඉලක්කයන්

1.1 දැනට පවත්නා උපාධි පාඨමාලාව සහ නව වෘත්තීය හා උපාධි පාඨමාලා සඳහා බඳවා ගන්නා ප්‍රමාණය වාර්ෂිකව 10% කින් වැඩි කිරීම.
1.2 බහුවිධ ඇතුලත් කර ගැනීමේ ප්‍රමාණය 0 සිට 3 දක්වා වැඩි කිරීම.
1.3 සියලු අධ්‍යයන කටයුතු වලදී මිශ්‍ර අධ්‍යයන ක්‍රමවේදය යොදා ගැනීම ඉහල නැංවීම.
1.4 විභාග ආපතිකයන් (casualities) වාර්ෂිකව 10% කින් අඩු කිරීම.
1.5 මෘදු කුසලතා (soft skills) සංවර්ධනය සඳහා වැඩි අවකාශයක් සහිතව (10%) විෂය මාලාව සංවර්ධනය කිරීම සහ ප්‍රතිව්‍යුහගත කිරීම.
1.6 ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම සහ ප්‍රතිඵල මූලික අධ්‍යාපනය සහ ඇගයීම ශක්තිමත් කිරීම.
1.7 ශිෂ්‍යයින් සහ උපාධිදාරීන් විසින් බිහි කරන කෘෂි ව්‍යාපාර ප්‍රමාණය වැඩි කිරීම.
1.8 අධ්‍යයන සම්පත් සහ පුහුණු පහසුකම් වැඩි කිරීම.

අරමුණ 02 : වැඩි දියුණු කළ ව්‍යාපාරිකමය හවුල් සම්බන්ධතා සහ අන්තර්ජාතික සහයෝගීතාවය

ඉලක්කයන්

2.1 පුහුණුව සහ පර්යේෂණ සහයෝගීතාව සඳහා කර්මාන්තය සමඟ අන්‍යෝන්‍ය වශයෙන් ශක්තිමත් සම්බන්ධතා ඇති කිරීම.
2.2 කර්මාන්තයේ "චලනයන් සහ සොලවන්නන් (movers and shakers)" සහ ප්‍රාජේක්ෂ්‍ය ව්‍යවසායකයින්, ආරාධිත කාර්ය මණ්ඩලය ලෙස පත් කිරීම.
2.3 පිළිගත් විදේශීය විශ්ව විද්‍යාල සමඟ අධ්‍යයන සහයෝගීතාව සහ පර්යේෂණ සහයෝගීතාව ඇති කිරීම.
2.4 "කාර්මික පර්යේෂණ ආසන", යුනෙස්කෝ ආසන, සාර්ක් ආසන යනාදිය පිහිටුවීම

අරමුණ 03 : වැඩි දියුණු කළ ශාස්ත්‍රීය පැතිකඩ (academic profile) සහ පර්යේෂණ හා ව්‍යාප්තියේ බලපෑම

ඉලක්කයන්

3.1 වර්ෂ 2022 වන විට කාර්ය මණ්ඩලයෙන් 80% සඳහා පශ්චාත් උපාධි පුහුණුව ලබා දීම.
3.2 වර්ෂ 2022 වන විට නව අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා, 50% දක්වා ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම.
3.3 කලාපීය කේන්ද්‍රීයකරණයක් සහිත ඉහළ බලපෑම් පර්යේෂණ සිදු කිරීම සහ සුචිගත කරන ලද (indexed journals) සඟරා වල එකී සොයා ගැනීම් ප්‍රකාශයට පත් කිරීම.
3.4 පර්යේෂණ සොයා ගැනීම් වාණිජකරණය කිරීම සහ තාක්ෂණ හුවමාරුව සඳහා පහසුකම් සැපයීම.
3.5 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හරහා ප්‍රජාවට නව තාක්ෂණ හා තොරතුරු සේවා සැපයීම.

අරමුණ 04 : වැඩි දියුණු කළ යටිතල පහසුකම් හා පහසුකම්

ඉලක්කයන්

4.1 යටිතල පහසුකම් වාර්ෂිකව 20% කින් වැඩි දියුණු කිරීම හා පුළුල් කිරීම.
4.2 වාර්ෂිකව පර්යේෂණ පහසුකම් 20% කින් වැඩි දියුණු කිරීම හා පුළුල් කිරීම.
4.3 ඉගැන්වීම, පර්යේෂණ සහ ඉගෙනුම් පහසුකම සඳහා 2019 වන විට තාක්ෂණික උද්‍යානයක් පිහිටුවීම.
4.4 2020 වන විට කාර්ය මණ්ඩලය සහ සිසුන්ගේ නවාතැන් පහසුකම 50% කින් වැඩි කිරීම.

4.5 2020 වන විට පොදු පහසුකම් සහ විනෝදාස්වාදය 50% කින් වැඩි දියුණු කිරීම.
4.6 හරිත අවකාශය / හරිත තාක්ෂණය වැඩි දියුණු කිරීම.

අරමුණ 05 : වැඩිදියුණු කළ පාලනය සහ මූල්‍ය කළමනාකරණය /විනය සහ මූල්‍ය යැපීම අඩු කිරීම

ඉලක්කයන්

5.1 අධ්‍යයන, පරිපාලන හා තාක්ෂණික කාර්ය මණ්ඩලයේ ශක්‍යතාවය වර්ධනය (අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිපුණතා ශක්තිමත් කිරීම).
5.2 2019 වර්ෂය වන විට පූර්ණ පරිගණකගත ඒකාබද්ධ කළමනාකරණ තොරතුරු පද්ධතියක් හඳුන්වා දීම.
5.3 වාර්ෂිකව 10% කින් විගණන විමසුම් අඩු කිරීම සහ වගවීම වැඩි කිරීම.
5.4 සකසුරුවම්කම, කාර්යක්ෂමතාව සහ සඵලදායීතාවය වැඩි දියුණු කිරීම (**3Es**) [බාහිරින් ලබා ගැනීම, තාර්කිකකරණය සහ සම්පත් බෙදාගැනීම (භෞතික, මානව හා මූල්‍ය)].
5.5 පුහුණුව, උපදෙස්, උපදේශනය, තොරතුරු සේවා, පේටන්ට් බලපත්‍ර, බලපත්‍ර, ප්‍රභූ පැලැටි අලෙවිය තුළින් ශුද්ධ ආදායම වාර්ෂිකව 10% කින් වැඩි කිරීම.

2018 වසරේ විශේෂ සිදුවීම්

1. බිම්මල් බැග් පිරවීමේ යන්ත්‍රයක් සංවර්ධනය කිරීම.

   මෙම ආයතනයේ කෘෂි තාක්ෂණික උපාධිය හදාරන 7 වන ශිෂ්‍ය කණ්ඩායමේ ශිෂ්‍යයකු වන ජී.පැතුම් හෂාන් මහතා විසින් මෙම යන්ත්‍රය සංවර්ධනය කර ඇති අතර මෙය 25% ක කාර්යක්ෂමතාවයකින් යුක්තව අතින් (manually) ක්‍රියාත්මක කල යුතු යන්ත්‍රයකි.

2. මෙම ආයතනය කරපිංචා, සාම්ප්‍රදායික සහල් සහ කුළුබඩු යෝග්‍ය ප්‍රමාණයන්ගෙන් මිශ්‍ර කර ක්ෂණික කොළ කැඳ වාණිජමය මට්ටමින් හඳුන්වා දී ඇත.

3. ජෛවීය දවටන පදම් කිරීම සහ කෙසෙල් කොළ භාවිතයෙන් ජෛව ආවරණ (පිඟන්) පිරිසැකසුම් කිරීම සඳහා ද්විත්ව කාර්ය යන්ත්‍රයක් නිෂ්පාදනය කිරීම.

4. දේශනාගාර සහ මූලික විද්‍යාගාරය සහිත නව ගොඩනැගිල්ල විවෘත කිරීම.

   පහසුකම් සහිත මූලික විද්‍යාගාරයකින් සමන්විත නව දේශනාගාරය 2018 නොවැම්බර් 06 දින කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂ මහාචාර්ය එස්.සුබසිංහ මහතා විසින් විවෘත කරන ලදී.

5. ගොවිපොළ පුහුණු පාඨමාලාව යටතේ ශිෂ්‍ය ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා, ආයතනයේ අක්කර 40කින් සමන්විත ගොවිබිම සංවර්ධනය කිරීමේ කටයුතු සඳහා අවශ්‍ය ජලය රැස් කිරීමට අක්කර අඩි 30කින් සමන්විත ජලාශයක් ඉදි කිරීම.

6. අක්කර 02ක වී වගා කල අතර ආයතනයේ ප්‍රථම වී අස්වැන්න 2018 වර්ෂය තුල දී ලබා ගෙන ඇත.

7. නව ආපනශාලාව විවෘත කිරීම.

   ශිෂ්‍යයින් සඳහා දැඩි අවශ්‍යතාවයක්ව පැවති ආපනශාලාව 2018 නොවැම්බර් 06 දින දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂ මහාචාර්ය ප්‍රියානි පරණගම මහත්මිය විසින් උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.

8. කාර්යමණ්ඩල නිලනිවාසය ඉදි කිරීම සඳහා මුල්ගල තැබීම.

   මෙම ආයතනය හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඉතා දුෂ්කර ප්‍රදේශයක පිහිටුවා ඇති නිසා, කාර්යමණ්ඩල නිලනිවාසයක් ඉදි කිරීම ආයතනය සඳහා දැඩි අවශ්‍යතාවයක්ව පැවතිණි. එබැවින් ඒ සඳහා මුල්ගල තැබීම 2018 නොවැම්බර් 06 දින කොළඹ විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රන්ජිත් මහානාම මහතා සහ කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්.සුබසිංහ මහතා විසින් සිදු කරන ලදී.

9. ආයතනයේ බුදු මැදුර ඉදි කිරීම සඳහා මුල්ගල තැබීම 2018 නොවැම්බර් 06 දින කෘෂිතාක්ෂණික අධ්‍යයන අංශයේ අංශ ප්‍රධාන ආචාර්යය එන්.පී.විදානපතිරණ මහත්මිය විසින් සිදු කරන ලදී.

10. ගව ගාල (Dairy shed), වියළීමේ ඒකකය (Dryer house) සහ බිම්මල් නිෂ්පාදනය කිරීමේ ඒකකය (Mushroom) ඉදි කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී.

2018 වසරේ කෘෂි තාක්ෂණික අධ්‍යයන අංශය තුළ සිදු වූ විශේෂ සිදුවීම්

1. බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ 2018 ජුලි මස 24 වන දින පැවති උපාධි ප්‍රදානෝත්සවයේ දී කෘෂි තාක්ෂණවේ දී උපාධිය, උපාධි අපේක්ෂකයින් 13 දෙනෙකු සඳහා ප්‍රදානය කරන ලදී.

2. IARS හි නව අධ්‍යයන වර්ෂය 2018 ජනවාරි 20 වන දින ආරම්භ කරන ලද අතර නව සිසුන් 192 දෙනෙකු නව කණ්ඩායම සඳහා බඳවා ගන්නා ලදී. ආයතනය විසින් සිසුන් චාරිත්‍රානුකූලව පිළිගන්නා ලද අතර කොළඹ විශ්ව විද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ලක්ෂ්මන් දිසනායක මහතා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී විය.

3. 2018 වර්ෂයේ දී ආයතනය කෘෂිකර්මාන්තය හැදෑරීමට කැමති උසස් පෙළ සමත් සිසුන්, නව ශිෂ්‍ය කණ්ඩායමක් ලෙස බඳවා ගෙන ඇත.

4. ලියාපදිංචි සිසුන් 300 ක් සමඟ නව ශිෂ්‍ය කණ්ඩායම (10 වන කණ්ඩායම) බඳවා ගැනීම.

5. මැලේසියාවේ මලයා විශ්ව විද්‍යාලයේ කණ්ඩායමක් UCIARS හි අධ්‍යයන වැඩසටහනක් සඳහා පැමිණීම.

6. මිශ්‍ර ඉගෙනුම් ක්‍රියාකාරකම් සංවර්ධනය කිරීම සඳහා මෙම ආයතනයේ උපාධි වැඩසටහන, යුනෙස්කෝ මිශ්‍ර ඉගෙනුම් ව්‍යාපෘතිය සඳහා තෝරාගෙන ඇත.

7. බිම්මල් සඳහා උපස්ථර බෑග් පිරවීම සඳහා යන්ත්‍රයක් සංවර්ධනය කිරීම.

8. කෙසෙල් කොළ සහිත ජෛව ආහාර ආවරණ නිෂ්පාදනය කිරීම සඳහා යන්ත්‍රයක් සංවර්ධනය කිරීම.

9. කණ්ඩායම් හයකට අයත් සියලුම සිසුන් සහභාගී කර ගනිමින් ''ප්‍රාණ'' නමින් සංස්කෘතික උත්සවයක් පවත්වන ලදී. මෙම වැඩසටහන පළමු වසර සිසුන් විසින් සංවිධානය කරන ලද අතර ප්‍රාණ සංස්කෘතික උත්සවය 2018 සැප්තැම්බර් මස 23 වන දින IARS හි අධ්‍යක්ෂ මහාචාර්ය එස්. සුබසිංහ මහතා, කළමනාකරණ මණ්ඩලයේ සාමාජික සහ හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් වන බන්දුල හරිස්චන්ද්‍ර මහතා සහ IARS හි හිටපු අධ්‍යක්ෂ එම්.ඩී.පියතිලක මහතාගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

10. සිව්වන කණ්ඩායමේ සිසුන් ගොවිපල පුහුණු පාඨමාලාව අවසන් කිරීමෙන් පසු "අස්වනු නෙලීමේ රාත්‍රිය" ලෙස උත්සවයක් සංවිධානය කල අතර මෙම උත්සවය අධ්‍යක්ෂ, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්. සුබසිංහ මහතා සහ සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් පැවැත්විණි.

1. සමාලෝචනය

1.1 හැඳින්වීම

මෙම ආයතනය, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2000 වර්ෂයේ කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධ කොට හම්බන්තොට වැලිගත්ත ප්‍රදේශයේ මාගම්පුර කෘෂි තාක්‍ෂණ හා ප්‍රජා සේවා මධ්‍යස්ථානය ලෙස ප්‍රථමයෙන් ස්ථාපනය කර ඇත. මෙම මධ්‍යස්ථානය 1998 වසර තරම් ඈතක දිගු ඉතිහාසයකට හිමිකම් කියන අතර විශ්ව විද්‍යාල පර්යේෂකයන් මෙම කාලය පුරා ප්‍රජාව සමග සම්බන්ධව, ඔවුන්ට තාක්ෂණය සහ දැනුම ලබා දීම සහ කලාපයේ කෘෂි කර්මය හා කෘෂි කර්මාන්තයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා සහයෝගයෙන් කටයුතු කර ඇත. මෙම ආයතනයේ නිර්මාතෘ වන්නේ කොළඹ විශ්ව විද්‍යාලයේ හිටපු උපකුලපතිනි සහ හිටපු විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිනී වන මහාචාර්ය ක්ෂණිකා හිරිඹුරේගම මැතිණිය යි.

1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතේ 24 'අ' වගන්තිය සහ 2008 අංක 02 දරණ කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්‍ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතන නියමාවලිය යටතේ කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධ උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස කොළඹ විශ්ව විද්‍යාලීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය ස්ථාපිත කරන ලදී. මෙම නියමාවලිය 2008 අගෝස්තු මස 23 වැනි දින සිට බලාත්මක වන්නේය.

කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය, කෘෂි තාක්ෂණික උපාධිය පාඨමාලාව පවත්වාගෙන යනු ලබයි. කොළඹ විශ්ව විද්‍යාලීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය විසින් පවත්වා ගෙන යනු ලබන මෙම සියලු පාඨමාලා ගොවි ප්‍රජාව තුළ අධ්‍යයන පරිසරයක් නිර්මාණය කිරීමේ ප්‍රධාන බාධා වන වයස, ඉඩ ප්‍රස්ථාව, කාලය සහ අධ්‍යයන පරිසරය යන සාධක මඟ හරවමින් සාර්ථකව දුරස්ථ අධ්‍යාපන ක්‍රමවේදය යටතේ ඉහත කී අධ්‍යාපන අවස්ථාවන් ලබා දීමට කටයුතු කර ඇත. මෙම ආයතනය කෘෂි තාක්ෂණය හා ග්‍රාමීය විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යාපනය ලබාදීම තුළින්, වර්තමානයේ කෘෂි තාක්ෂණය සහ කෘෂි කර්මාන්තය පිළිබඳ ව ප්‍රජාව අතර ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සිදුකර ඇත. එය ගොවි ප්‍රජාවගේ උසස් අධ්‍යාපනයට දොරටු විවෘත කිරීමේ සිහිනය සැබෑ කරමින් ඔවුන්ගේ නිවසටම දුරස්ථ අධ්‍යාපන ක්‍රමවේදය ඔස්සේ අධ්‍යාපනය ගෙන යමින් පුද්ගල වෙනස්කම් සිදු කිරීමට හා සමාජීය අවශ්‍යතා ඉටු කිරීමට සමත් වන්නේය. නමුත් ඔවුන්ගේ උසස් අධ්‍යාපනයට ඇති කැමැත්ත හෝ බලාපොරොත්තුව ඔවුන්ගේ පෞද්ගලික, ආර්ථික හෝ පවුල් පසුබිම හේතුවෙන් ගිලිහී යන අවස්ථාවන් දක්නට ඇත. මෙම ආයතනය ක්‍රියාත්මක කරන පාඨමාලා තෝරා ගැනීමට හා ඒවාට ප්‍රවේශ වීමේ නම්‍යශීලීත්වය නිසා දුප්පත් ග්‍රාමීය ගොවි ප්‍රජාවගේ වැඩිදුර අධ්‍යාපනය ලබන්නන්ට, නවීන තොරතුරු සන්නිවේදන තාක්ෂණය භාවිත කරමින් ඔවුන්ගේ අධ්‍යාපන යථාර්තය හා වෘත්තීය සමාජ අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීම සඳහා සුදුසු තෝතැන්නක් බවට පත්කර ඇත.

එපමණක් නොව මෙම ආයතනය විවිධ වැඩසටහන්වලට අමතරව ඉතාමත් සාධාරණ මිලකට දේශීය ගොවි ප්‍රජාවට පටක රෝපණ කෙසෙල් පැළ නිෂ්පාදන ලබා දීමට කටයුතු කරමින් ආයතනයේ ආදායම් උත්පාදනය කිරීමට ද සමත් වී ඇත. මේ වන විට පටක රෝපණ විද්‍යාගාර 03 ක් සහ ප්‍රධාන දැල් ගෘහ 03 ක් ඉදිකර ඇත. සෑම මසකම, සියළුම විද්‍යාගාර භාවිත කරමින් පටක රෝපණ කෙසෙල් පැළ 22,000 පමණ ප්‍රමාණයක් නිෂ්පාදනය කරන අතර ඒ තුළින් ගොවි ව්‍යවසායකයින් 6,500 කට පමණ පහසුකම් සපයා ඇත. මෙම ආයතනය දිවයින පුරා විසිරී සිටින ග්‍රාමීය ගොවි ජනතාවට පටක රෝපණ කෙසෙල් පැළ නිෂ්පාදනය කිරීමේ තාක්ෂණය සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා වැඩමුළු සහ සම්මන්ත්‍රණ විශාල ප්‍රමාණයක් පවත්වා ඇත. එසේම ග්‍රාමීය විද්‍යාවන්ට සම්බන්ධ නව තාක්ෂණය ගැන ගොවි ජනතාව දැනුවත් කිරීම සඳහා එම සම්පත් භාවිත කරමින් විවධ ජාතික මට්ටමේ ප්‍රදර්ශන සඳහා සහභාගී වී ඇත.

1.2 කළමනාකරණ මණ්ඩලය

2008 අංක 02 දරණ කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතන නියමාවලියේ 05 වන වගන්තිය ප්‍රකාරව කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය තම කළමනාකරණ මණ්ඩලය පිහිටුවා ඇති අතර උක්ත නියමාවලියේ 10 වගන්තිය ප්‍රකාරව එකී කළමනාකරණ මණ්ඩලය, ආයතනයේ අධ්‍යයන සහ විධායක මණ්ඩලය වන අතර එය පහත සාමාජිකයින්ගෙන් සමන්විත වේ.

වගු අංක 01: 2018 වර්ෂයේ කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය

නිල බලයෙන් පත්වූ සාමාජිකයින් (නියමාවලියේ දක්වා ඇති පරිදි)-05		
1	අධ්‍යක්ෂ- සභාපති	මහාචාර්ය එස් සුභසිංහ අධ්‍යක්ෂ
2	නියෝජ්‍ය අධ්‍යක්ෂ	නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරක් ආයතනය සඳහා අනුමත කර නොමැත.
3	උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අමාත්‍යාංශ ලේකම් හෝ විෂයභාර ලේකම් හෝ එකී අමාත්‍යාංශයේ උසස් අධ්‍යාපන විෂය සම්බන්ධයෙන් නම් කරන ලද සාමාජිකයෙකු	ඒ.එස්.පී. වීරසූරිය මහත්මිය ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
4	කෘෂිකර්ම විෂයභාර අමාත්‍යාංශයේ අමාත්‍යාංශ ලේකම් හෝ එකී අමාත්‍යාංශය විසින් නම් කරන ලද සාමාජිකයෙකු	පී.එස්.කේ.ආර්.වීරකෝන් මහතා අතිරේක ලේකම් (පරිපාලන හා මානව සම්පත් සංවර්ධන)
5	විද්‍යා පීඨයේ පීඨාධිපති/ කොළඹ විශ්ව විද්‍යාලය	මහාචාර්ය කේ.ආර්.ආර්. මහානාම
අනිකුත් සාමාජිකයින් (නියමාවලියේ දක්වා ඇති පරිදි)-06		
1	කෘෂි ව්‍යාපාර කර්මාන්ත හා කෘෂි තාක්ෂණය නියෝජනය කිරීම සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කරන සාමාජිකයින් දෙදෙනෙක්	මහාචාර්ය තාරා ද සිල්වා පැළෑටි අධ්‍යයන අංශයේ මහාචාර්ය, කොළඹ විශ්ව විද්‍යාලය
		මහාචාර්ය සමන් අබේසිංහ උද්භිද විද්‍යා අධ්‍යයන අංශය, රුහුණ විශ්ව විද්‍යාලය
2	පාලක සභාවේ සාමාජිකයින් අතරින් පත්කරගන්නා සාමාජිකයින් දෙදෙනෙක්	අනිල් රාජකරුණා මහතා Attorney at Law
		මහින්ද මඩිහහේවා මහතා සභාපති, සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් මණ්ඩලය
3	හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් හෝ ඔහු විසින් නම් කරන ලද සාමාජිකයෙකු	බන්දුල හරිස්චන්ද්‍ර මහතා
4	ශාස්ත්‍රීය මණ්ඩලයේ සාමාජිකයන් අතරින් පත්කර ගන්නා සාමාජිකයෙකු	ආයතනය සඳහා ශාස්ත්‍රීය මණ්ඩලයක් නොමැත.
ලේකම්		
	සහකාර ලේඛකාධිකාරී	එස්.ඒ.එස්. ප්‍රියදර්ශනී මහත්මිය

ආයතනයේ කළමනාකරණ මණ්ඩලය, අධ්‍යයන සහ පරිපාලන කරුණු පිළිබඳව සමාලෝචනය කිරීම සඳහා වසර තුළ දී විධිමත්ව රැස්වී ඇත. කළමනාකරණ මණ්ඩලය 2018 වසර තුළ අට වරක් (08) රැස් වී ඇත.

1.3 විගණන කමිටුව

ආයතනයේ විගණන කමිටුව සෑම වර්ෂයකම කාර්තුමය වශයෙන් රැස් වේ. 2018 වර්ෂය තුල විගණන කමිටුව 3 වරක් රැස් වී ඇත.

2018 වර්ෂය තුල විගණන කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

අනිල් රාජකරුණා මහතා	සභාපති/පාලක සභාව නම් කරන ලද
කේ.ඊ.ඩබ්.ජයසිරි මහතා	ලේකම්, ජ්‍යෙෂ්ඨ අභ්‍යන්තර විගණක, කොළඹ විශ්ව විද්‍යාලය
ඒ.එස්.පී.වීරසූරිය මිය	කළමනාකරණ මණ්ඩලයෙන් නම් කරන ලද, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
මහාචාර්ය කේ.ආර්.ආර්.මහානාම	කළමනාකරණ මණ්ඩලයෙන් නම් කරන ලද, පීඨාධිපති, විද්‍යා පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය
ඩබ්.ජී.එන්.අබේවික්‍රම මහතා	භාණ්ඩාගාරයේ නියෝජිත, ප්‍රධාන ගණකාධිකාරී, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට
ඩබ්.ඒ.ටී.ජී. වීරක්කොඩි මිය	විගණන අධිකාරී, රජයේ විගණන අංශය, කොළඹ විශ්ව විද්‍යාලය
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්.සුබසිංහ	අධ්‍යක්ෂ/ UCIARS
යූ.එල්.අබේසූරිය මහතා	වැඩබලන සහකාර මුල්‍යාධිකාරී/UCIARS (2018.10.28 දක්වා)
ඒ.ඩී.පී.ද සොයිසා	සහකාර මුල්‍යාධිකාරී/UCIARS (2018.10.29 සිට)
එස්.ඒ.එස්.ප්‍රියදර්ශනී	සහකාර ලේඛකාධිකාරී/UCIARS

1.4 සංවිධාන ව්‍යුහය


කළමනාකරණ මණ්ඩලය
ශාස්ත්‍රීය මණ්ඩලය
අධ්‍යක්ෂ
කොළඹ විශ්ව විද්‍යාලයේ සනාථන සභාවේ සාමාජිකයෙකි
පරිපාලන අංශය
මුදල් අංශය
අධ්‍යයන දෙපාර්තමේන්තුව
අධ්‍යයන මණ්ඩලය
මධ්‍යස්ථාන
කෘෂි-තාක්ෂණය
ආහාර- තාක්ෂණය
ව්‍යවසායකත්ව කෘෂි-ව්‍යාපාර හා ග්‍රාමීය විද්‍යාවන්
පර්යේෂණ හා උසස් උපාධි
අභ්‍යන්තර අධ්‍යයන වැඩසටහන්
බාහිර සහ ව්‍යාප්ති වැඩසටහන්
කෘෂි ව්‍යාපාර සහ කර්මාන්ත කවය
විද්‍යා උයන
ව්‍යාප්ති වැඩසටහන්

2. සමස්ත කාර්යසාධනය

ආයතනයේ ප්‍රමුඛ කාර්යභාරය වනුයේ අධ්‍යයන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පටක රෝපණ කෙසෙල් පැළ නිෂ්පාදනය සහ අනෙකුත් ගොවිපොළ නිෂ්පාදන වල නිරත වීමයි. මීට අමතරව, සමාජ අවශ්‍යතා හඳුනාගනිමින් සමාජ සත්කාරයක් ලෙස ගොවිතැන් කටයුතු හා අගය එකතු කළ කෙසෙල් වගා නිෂ්පාදන සම්බන්ධයෙන් නව තාක්ෂණය පිළිබඳව ග්‍රාමීය ගොවීන් දැනුවත් කිරීම සඳහා වැඩමුළු හා දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් ආයතනය විසින් පවත්වන ලදී.

2018 වර්ෂය තුළ දී ආයතනයේ අධ්‍යයන අංශය (කෘෂි තාක්ෂණික අධ්‍යයන අංශය) හරහා අධ්‍යයන ක්‍රියාකාරකම් ද පැළ තවාන් හා විද්‍යාගාර භාවිතයෙන් පටක රෝපණ කෙසෙල් පැළ නිෂ්පාදනය ද සිදුකරන ලදී.

67 දෙනකුගෙන් යුතු කාර්ය මණ්ඩලයේ සහයෝගය ඇතිව ආයතනය සිය ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට කටයුතු කරන ලදී. කාර්ය මණ්ඩලයෙන් 5% ක් පරිපාලන කටයුතු, 4% ක් අධ්‍යයන (ස්ථිර), 15% ක් අධ්‍යයන (පැවරුම්/තාවකාලික), 63% ක් අනධ්‍යයන (පැවරුම්) කාර්යමණ්ඩලය හා 16%ක් දෛනික පදනම මත සේවයේ පිහිටු වන ලද නිලධාරීන්ගෙන් සමන්විත වේ. (වගු අංක 02 සහ රූප සටහන අංක 01).

වගු අංක 02 : 2018 වර්ෂයේ ආයතනයේ කාර්යමණ්ඩලය

කාර්ය මණ්ඩල වර්ගීකරණය	සේවක සංඛ්‍යාව
පරිපාලන	3
අධ්‍යයන (ස්ථිර)	3
අධ්‍යයන (පැවරුම්/තාවකාලික)	10
අනධ්‍යයන (පැවරුම්)	42
දෛනික පදනම මත සේවකයින්	09
මුළු කාර්ය මණ්ඩලය	**67**



රූප සටහන 01 : 2018 වර්ෂයේ ආයතනයේ කාර්යමණ්ඩලය

වගු අංක **03 : 2018.12.31** දිනට ආයතනයේ පරිපාලන කාර්ය මණ්ඩලය

අනු අංකය	නම	තනතුර
1	ජ්‍යොෂ්ඨ මහාචාර්ය එස්.සුබසිංහ	අධ්‍යක්ෂ
2	එස්.ඒ.එස් . ප්‍රියදර්ශනී මිය	සහකර ලේඛකාධිකාරී
3	යූ.එල්. අබේසූරිය මහතා	සහකාර මූල්‍යාධිකාරී (වැඩබලන) (2018.10.28 දක්වා)
4	ඒ.ඩී.පී.ද සොයිසා	සහකාර මූල්‍යාධිකාරී (2018.10.29 සිට)

වගු අංක **04 : 2018.12.31** දිනට ආයතනයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය (පරිපාලන සහායක)

අනු අංකය	නම	තනතුර
1	ඩබ්.කේ.කේ රාජිකා නිලංගනී මහත්මිය	කළමනාකාර සහකාර
2	ආර්.වී.පී.එන්.පී. කුමාර මහතා	කළමනාකාර සහකාර
3	ඒ.ජී.යූ වසන්ති මෙනවිය	කළමනාකාර සහකාර
4	යූ.එම්.ඒ.ඒ.එම්. ද සිල්වා මහත්මිය	කළමනාකාර සහකාර
5	ජේ.ඒ.යූ ශ්‍රීනාත් මහතා	ගබඩා භාර කරු
6	එම්.ජී.ජේ.පී.එස්. සඳරුවන් මහතා	කළමනාකාර සහකාර
7	ඩබ්.අයි. චතුමලී මහත්මිය	කළමනාකාර සහකාර
8	කේ.ඩී.සී. ආරියසේන මහත්මිය	පරිගණක යෙදවුම් සහකාර

වගු අංක **05 : 2018.12.31** දිනට ආයතනයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය (සාමාන්‍ය පරිපාලන)

අනු අංකය	නම	තනතුර
1	කේ.එස්.ආර්. සම්පත් මහතා	ආරක්ෂක නිලධාරී
2	ඩබ්.එම්.චමින්ද මහතා	ආරක්ෂක නිලධාරී
3	කේ.පී. ගුණදාස මහතා	ආරක්ෂක නිලධාරී (අර්ධ කාලීන/ රාත්‍රී වැඩ මුරය)
4	එම්.ඒ.සී. ජයලත් මහතා	ආරක්ෂක නිලධාරී (අර්ධ කාලීන/ රාත්‍රී වැඩ මුරය)
5	එස්.වී. උපාලි මහතා	රියදුරු

<u>2018 වර්ෂයේ දී ඉඩම් අත් පත් කර ගැනීමේ ක්‍රියාවලියේ ප්‍රගතිය</u>

බුන්දල-විල්මැන්න රක්ෂිතය තුල පිහිටා ඇති ආයතනයට අයත් අක්කර 50න් අක්කර 40 ඉඩම් කොටස නිදහස් කර ගැනීම සඳහා ප්‍රධාන සැලසුම (Master Plan), භූ දර්ශන සැලසුම (Landscape plan), ජල අපද්‍රව්‍ය කළමනාකරණ සැලසුම (Waste Water Management Plan), ජලාපවාහන සැලසුම් (Drainage Plan) සහ ගොඩනැගිලි සැලසුම් සකස් කර වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

කෙසේවෙතත්, 2018 වර්ෂය අවසාන වන තුරු අක්කර 40 ඉඩම් කොටස නිදහස් කර ගැනීම සඳහා වරින් වර සිහි කැඳවීම් සිදු කල ද වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් අවසාන අනුමැතිය ලබා ගැනීමට නොහැකි විය.

2.1 අධ්‍යයන වැඩසටහනේ කාර්යසාධනය

2008 වසරේ දී කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය මගින් අධ්‍යයන පාඨමාලා හඳුන්වා දුන් අතර එමගින් දැනට කෘෂි කර්මාන්තයේ නියැලී සිටින පුද්ගලයන් හට කෘෂි තාක්ෂණය හා ග්‍රාමීය විද්‍යාවන් යනාදී ක්ෂේත්‍රයන් ඔස්සේ උසස් අධ්‍යාපනය ලබාදීමටත් ඔවුන් අතර මෙම අධ්‍යයන පාඨමාලා ප්‍රචලිත කිරීමට හා සංවර්ධනය කිරීමටත් අවස්ථාව ලැබී ඇත. කිසිවිටෙකත් උසස් අධ්‍යාපන මංපෙත් විවර නොවූ ගොවි ප්‍රජාව වෙත අධ්‍යාපනය, "මිශ්‍ර ක්‍රමවේදයක්" හරහා ලබාදීම මගින් පුද්ගල සහ සමාජයීය වශයෙන් ඔවුන්ගේ වෙනසක් සිදු කිරීමට හැකි වන්නේය. උසස් අධ්‍යාපනය ලබා ගැනීමට /හැදෑරීමට අවස්ථා සහ විභවයන් ඔවුන් සතු වුව ද ඔවුන්ගේ පෞද්ගලික හෝ පවුල් පසුබිම මත හෝ ආර්ථිකමය වශයෙන් පැන නැගුණ ගැටළු හේතුවෙන් එම අවස්ථා අහිමි වූ පිරිසක් මෙම අධ්‍යයන කටයුතුවල නිරත වේ. අධ්‍යයන පාඨමාලාවට ඇතුළත් වීම සඳහා වන ඇතුළත්වීමේ සුදුසුකම්වල සහ පාඨමාලා තෝරාගැනීමේදී දක්වන නම්‍යශීලීභාවය හදාරන්නන් හට ඉමහත් පහසුවක් වන අතර ආයතනය මගින් කරනු ලබන මගපෙන්වීම; නවීන තොරතුරු තාක්ෂණය හරහා ග්‍රාමීය ගොවි ප්‍රජාව හට ලබාදෙන මෙම උසස් අධ්‍යාපනයේ ඉහළ ගුණාත්මයට මෙන්ම අධ්‍යයන පාඨමාලා ඉතා පහසුවෙන් හැදෑරීමට හැකිවන පරිදි ඒවායෙහි ක්‍රමානුකූල බව පවත්වාගනිමින් ඊට අවකාශය සැළසීම ද ඔවුන්ගේ අධ්‍යයන, වෘත්තීමය සහ සමාජයීය අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීමට ඉමහත් රුකුලකි.

කෘෂිකාර්මික ව්‍යවසායකයින් සඳහා මෙය නවමු අධ්‍යාපනික අවස්ථාවක් වන අතර, ශ්‍රී ලංකාව තුළ දේශිය භාෂා මාධ්‍යයෙන් ග්‍රාමීය ගොවි ප්‍රජාවගේ දැනුම ඉහළ නැංවීම සඳහා ඔවුන්ට උදා වූ පළමු අවස්ථාව ද වේ. ශ්‍රී ලංකාවේ ගොවි ප්‍රජාව වැඩි වශයෙන් ග්‍රාමීය ප්‍රදේශයන් තුළ ඒකරාශි වී සිටින අතර, කෘෂිකර්මය සඳහා ඔවුන් ලබා දෙන දායකත්වය ඉතා ඉහළය. එහෙත් ග්‍රාමීය ගොවි ප්‍රජාවට සිය අධ්‍යාපනික, පුද්ගල සහ වෘත්තීමය සංවර්ධනය සඳහා ලැබෙන පහසුකම් ඉතා අඩුය. මේ නිසා, පළමු වරට, කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධ වැලිගත්ත කෘෂි තාක්ෂණික සහ ග්‍රාමීය විද්‍යා ආයතනය විසින් (UCIARS) දැනට කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ රැඳී සිටින ගොවීන් සඳහා කෘෂි තාක්ෂණික උපාධිය පිරිනමා තිබේ. මෙම වැඩසටහනේ සුවිශේෂී ලක්ෂණය වන්නේ ශ්‍රී ලංකාවට නැවුම් අත්දැකීමක් වන මාර්ග ගත හා විද්‍යුත් දුරස්ථ ඉගෙනුම් ක්‍රමය ඔස්සේ (online and distance e-learning method) මෙම අධ්‍යයන වැඩසටහන ක්‍රියාත්මක කිරීමයි. වර්තමානය වන විට ශිෂ්‍ය කණ්ඩායම් 10ක් (සිසුන් 700ක්) උපාධි වැඩසටහන් වල නියැලෙමින් සිටී. පළමු හා දෙවන කණ්ඩායම් මේ වන විටත් උපාධිය අවසන් කර ඇත.

අධ්‍යයන පාඨමාලාවේ අරමුණු

1. මිශ්‍ර ඉගැන්වීම් ක්‍රම වේදයක් ඔස්සේ (විශේෂිත වූ) ගොවි ප්‍රජාවට යාවජීව අධ්‍යාපනය, නම්‍යශීලීබව සහ ශිෂ්‍ය කේන්ද්‍ර ඉගෙනුම් ක්‍රමවේදය යනාදී මූලධර්ම මත පිහිටමින් ගොවි ප්‍රජාවට පුළුල් ප්‍රවේශයක් ලබාදෙමින් උසස් අධ්‍යාපනය (ප්‍රජාතාන්ත්‍රීකරණය කිරීම) සෑම පුරවැසියකුටම ලබාදීමේ අයිතිවාසිකම සනාථ කිරීම.

2. ගොවි ප්‍රජාව/කෘෂි කර්මාන්තයේ නියැලෙන්නන් දැනුම මත පදනම් වූ කෘෂි කර්මාන්තයේ යෙදවීම තුළින් කෘෂි නිෂ්පාදනවල ගුණාත්මය සහ ප්‍රමාණාත්මය වැඩි කිරීම.

වැඩසටහනේ සුවිශේෂී ලක්ෂණ

- කිසිදිනෙක උසස් අධ්‍යාපන සිහිනය සැබෑ නොවූ ගොවි ජනතාව වෙත අන්තර්ජාලය ඔස්සේ අධ්‍යාපනය ලබාදීම මගින් පුද්ගල සහ සමාජයීය වශයෙන් ඔවුන්ගේ වෙනසක් සිදුවීම.
- කෘෂි කර්මාන්තයේ නියැලෙන අතරතුර උසස් අධ්‍යාපනය හැදෑරීමේ අවස්ථාව/වරම් ගොවි ප්‍රජාවට හිමි වීම.
- නව කෘෂි තාක්ෂණයන් සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණය ශ්‍රී ලාංකීය ගොවි ප්‍රජාව වෙත හඳුන්වාදීම.
- ශ්‍රී ලාංකීක ගොවි ප්‍රජාව වෙනුවෙන් සැකසුණ ප්‍රථම විශ්ව විද්‍යාලයීය අධ්‍යයන පාඨමාලාව වීම.

- 2018 වසරේදී අ:පො:ස උසස් පෙළ සමත් කෘෂිකාර්මීය අධ්‍යාපනයට කැමැත්තක් දක්වන ශිෂ්‍ය කණ්ඩායමක් බඳවා ගන්නා ලදී.

කෘෂි තාක්ෂණික උපාධි පාඨමාලාවේ (BAgtec) අනුමැතිය ලබාදීම පිළිබඳ විස්තර

සනාථන සභාවේ අනුමැතිය : 338 වැනි සනාථන සභා රැස්වීම (2010.09.29)-විෂය නිර්දේශය
පාලක සභාවේ අනුමැතිය : 462 වැනි පාලක සභා රැස්වීම (2012.08.15) - අතුරු ව්‍යවස්ථා
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය : 867 වැනි විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා රැස්වීම (2013.02.07) - උපාධි පාඨමාලාව

කෘෂි තාක්ෂණික උපාධි පාඨමාලාවේ දළ සටහන

කෘෂි තාක්ෂණික උපාධි පාඨමාලාවේ කාලසීමාව වසර 04 කි.

'අධ්‍යයන වර්ෂයක්' සති 15 බැගින් වූ අධ්‍යයන සමාසික 02 කින් සමන්විත වන අතර අධ්‍යයන වැඩසටහන පදනම් වී ඇත්තේ 'පාඨමාලා සම්මාන ඇගයීම් ක්‍රමය' මත වන අතර එහිදී සිසුන් සමාසිකය පුරාම අඛණ්ඩව ඇගයීමට ලක් කරනු ලැබේ (එනම් සැකැස්ම) සහ අවසාන සමාසිකය ඇගයීම (එනම් සාරාංශය) නම් කරන ලද පාඨමාලා සඳහා සමාසිකය අවසානයේ පැවැත්වේ. එක් එක් පාඨමාලා ඒකක ආරම්භයේ දී අඛණ්ඩ ඇගයීම් සිදුකරන ක්‍රමවේදය සහ කාලසීමාවන් පිළිබඳව සිසුන්ට දැනුම් දෙනු ලැබේ.

කෘෂිතාක්‍ෂණවේදී ගෞරව උපාධිය සඳහා සුදුසුකම් ලැබීම සඳහා, අදාල ශිෂ්‍යයා විසින් අවසාන ශ්‍රේණියට දායක වන සම්මාන අගයන් (GPA course units) 120 ක් උපයා ගත යුතු අතර එසේම අවසාන ශ්‍රේණියට දායක නොවන (12 Non-GPA course units) පාඨමාලා ඒකකයන් ද ඇතුලත්ව සියලු පාඨමාලා සාර්ථකව සම්පූර්ණ කළ යුතු ය.

පාඨමාලා එක් එක් වසර සඳහා බණ්ඩනය කිරීම පහත පරිදි සාරාංශගත කර ඇත:

(පළමු වසර) - අවසාන ශ්‍රේණියට දායක වන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් (GPA course units) 30ක් සහ අවසාන ශ්‍රේණියට දායක නොවන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් 04ක් උපයා ගත යුතුය

(දෙවන වසර) - අවසාන ශ්‍රේණියට දායක වන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් (GPA course units) 30ක් සහ අවසාන ශ්‍රේණියට දායක නොවන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් 03ක් උපයා ගත යුතුය (සමුච්චිත වශයෙන් දෙවන වසර අවසානයේ දී අවසාන ශ්‍රේණියට දායක වන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් (GPA course units) 60ක් සහ අවසාන ශ්‍රේණියට දායක නොවන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් 07ක් උපයා ගත යුතුය)

(තෙවන වසර) - අවසාන ශ්‍රේණියට දායක වන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් (GPA course units) 32ක් සහ අවසාන ශ්‍රේණියට දායක නොවන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් 03ක් උපයා ගත යුතුය (සමුච්චිත වශයෙන් දෙවන වසර අවසානයේ දී අවසාන ශ්‍රේණියට දායක වන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් (GPA course units) 92ක් සහ අවසාන ශ්‍රේණියට දායක නොවන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් 10ක් උපයා ගත යුතුය)

(හතරවන වසර) - අවසාන ශ්‍රේණියට දායක වන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් (GPA course units) 28ක් සහ අවසාන ශ්‍රේණියට දායක නොවන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් 02ක් උපයා ගත යුතුය (සමුච්චිත වශයෙන් දෙවන වසර අවසානයේ දී අවසාන ශ්‍රේණියට දායක වන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් (GPA course units) 120ක් සහ අවසාන ශ්‍රේණියට දායක නොවන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් 12ක් උපයා ගත යුතුය)

පාඨමාලා ඒකකයක් හඳුනා ගැනීම සඳහා ඇල්ෆා සංඛ්‍යා කේතයක් (alpha numeric code) භාවිතා කරයි. කේතය 'කෘෂි තාක්‍ෂණය' යන වචන දැක්වීමට මුලට යොදන ලද AT නමැති අකුරු දෙකක් සහ ඉලක්කම් හතරකින් සමන්විත වේ.

එහි පළමු ඉලක්කම මගින් පාඨමාලා ඒකකය පිරිනමන 'වර්ෂය' ද දෙවන ඉලක්කම මගින් පාඨමාලා ඒකකය පිරිනමන 'සමාසිකය' ද දක්වයි. තෙවන ඉලක්කම මගින් පාඨමාලා ඒකකය සඳහා පවරා ඇති 'අනුක්‍රමික අංකය' දක්වයි (වගුව 06).

කෘෂි තාක්ෂණික උපාධි පාඨමාලාවේ විෂය මාලාව (Curriculum)

විෂය මාලාව සංශෝදනය කරන ලද අතර එය 2018.01.30 දින පැවති සනාථන සභාවේ 426 වන රැස්වීම් වාරයේ දී නිර්දේශ කරන ලදී.

T:Theory (න්‍යාය), P: Practical (ප්‍රායෝගික), IL:Individual Learning through LMS (LMS ඔස්සේ තනි පුද්ගල ඉගෙනුම)

විෂය කේතය	විෂයේ නම	සම්මාන අගය (GPA)	සම්මාන නොවන අගය (NGPA)	අධ්‍යයන කාලය (පැය) T:P:IL
Level 3 පළමු වසර පළමු සමාසිකය				
AT1101	ශෂ්‍ය විද්‍යා හා උද්‍යාන විද්‍යා මූලධර්ම.	3	-	15:60:90
AT1102	ශාක ජීව විද්‍යා මූලධර්ම.	2	-	15:30:60
AT1103	ජල සම්පාදනය හා ජල සම්පත් ඉංජිනේරු විද්‍යාව.	3	-	15:60:60
AT1104	ගොවිපල සතුන්ගේ ව්‍යුහ විද්‍යාව හා කායික විද්‍යාව	2	-	15:30:60
AT1105	කෘෂි ආර්ථික විද්‍යා හා කෘෂි ව්‍යාපෘතියේ මූලධර්ම.	2	-	15:30:60
AT1106	පාංශු විද්‍යා මූලධර්ම.	2	-	15:30:60
AT1107	කෘෂි කාලගුණ විද්‍යාව.	1	-	00: 30:60
AT1108	ඉංග්‍රීසි	0	2	15:30:90
මුලු සම්මාන අගයන්		**15**	**2**	**105:300:540**
Level 3 පළමු වසර දෙවන සමාසිකය				
AT1201	එළවලු හා ක්ෂේත්‍ර බෝග නිෂ්පාදනය හා කලමණාකරණය.	2	-	15:30:60
AT1202	පලිබෝධ හා රෝග කලමණාකරණය.	2	-	15:30:90
AT1203	ගොවිපල සතුන් කළමණාකරණය.	3	-	15:60:60
AT1204	ගොවිපල බල හා යාන්ත්‍රීකරණය.	2	-	15:30:60
AT1205	වාණිජ මල් වගාව.	2	-	15:30:60
AT1206	පාංශු හා ශාක පෝෂණ කළමණාකරණය	2	-	15:30:90
AT1207	ආහාර හා පෝෂණ විද්‍යාව හැඳින්වීම	2	-	15:30:90
AT1208	තොරතුරු සන්නිවේදන තාක්ෂණය	0	2	00:30:30
මුලු සම්මාන අගයන්		**15**	**2**	**105:270:540**

	Total Credits at Level 3	30	4	210:570:1080
Level 4 දෙවන වසර පළමු සමාසිකය				
AT2101	වැවිලි බෝග නිශ්පාදනය හා කළමණාකරණය.	3	-	15:60:90
AT2102	බෝග වැඩිදියුණු කිරීම හා ජෛව තාක්ෂණය.	2	-	15:60:90
AT2103	පළතුරු බෝග නිෂ්පාදනය හා කළමණාකරණය.	2	-	15:30:60
AT2104	පසු අස්වනු කළමණාකරණය හා ආහාර තාක්ෂණය.	2	-	15:30:90
AT2105	තෘණ විද්‍යාව සහ තෘණ බිම් කළමණාකරණය.	2	-	15:30:60
AT2106	කෘෂි ව්‍යාපාර කළමණාකරණය.	2	-	15:30:60
AT2107	මූලික සංඛ්‍යානය.	2	-	15:30:60
AT2108	පරිගණක ආශ්‍රිත භාෂා අධ්‍යනය.	0	2	15:30:90
	මුලු සම්මාන අගයන්	15	2	120:270:600
Level 4 දෙවන වසර දෙවන සමාසිකය				
AT2201	අපනයන කෘෂිකර්ම බෝග නිශ්පාදනය හා කළමණාකරණය.	2	-	15:30:90
AT2202	ආරක්ෂිත බෝග වගාව.	2	-	15:30:60
AT2203	සත්ත්ව අභිජනනය හා පට්ටි පාලනය.	3	-	15:60:60
AT2204	ගොවිපල සැලසුම්කරණය.	2	-	15:45:90
AT2205	කෘෂි ව්‍යාප්ති විද්‍යාව හා සන්නිවේදන තාක්ෂණය.	2	-	15:30:90
AT2206	ජල ජීවී විද්‍යා නිශ්පාදන තාක්ෂණය.	2	-	15:30:60
AT2207	ශාක පටක රෝපණ තාක්ෂණය.	2	-	15:30:60
AT2208	ජීවන කුසලතා සංවර්ධනය.	0	1	00:30:30
Total Credits		15	1	105:285:540
	Total Credits at Level 4	30	3	225:555:1140
Level 5 තෙවන වසර පළමු සමාසිකය				
AT3101	උද්‍යාන අලංකරණය.	3	-	30:60:90
AT3102	කෘෂි පාරිසරික විද්‍යාව.	2	-	15:30:60
AT3103	සත්ත්ව නිෂ්පාදන සැකසුම් තාක්ෂණය.	2	-	15:30:60
AT3104	ආහාර සැකසුම හා අගය එකතු කිරීම.	2	-	15:30:90
AT3105	ශාක වැඩිදියුණු කිරීමේ හා ජෛව තාක්ෂණයේ යෙදවුම්.	2	-	15:30:90
AT3106	ඖෂධ පැළෑටි නිෂ්පාදනය හා කළමණාකරණය.	2	-	15:30:60
AT3107	කෘෂි වන වගාව.	2	-	15:30:60
AT3108	මානව හා සමාජ විද්‍යා මූලධර්ම.	0	2	15:30:60
මුලු සම්මාන අගයන්		15	2	135:270:570
Level 5 තෙවන වසර දෙවන සමාසිකය				
AT3201	ශාක නිෂ්පාදන පුහුණුව.	4	-	00:120:90
AT3202	සත්ත්ව නිශ්පාදන පුහුණුව.	3	-	00:90:90

AT3203	කෘෂි ඉංජිනේරු විද්‍යා පුහුණුව.	2	-	00:60:90
AT3204	විද්‍යුත් වාණිජ කෘෂිකර්මාන්තය.	2	-	30:30:60
AT3205	නිරපේක්ෂ කෘෂිකර්මාන්තය.	2	-	30:30:60
AT3206	ව්‍යවසායකත්වය හා ව්‍යාපාර සැලසුම්කරණය.	2	-	30:60:90
AT3207	සිද්ධි අධ්‍යනය.	2	-	30:30:60
AT3208	ඉදිරිපත් කිරීමේ කුසලතා	0	1	
මුළු සම්මාන අගයන්		**17**	**1**	**120:420:540**
Total Credits at Level 5		**32**	**3**	**255:690:1110**
Level **6 සිව්වන වසර පළමු සමාසිකය**				
AT4101	පර්යේෂණ ක්‍රමවේදය සහ යෝජනා සංවර්ධනය	2	-	15:30:90
AT4102	කෘෂිකාර්මික පරීක්ෂණ පැවැත්වීම සහ දත්ත විශ්ලේෂණය	3	-	15:60:90
AT4103	කෘෂිකාර්මික ව්‍යාපෘති විශ්ලේෂණය හා කළමනාකරණය	2	-	15:30:90
AT4104	කෘෂිකාර්මික අපද්‍රව්‍ය කළමනාකරණය	2	-	15:30:90
AT4105	බලශක්ති පද්ධති නැවත ආරම්භ කිරීම	2	-	15:30:60
AT4106	භෝග ආකෘති	2	-	15:30:60
AT4107	විද්‍යුත් කෘෂිකර්මයේ භාවිතයන්	2	-	30:30:60
AT4108	ජීව සාරධර්ම	1	-	15:00:60
AT4109	ඉංග්‍රීසි	0	-	15:30:60
Total Credits		**16**	**2**	**150:270:660**
Level **6 සිව්වන වසර දෙවන සමාසිකය**				
AT4101	කෘෂි තාක්ෂණික පර්යේෂණ ව්‍යාපෘතිය	12	0	0
Total Credits		**12**	**0**	**0**
Total Credits at Level 6		**28**	**2**	**150:270:660**

වෛකල්පිත විෂයන්

T:Theory (න්‍යාය), P: Practical (ප්‍රායෝගික), IL:Individual Learning through LMS (LMS ඔස්සේ තනි පුද්ගල ඉගෙනුම)

විෂය කේතය	**විෂයේ නම**	**සම්මාන අගය (GPA)**	**සම්මාන නොවන අගය (NGPA)**	**අධ්‍යයන කාලය (පැය) T:P:IL**
AT1109	වෘත්තීය මාර්ගෝපදේශනය සහ සංවර්ධනය	2	-	15:30:60
AT1209	කෘෂි සංචාරක ව්‍යාපාරය	2	-	15:30:60
AT2109	කෘෂිකර්මයට අදාළ විද්‍යුත් සහ උපකරණ සැකසීම	2	-	15:30:60
AT2209	ආපදා කළමනාකරණය	2	-	15:30:60
AT3109	කාර්මික පුහුණුව	2	-	00:60:60

AT3209	සත්ව සුභසාධනය සහ සාරධර්ම	2	-	15:30:60
AT4209	වනජීවී කළමනාකරණය	2	-	15:30:60

ග්‍රාමීය ගොවි ප්‍රජාව කෘෂිකාර්මික ව්‍යවසායකයින් ලෙස සංවර්ධනය කිරීමේ දී මෙම වැඩසටහනට ඇතුළත් කොට ඇති ප්‍රායෝගික ක්‍රියාකාරකම්, පැවරුම්, සිද්ධාන්තමය කරුණු හා ආධුනිකව අධ්‍යයනය ලබන්නන් හට දෙනු ලබන සහය සේවාවන් වැනි සියලුම සංරචක ඔවුනගේ පෞද්ගලික සහ වෘත්තීය සංවර්ධනය කෙරෙහි ප්‍රශස්ත අන්දමින් ඉවහල් වී ඇත.

තවද, මෙම උපාධි පාඨමාලාව, තරුණ පරපුර තුළ ඉහල සමාජීය පිළිගැනීමක් ලබමින් කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ රැඳී සිටීමට විශාල අභිප්‍රේරණයක් ඇති කර තිබේ.

අධ්‍යයන වැඩසහටන්වලට ඇතුළත් වීම සඳහා සපුරා ලිය යුතු සුදුසුකම්

ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත්වල ප්‍රකාශයට පත් කෙරෙන පුවත්පත් දැන්වීමක් තුළින් උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගෙන් අයදුම්පත් කැඳවීම මගින් බඳවා ගැනීම සිදු කෙරේ.

- අවම වශයෙන් වසර 05ක කාලසීමාවක් තුළ කෘෂිකර්ම/ කෘෂි-ව්‍යාපාර ක්ෂේත්‍රය තුළ නියැලී සිටින සහ අ.පො. ස. (උසස් පෙළ) විභාගය සාර්ථකව සමත් වී ඇති පුද්ගලයින් බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

හෝ

- අවම වශයෙන් වසර 07ක කාලසීමාවක් තුළ කෘෂිකර්ම/ කෘෂි-ව්‍යාපාර ක්ෂේත්‍රය තුළ නියැලී සිටින සහ අ.පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය සාර්ථකව සමත් වී ඇති ඕනෑම අයකු බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

සුදුසුකම්ලත් අයදුම්කරුවන් තෝරා ගැනීම සඳහා අභියෝග්‍යතා පරීක්ෂණයකට කැඳවනු ලැබේ. අභියෝග්‍යතා පරීක්ෂණයේ ප්‍රතිඵලවලට අනුව, සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමෙන් අනතුරුව අයදුම්කරුවන් ලියාපදිංචි කෙරේ.

වගු අංක 07 : 2018 වර්ෂයේ දී කෘෂි තාක්ෂණවේදී උපාධිය හදාරන මුළු ශිෂ්‍ය සංඛ්‍යාව

කණ්ඩායම	ශිෂ්‍ය සංඛ්‍යාව	වෙනත්කරුණු
4 වැනි කණ්ඩායම	23	උපාධි මට්ටම
5 වැනි කණ්ඩායම	25	උසස් ඩිප්ලෝමා මට්ටම
6 වැනි කණ්ඩායම	55	උසස් ඩිප්ලෝමා මට්ටම
7 වැනි කණ්ඩායම	56	ඩිප්ලෝමා මට්ටම
8 වැනි කණ්ඩායම	80	ඩිප්ලෝමා මට්ටම
9 වැනි කණ්ඩායම	168	පළමු, දෙවන හා තෙවන වසර
10 වැනි කණ්ඩායම	268	පළමු, දෙවන හා තෙවන වසර

2018.12.31 දිනට අධ්‍යයන වැඩසටහන්වල නියුතු කාර්ය මණ්ඩලය පහත දැක්වේ.

වගු අංක 08 : අධ්‍යයන කාර්ය මණ්ඩලය (ස්ථිර)

අනු අංකය	නම	තනතුර
1	ආචාර්ය එන්.පී. විදානපතිරණ මිය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය , අංශ ප්‍රධාන, කෘෂි තාක්ෂණික අධ්‍යයන අංශය
2	ආචාර්ය සුජාතා වීරසිංහ මිය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය
3	යූ. අයි සමරවික්‍රම මහතා	කථිකාචාර්ය (පරිවාස) (2018.10.01 දින සිට)

වගු අංක 09 : අධ්‍යයන කාර්ය මණ්ඩලය (පැවරුම් පදනම මත)

අනු අංකය	නම	තනතුර
1	එස්.ඒ.පී. නෙල්කා මිය	පාඨමාලා සම්බන්ධීකාරක
2	එස්.එල්. නවරත්න මිය	පාඨමාලා සම්බන්ධීකාරක
3	එච්.කේ.ආර්.එස්. කුමාර මහතා	සහකාර පාඨමාලා සම්බන්ධීකාරක
4	ටි.ජී.බී.ධනුෂ්ක මහතා	සහකාර පාඨමාලා සම්බන්ධීකාරක
5	බී.පී. සිරිවර්ධන මහතා	සහකාර පාඨමාලා සම්බන්ධීකාරක
6	එච්.රෝහණධීර මහතා	පර්යේෂණ සහකාර

වගු අංක 10 : අනධ්‍යයන කාර්ය මණ්ඩලය

අනු අංකය	නම	තනතුර
1	පී.බී. දර්ශන මහතා	පරිගණක යෙදවුම් සහකාර
2	එස්.ඒ.ආර්.ලක්මාල් මහතා	පරිගණක ක්‍රියාකරු සහ තොරතුරු තාක්ෂණ විද්‍යාගාර තාක්ෂණික ශිල්පී

- එච්. ආර්. චාමර මහතා, රජයේ ගුරුවරයකු මෙන්ම UCIARS හි හිටපු සහකාර පාඨමාලා සම්බන්ධීකාරකවරයකු ලෙස සේවය කළ අතර තොරතුරු තාක්ෂණ නිලධාරියකු ලෙස අර්ධ කාලීන පැවරුමක් මත 2018 වසර සඳහා සේවය ලබා දී ඇත.

- එක් විෂය ක්ෂේත්‍රය පිළිබඳ විශ්ෂඥ දැනුම ලබා දීම සඳහා මෙන්ම සියළුම පාඨමාලාවන්හි ප්‍රමිතිය පවත්වා ගැනීමේ අරමුණින් කොළඹ විශ්ව විද්‍යාලයීය සනාථන සභාව විසින් UCIARS කළමනාකරණ මණ්ඩලයේ නිර්දේශය සහිතව අධ්‍යයන වැඩසටහන්වල එක් එක් පාඨමාලාව සඳහා විෂය ප්‍රවීණයින් පත් කර ඇත.

වගු අංක **11 :** ඉගැන්වීම්, පුහුණු හා පර්යේෂණ පහසුකම්වල ප්‍රගතිය

ව්‍යාපෘති ක්‍රියාකාරකම්	අපේක්ෂිත ප්‍රතිඵල	කාර්ය දර්ශකය/ දර්ශක	2018 වසර			
			2018 සඳහා වෙන්කළ මුදල (රු. මිලියන)	2018/12/31 දිනට ප්‍රගතිය		
				මූල්‍ය (රු. මිලියන) (බිල්පත් සමග)	භෞතික	
					අකුරින්	%
ජලාශය ඉදිකිරීම	• සිසුන් හා ගොවි ප්‍රජාව සඳහා ප්‍රායෝගික පුහුණු කටයුතු සිදුකිරීමට නවීන පහසුකම් සහිත අධිතාක්ෂණික ගොවිපලක් පිහිටුවීම • කෘෂි ප්‍රජාව වෙත උපකාර කිරීම සඳහා ආයතනයෙහි ව්‍යාප්ති සේවය හරහා දියුණුකරන ලද නූතන තාක්ෂණය ලබාදීම • ජාතික පලතුරු අවශ්‍යතාවය සැපිරීම සඳහා පළතුරු නිෂ්පාදනය වැඩි කිරීම. • ශිෂ්‍යයින්, නිලධාරීන් හා කැමැත්තක් සහිත පුද්ගලයන් හට පර්යේෂණ කිරීම සඳහා නවීන පහසුකම් ලබාදීම	• පළතුරු නිෂ්පාදනය වැඩි කිරීම • බෝග දර්ශන සඳහා ක්ෂුද්‍ර ජලසම්පාදන ක්‍රම යෙදීමෙන් ජල භාවිතය වැඩි වූ ප්‍රමාණය • ඉගැන්වීම්, ඉගෙනුම් හා පර්යේෂණ පරිසරය ඉහළ නැංවුණු ප්‍රමාණය • ආයතනයේ ඉපයීම් වැඩිවූ ප්‍රමාණය	2.50	2.50	ජලාශය ඉදිකිරීම දැනටමත් අවසන් කොට ඇත.	100%
මායිම් වැට			10.00	10.00	මායිම් වැට ඉදිකිරීම ආරම්භ කළ අතර වැඩ නිමවෙමින් පවතී.	85%
ක්ෂුද්‍ර ජලසම්පාදන ක්‍රමයක් පිහිටුවීම			3.00	3.00	ක්ෂුද්‍ර ජලසම්පාදන පද්ධති වැඩ නිම වීමට ආසන්නව ඇත.	80%
පර්යේෂණ හා වානිජමය අරමුණු සහිතව පළතුරු බෝගද ඇතුලත්ව බෝග ආදර්ශන පිහිටුවීම			3.50	3.50	බෝග ආදර්ශන 03ක් සඳහා වන ආදර්ෂණ නිමවා ඇත. අනෙකුත් බෝග සඳහා. බිම්හෙලි කිරීම, පැළ මිලදී ගැනීම හා අනෙකුත් වැඩ සිදුවෙමින් පවතී	75%
ගවයින් හා කුකුළන් පාලනය සහිතව සත්ත්ව පාලන ආදර්ශන පිහිටුවීම			5.00	5.00	ගව මඩුවේ ඉදිකිරීම් කටයුතු නිමවීමට ආසන්නව ඇත	90%
කම්කරු			1.00	1.00	විදුලි වැට ඉදිකිරීම හා ශෂ්‍ය විද්‍යාත්මක කටයුතු සිදුවෙමින් පවතී	100%
මුලු මුදල			25	25		

ඉහත ව්‍යාපෘතිය හරහා සිදු වූ පහසුකම් සංවර්ධනය පහත රූපරාමු වල දැක්වේ.

බිම් එළි කිරීම හා සංවර්ධනය

මායිම් වැට ඉදිකිරීම ආරම්භය

ජලාශය ඉදිකිරීම ආරම්භයේ සිට අවසාන අදියර දක්වා පියවරෙන් පියවර

ජලාශ ඉදිකිරීම සඳහා ලුණුගම්වෙහෙර ඇලෙන් එන ජල ධාරාව භාවිතා කොට ඇත.

ජලාශ ඉදිකිරීම සඳහා ලුණුගම්වෙහෙර ඇලෙන් එන ජල ධාරාව භාවිතා කොට ඇත.

මාර්ගයේ සිට බලන කල ජලාශයේ සැන්දෑ අසිරිය

අක්කර 03 විශාලත්වයකින් යුත් කුඹුරු බිම් ඉදිකිරීම අවසන් කර ඇති අතර එහි පළමු අස්වැන්න ලබාගන්නා ලදී

අනෙකුත් බෝග ආදර්ශන පිහිටුවීම

රුදි ජලාශයෙන් ජලසම්පාදනය සිදු කරමින් කෙසෙල්, ගස්ලබු හා එළවලු බෝග දර්ශ වගා කිරීම ආරම්භ කොට ඇත.

2.2 පැළ තවාන්/ විද්‍යාගාර කාර්යසාධනය

කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතන නියමාවලිය අනුව 2008 වර්ෂයේ දී කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය ආරම්භ කළ ද, කොළඹ විශ්ව විද්‍යාලයේ ව්‍යාපෘතියක් ලෙස 1998 දී දුප්පත් ග්‍රාමීය ගොවි ජනතාව ඉලක්ක කර ගනිමින් ඔවුන්ගේ සමාජ ආර්ථික තත්ත්වය වැඩි දියුණු කිරීම උදෙසා පටක රෝපණ ඒකකය ආරම්භ කරන ලදී. 2001 වර්ෂයේ දී, විද්‍යා පීඨයේ පැළෑටි විද්‍යා අංශය (Department of Plant Science) මගින් ආදර්ශනයක් ලෙස මෙම ආයතනය සඳහා පටක රෝපණ කෙසෙල් හා කිරි අල පටක රෝපණය කිරීම හඳුන්වා දෙන ලදී. 2003 වර්ෂයේ සිට මෙම ආයතනය කොළඹ විශ්ව විද්‍යාලයේ මඟ පෙන්වීම හා අධීක්ෂණය යටතේ ආයතනයේම නිෂ්පාදනයක් ලෙස පටක රෝපණ කෙසෙල් පැළ නිෂ්පාදනය කර ගෙනයාමට සමත් විය. අලුතින් පත්කරන ලද විද්‍යාගාර කාර්ය මණ්ඩල පුහුණු කිරීම සඳහා, රැකියාවේ යෙදෙමින්ම පුහුණු කිරීමේ කටයුතු (on the job training) ආයතනය මගින් සිදුකරන ලදී.

වගු අංක 12 : 2018.12.31 වන විට පැළතවාන් සහ විද්‍යාගාර කාර්ය මණ්ඩලය පහත දක්වා ඇත

අනු අංකය	නම	තනතුර
1	එච්.රෝහණධීර මහතා	පර්යේෂණ සහකාර (අංශ ප්‍රධාන-විද්‍යාගාර/පැළ තවාන්)
2	ටී.ඒ.කේ.වයි. ඉඳුනිල් මහතා	ක්ෂේත්‍ර ප්‍රධානි
3	එච්.කේ.එස්. ඉෂාර මහතා	ක්ෂේත්‍ර සහකාර
4	පී.ඩබ්.ඒ. චමින්ද ජයලත් මහතා	තාක්ෂණික සහකාර
5	බී.ජී. සුසිර කුමාර මහතා	තාක්ෂණික සහකාර
6	ඒ.එන්. අබේගුණවර්ධන මිය	පටක රෝපණ සහකාර
7	එච්.කේ. සමන්ති නිලිනි කුමාරි මිය	පටක රෝපණ සහකාර
8	එම්.ජී.සී. සුදර්ශනී මිය	පටක රෝපණ සහකාර
9	ඒ. ප්‍රියංගා සුදර්ශි මිය	පටක රෝපණ සහකාර
10	යූ. අනූෂා රුවනි මෙනවිය	පටක රෝපණ සහකාර
11	ඩබ්.එච්. දිස්නා සඳමාලි මිය	පටක රෝපණ සහකාර
12	අයි.ජී. දිලිනි නිරෝෂා කුමාරි මෙනවිය	පටක රෝපණ සහකාර
13	ඕ.පී. නිලූකා සුභාෂිනී මෙනවිය	පටක රෝපණ සහකාර
14	ඩී. ඉෂාදි නිමල්ගා මෙනවිය	පටක රෝපණ සහකාර
15	කේ.පී. උදේනි නිසංසලා මෙනවිය	පටක රෝපණ සහකාර
16	ආර්.ඒ. මධුසරනී දිල්හාරා මෙනවිය	පටක රෝපණ සහකාර
17	ඩබ්.ජී. දූලංජලී මෙනවිය	පටක රෝපණ සහකාර
18	ඩබ්.එච්. විචිත්‍රා කල්පනී මෙනවිය	පටක රෝපණ සහකාර
19	ඉසංකා චමේදනී දොඩම්පේ මෙනවිය	පටක රෝපණ සහකාර
20	එන්.එස් .පෙරේරා මෙනවිය	පටක රෝපණ සහකාර
21	එච්.ආර්. අකීෂා මධුමාලී මෙනවිය	පටක රෝපණ සහකාර
22	ඩබ්.එස්. මධුෂානී මෙනවිය	පටක රෝපණ සහකාර
23	කේ.එල්.ඒ. අනුරාධා මෙනවිය	පටක රෝපණ සහකාර
24	පී.එම්. තුසිතා මෙනවිය	පටක රෝපණ සහකාර
25	ඩබ්.එච්.යූ. කෞෂල්‍යා මෙනවිය	පටක රෝපණ සහකාර
26	එන්.එස්. ප්‍රදීප් මහතා	ක්ෂේත්‍ර සහකාර

2018 වර්ෂයේ කාර්යසාධනය

වගු අංක 13: විද්‍යාගාර තුනේ පැළ නිෂ්පාදන වාර්තා (සංඛ්‍යාව)

මාසය	විද්‍යාගාරය අංක 01	විද්‍යාගාරය අංක 02	විද්‍යාගාරය අංක 03	එකතුව
ජනවාරි	10,875	5,937	2,014	18,826
පෙබරවාරි	13,312	9,045	2,525	24,882
මාර්තු	10,478	9,324	4,878	20,680
අප්‍රේල්	8,808	7,132	2,933	18,873
මැයි	10,587	11,222	5,705	27,514
ජූනි	15,164	8,144	196	23,504
ජූලි	4,377	-	4,296	8,673
අගෝස්තු	6,563	1,885	2,870	11,318
සැප්තැම්බර්	14,192	7,506	1,072	22,770
ඔක්තෝබර්	14,880	4,714	8,216	27,810
නොවැම්බර්	4,621	4,372	-	8,993
දෙසැම්බර්	2,882	2,906	2,034	7,822
එකතුව	**116,739**	**72,187**	**36,739**	**225,665**



රූපසටහන 02 : විද්‍යාගාර තුනේ පැළ නිෂ්පාදනය සංසන්දනය කිරීම

විද්‍යාගාරය අංක 01 සහ 02 මගින් එක් මසක් තුළ පැළ 8000ක් නිෂ්පාදනය කිරීම සඳහා කටයුතු කළ අතර, විද්‍යාගාර අංක 03 එක් මාසයක් තුළ පැළ 4000 ක් නිෂ්පාදනය කිරීමට අපේක්ෂා කරයි. විද්‍යාගාරය අංක 01 තම ඉලක්කයෙන් 121.6% ක ප්‍රතිශතයක් සාක්ෂාත් කර ගෙන තිබෙන අතර, විද්‍යාගාරය අංක 02 තම ඉලක්කවලින් 75.2%ක ප්‍රතිශතයක් සාක්ෂාත් කර ගෙන තිබේ. විද්‍යාගාරය අංක 03 සිය ඉලක්කවලින් 76.5%ක් සාක්ෂාත් කර ගෙන ඇති අතර විද්‍යාගාරය ත්‍රිත්වය පිළිබඳව සමස්තයක් වශයෙන් සලකා බැලීමේදී, 2018 වර්ෂය සඳහා වූ ඉලක්කවලින් 94.02%ක් සාක්ෂාත් කර ගෙන ඇත.

වගු අංක 14 : පසුගිය වසර හත තුළ පැළ නිෂ්පාදනය සැසඳීම (සංඛ්‍යාව)

මාසය	2012	2013	2014	2015	2016	2017	2018
ජනවාරි	15,077	15,388	18,514	20,315	20,594	20,386	18,826
පෙබරවාරි	16,370	15,923	18,209	20,127	20,476	21,527	24,882
මාර්තු	15,561	15,709	18,960	20,611	16,918	25,150	24,680
අප්‍රේල්	15,105	12,015	14,275	12,580	10,815	19,703	18,873
මැයි	12,055	21,158	10,043	14,852	19,079	24,351	27,514
ජූනි	6,953	12,042	10,550	14,218	19,359	23,260	23,504
ජූලි	4,957	13,370	12,791	12,029	19,750	25,184	8,673
අගෝස්තු	9,161	17,665	7,770	14,021	20,875	22,151	11,318
සැප්තැම්බර්	7,870	15,769	18,831	18,030	24,180	25,420	22,770
ඔක්තෝබර්	12,731	20,617	25,300	22,427	23,481	21,732	27,810
නොවැම්බර්	17,157	21,961	23,106	21,557	18,807	24,481	8,993
දෙසැම්බර්	15,129	10,878	26,409	21,339	18,100	18,180	7,822
එකතුව	**1,48,126**	**1,92,495**	**2,04,758**	**2,12,106**	**2,32,434**	**2,71,525**	**2,25,665**



රූප සටහන 03: 2012-2018 වර්ෂ තුල පැළ නිෂ්පාදනය සැසඳීම

පසුගිය වසර හත තුළ රැස් කරන ලද දත්ත වලට අනුව, ජනවාරි සිට අප්‍රේල් දක්වා සහ සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා වූ මාස කිහිපය ඉහළ ඉල්ලුම් රටාවක් සහිත කාල පරිච්ඡේදයක් ලෙස පෙනී යයි. නමුත් 2018 වර්ෂය සැලකීමේදී එකී සාමාන්‍ය රටාවෙන් වෙනස් වී ඇත. එමනිසා, ඉල්ලුම අධික කාල සීමාවල දී තවාන් වෙතින් නිකුත් කරනු ලබන පැළ ප්‍රමාණය ඉහළ නැංවීම සඳහා නිෂ්පාදන සැලසුම් වෙනසකට ලක් කරන ලදී. විද්‍යාගාරයෙන් නිකුත් කරන පැළ ප්‍රමාණය, වර්ෂය පුරා සිදු කරන පැළ අලෙවිය අනුව වෙනස්වන අතර එය වර්ෂාව, නියඟය වැනි පාරිසරික සාධක හා කෙසෙල් සඳහා පවතින වෙළෙඳ පොල මිල සහ ප්‍රජා ආකල්ප ආදී වෙනත් සාධක මත රඳා පවතී.

2018 වර්ෂය තුළ කෙසෙල් පැළ නිෂ්පාදනය සැසඳීම

2018 වර්ෂය තුළ සමස්ථ නිෂ්පාදනයෙන් 90% ක ප්‍රතිශතයක් ඇඹුල් කෙසෙල් වූ අතර කෝලිකුට්ටු කෙසෙල් පැළ ප්‍රතිශතය 10% ක් පමණක් විය.

පැළ අලෙවිය සැසඳීම

පටක රෝපණ කෙසෙල් පැළ සඳහා ඇති ඉල්ලුම දේශගුණික තත්ත්වය මත රඳා පවතින අතර වර්ෂා කාලවලදී (සැප්තැම්බර් සිට අප්‍රේල්) ඉහළම ඉල්ලුමක් සහ වියළි කාලවල දී (මැයි සිට අගෝස්තු) අඩු ඉල්ලුමක් වාර්තා වී ඇත. වර්ෂා රටාව වගාව කෙරෙහි සෘජුවම බලපාන අතර ගොවීන් වර්ෂා කාලවල දී පටක රෝපණ කෙසෙල් පැළ විශාල ප්‍රමාණයක් වගා කරයි.

මෙම කාලය තුළ විශේෂයෙන් දෙසැම්බර් සහ අප්‍රේල් උත්සව කාලය තුළ කෙසෙල් කැන් සඳහා අධික ඉල්ලුමක් පවතින බැවින් එම කාලය ඉලක්ක කර ගනිමින් ගොවීන් කෙසෙල් වගාවේ නිරත වේ. එමනිසා, මෙවැනි හිතකර දේශගුණික සාධක සහ වෙළෙඳ පොලේ ඉල්ලුම සලකා බලමින් ගොවීන් පටක රෝපණ කෙසෙල් පැළ මිලදී ගනී. 2018 වර්ෂය සැලකීමේදී, වර්ෂය පුරා පටක රෝපණ කෙසෙල් පැළ සඳහා අස්ථාවර ඉල්ලුම් රටාවක් පැවතින.

වගු අංක 15 : පසුගිය වසර හය තුළ පැළ අලෙවිය සැසඳීම (සංඛ්‍යාව)

මාසය	2013 (සංඛ්‍යාව)	2014 (සංඛ්‍යාව)	2015 (සංඛ්‍යාව)	2016 (සංඛ්‍යාව)	2017 (සංඛ්‍යාව)	2018 (සංඛ්‍යාව)
ජනවාරි	14080	10,823	14,672	21,738	17,980	17,759
පෙබරවාරි	13119	6,816	18,427	17,950	22,141	12,738
මාර්තු	13241	2,715	19,835	14,924	22,536	26,232
අප්‍රේල්	15641	7,697	20,579	13,721	21,467	15,259
මැයි	9410	7,113	12,531	12,830	19,652	18,968
ජූනි	8419	3,381	15,132	13,527	20,780	6,489
ජූලි	14592	3,680	12,682	11,490	20,576	11,049
අගෝස්තු	11242	18,404	12,954	19,465	21,097	13,454
සැප්තැම්බර්	12992	11,766	20,943	18,837	20,877	7,697
ඔක්තෝබර්	14812	18,498	15,151	22,040	22,302	19,692
නොවැම්බර්	15676	25,705	16,656	17,327	21,137	19,349
දෙසැම්බර්	14491	13,369	24,595	20,884	20,530	14,405
එකතුව	**1,57,715**	**1,29,967**	**2,04,157**	**2,04,733**	**2,51,075**	**1,83,091**



රූප සටහන **04: 2013-2018** වර්ෂ තුල පැළ අලෙවිය සැසඳීම

වගු අංක **16 :** අලෙවි කරන ලද පැළ සංඛ්‍යාව අනුව පැළ අලෙවිය සැසඳීම– **2018**

විස්තරය	පැළ සංඛ්‍යාව
පැළ අලෙවිය 100>	60,160
පැළ අලෙවිය 100<	165,505



රූප සටහන **05: 2018** වර්ෂයේ පැළ අලෙවිය

වගු අංක **17 :** ප්‍රභේද අනුව පැළ අලෙවිය **- 2018**

ප්‍රභේදය	පැළ සංඛ්‍යාව
ඇඹුල්	202,727
කෝලිකුට්ටු	21,925
මිටි කැවෙන්ඩිශ්	1,013



රූප සටහන 06: ප්‍රභේද අනුව පැළ අලෙවිය

2018 වර්ෂය තුළ පටක රෝපිත කෙසෙල් පැළ අලෙවියෙන් මිලියන 14.5 ක ආදායමක් උපයා ගැනීමට ආයතනයට හැකි විය. ක්ෂේත්‍රය තුළ රෝග වැළඳීමේ හැකියාව අඩු මට්ටමක පැවතීම හේතුවෙන් ඉහළ ඉල්ලුමක් සහිත ප්‍රභේදය ඇඹුල් කෙසෙල් වූ අතර වසර පහක කාලයක් දක්වා ඉහල ඉපයීම් ශක්‍යතාවක් පවත්වාගෙන තිබේ. දෙවන පරම්පරාවේදී ඇතිවන දරුණු පැනමා රෝගය හේතු කොට ගෙන තනි පැළ කළමනාකරණ ක්‍රමය යටතේ ගොවීන් කෝලිකුට්ටු කෙසෙල් වගා කරනු ලබයි. මිටි කැවෙන්ඩිෂ් නැමැති කෙසෙල් ප්‍රබේදය තෙත් කලාපය සඳහා පමණක් නිර්දේශ කල හැකි අතර, ඒ සඳහා අඩු ඉල්ලුමක් පවතින අතර ඉතාමත් සීමිත තෙත් කලාපීය ගොවීන් පිරිසක් සඳහා ආයතනය විසින් පහසුකම් සලසනු ලබයි.

පටක රෝපිත කෙසෙල් සඳහා පවතින ඉල්ලුම සම්ප්‍රදායිකව නිෂ්පාදිත පැළ සඳහා පවතින ඉල්ලුමට වඩා ඉහල මට්ටමක පවතින අතර, දිගුකාලීන ලාභදායිත්වය සහ රෝගවලට භාජනයවීම අඩු වීම හේතු කොට ගෙන ඇඹුල් කෙසෙල් සඳහා පවතින ඉල්ලුම වැඩිවිය. ආයතනය සමග සම්බන්ධව කටයුතු කරන ගොවීන්ගෙන් බහුතරයක් (69%) නියෝජනය කරනුයේ මිල දී ගැනීමේ හැකියාව අඩු මට්ටමක පවතින ගොවීන් වන අතර ඉහළ මිලදී ගැනීමේ හැකියාවක් ඇති ගොවීන් ආයතනය සමඟ සම්බන්ධ වී ඇත්තේ ඉතා අඩු ප්‍රමාණයකි (31%).

වගු අංක 18: 2018 වර්ෂයේ ගොවීන්ගේ මිලදී ගැනීමේ හැකියාව

ගොවීන්ගේ මිලදී ගැනීමේ හැකියාව	ගොවීන් සංඛ්‍යාව
පැළ 100 කට වඩා අඩුවෙන් මිලදී ගත් ගොවීන් සංඛ්‍යාව	439
පැළ 100 කට වඩා වැඩියෙන් මිලදී ගත් ගොවීන් සංඛ්‍යාව	195



රූප සටහන 07: 2018 වර්ෂයේ ගොවීන්ගේ මිලදී ගැනීමේ හැකියාව

ආයතනය මගින් අඩු මිල ගණන් යටතේ දේශිය ගොවීන්ට කෙසෙල් පැළ ලබාදෙන අතර ලංකාවේ දුරස්ථ ප්‍රදේශ නියෝජනය කරමින් ගොවීන් රැසක් ආයතනය සමග සම්බන්ධව කටයුතු කරයි. ආයතනයේ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය විසින් එම වගාවන් විධිමත්ව නියාමනය කරමින් ඔවුන්ට අවශ්‍ය උපදෙස් සහ මගපෙන්වීම ලබා දේ. පටක රෝපණ කෙසෙල් පැළ වගා කරන ගොවි ප්‍රජාව රටපුරා ව්‍යාප්ත කිරීම සඳහා ආයතනයේ ක්ෂේත්‍ර නිලධාරීන් ක්‍රමානුකූලව ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදු කරන ලදී.

පටක රෝපණ කෙසෙල් පැළ සම්බන්ධ නිෂ්පාදන ක්‍රියාවලිය

පටක රෝපණ තාක්ෂණය යනු අපුති තත්වයන් යටතේ කෘතීම මාධ්‍ය උපයෝගී කර ගනිමින් වෛරස් වලින් තොර දුහිතෘ ශාක (මාතෘ පටක) නිෂ්පාදනය කිරීමයි. එම නිසා තාක්ෂණය විශේෂිත වන අතර එබැවින් මාතෘ පටක පිහිටුවීමේ සිට දැඩිකිරීම ආරම්භ කරන තෙක් වන සියළුම ක්‍රියා කාරකම් සඳහා දක්ෂ එමෙන්ම නිපුණතාවයෙන් හෙබි සේවක පිරිසක් අවශ්‍ය වේ. දර්ශීය ලෙස, පටක රෝපණ තාක්ෂණය ප්‍රධාන පියවරයන් පහක් ඔස්සේ සිදුකරණු ලබන අතර, එනම්, නිරෝගී හා දිරිමත් මාතෘ ශාක වරණය (තෝරා ගැනීම), කෘතීම පෝෂන මාධ්‍යක් තුළ මාතෘ ශාක කොටස් පිහිටු වීම, අංකුර ජනන අවධිය, මුල් වර්ධන අවධිය හා පැළ දැඩි කිරීමේ අවධියයි. අග්‍රස්ථ විභාජක රෝපණය මගින් කෙසෙල් පැළ නිෂ්පාදනය ආයතනය තුළ සිදුකරන අතර නිෂ්පාදනයේ ගුණාත්මය හා විකෘති තත්ව අඩු කිරීම සඳහා උපායමාර්ගික පියවරයන් ගනු ලබයි. ඉතා උසස් තත්වයේ සම්මත පරාමිතීන් ජීවානුහරන ක්‍රියාවලි සඳහා යොදාගනු ලබන අතර උපවගා මට්ටම් (sub culture stages) 8-10 අතර වූ උපරිම ප්‍රමාණයක් භාවිතා කරනු ලැබේ. ක්‍රමවත් හා පරිපූර්ණ ලෙස දත්ත වාර්ථා තැබීම තුළින් අවශ්‍ය වූ ඕනෑම අවස්ථාවකදී අදාල මාතෘ පටකය පිළිබඳව සියළුම විස්ථර පහසුවෙන් ලබාගත හැකිය. සේවක පිරිසගේ යෝග්‍යතාවය ධාරිතාවය මත නිවරදි ලෙස ඔවුන් සුදුසු නිෂ්පාදන අවස්ථාවේ පිහිටුවා ඇත.



රූප සටහන 08: පටක රෝපණ කෙසෙල් පැළ සම්බන්ධ නිෂ්පාදන ක්‍රියාවලිය

2018 වර්ෂය තුළ අත්කර ගනු ලැබූ කාර්ය සාධනය (පටක රෝපණ නිෂ්පාදන ඒකකය)

1. නවීන තාක්ෂණයන් හඳුන්වාදීම සඳහා ප්‍රදර්ශන වලට සහභාගී වීම.

   i. රුහුණු රස සරණිය - ගාල්ල

2. පටක රෝපණ තාක්ෂණ අංශය මගින් අතු කැබලි මගින් තුඹ පැළ නිශ්පාදනය ආරම්භ කරන ලද අතර පැළ 12792 ක ප්‍රමාණයක් නිපදවා ඇත. මෙමගින් උත්පාදිත ආදායම මිලියන 0.16 ක් වන අතර කෘෂි ව්‍යවසායකයින් 115 දෙනකු තුඹ වගාව සඳහා ආයතනය හරහා සම්බන්ද වී ඇත.

3. පටක රෝපණ තාක්ෂණ අංශය මගින් ආනයනික දෙමුහුන් රෙඩ් ඩයමන්ඩ් පැපොල් බීජ භාවිතයෙන් පැළ 300 ක ප්‍රමාණයක් නිශ්පාදනය කරනලද අතර උත්පාදිත ආදායම මිලියන 0.035 ක් වේ. මේ සඳහා නව කෘෂි ව්‍යවසායකයින් 05 දෙනකු ආයතනය සමග සම්බන්ද වී ඇත.

4. පටක රෝපණ තාක්ෂණ අංශය මගින් රුහුණු බිම්මල් සංගමයේ බිම්මල් ගොවීන් සඳහා උපකාරක සේවාවක් ලෙස බිම්මල් නිෂ්පාදනය සඳහා අවශ්‍යවන අමුද්‍රව්‍ය බෙදාහැරීම සිදුකරයි. වර්ථමානය වන විට මෙම සංගමයේ පුහුණු, දක්ෂ බිම්මල් වගාකරුවන් 55 දෙනකු සම්බන්ද වී සිටින අතර ආයතනය මගින් බිම්මල් වගාව සඳහා අව්‍යවන අමුද්‍රව්‍ය බෙදාහැර ඇත.

බිම්මල් බීජ මළු	- 244
$MgSO_4/CaCO_3$	- 105 Kg
පුළුන්	- 22 Kg
රබර් බෑන්ඩ්	- 2.1 Kg
පොලි ප්‍රොප්ලීන්	- 21,300

5. කාර්යය මණ්ඩල දක්ෂතා සංවර්ධන වැඩසටහන්

   i. පටක රෝපණ තාක්ෂණයේ අපවිත්‍රවීම් අවම කිරීම පිළිබඳ වැඩමුළුව - ශාක වෛරස් හඳුනාගැනීමේ මධ්‍යස්ථානය, කෘෂි කර්ම දෙපාර්තමේනතුව, හෝමාගම

6. පවත්වන ලද පුහුණු වැඩසටහන්

   i. ජෛව තාක්ෂණ (විශේෂ) උපාධි අපේක්ෂකයෙකු සඳහා ත්‍රෛමාසික අභ්‍යන්තර පුහුණු වැඩසටහන, කෘෂි විද්‍යා හා බෝග කළමණාකරණ පීඨය, ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය
   ii. පටක රෝපණ තාක්ෂණ පුහුණු වැඩමුළුව, ප්‍රාදේශීය ලේකම් කාර්යලය, තණමල්විල

7. පාසල් සිසුන්, විශ්ව විද්‍යාල සිසුන් හා සාමාන්‍ය ජනතාව සඳහා දැණුවත් කිරීමේ වැඩසටහන් හා පුහුණු වැඩමුළු පැවැත්වීම.

වගු අංක 19 : 2018 වසරෙහි පැවැත්වූ දැණුවත් කිරීමේ වැඩසටහන් හා පුහුණු වැඩමුළු

කාණ්ඩය (වැඩමුළු, පුහුණු වැඩසටහන්, ක්ෂේත්‍ර ආදර්ශන, මාධ්‍ය වැඩසටහන්)	වැඩසටහන් මාතෘකාව	සහභාගීත්වය	ඉලක්ක කණ්ඩායම
පුහුණු වැඩමුළු	පටක රෝපණ කෙසෙල් නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ වැඩමුළුව	56	පාසල් ශිෂ්‍යයන්, ගා/නෙලුව ජාතික පාසල
	පටක රෝපණ කෙසෙල් නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ වැඩමුළුව	40	පාසල් ශිෂ්‍යයන්, හ/තේරපුත්ත මහා විද්‍යාලය, අම්බලන්තොට
	පටක රෝපණ කෙසෙල් නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ වැඩමුළුව	56	පාසල් ශිෂ්‍යයන්, ර/රාහුල ජාතික පාසල, ගොඩකවෙල
	පටක රෝපණ කෙසෙල් නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ වැඩමුළුව	95	පාසල් ශිෂ්‍යයන්, ර/ඇලපාත මහා විද්‍යාලය
	පටක රෝපණ කෙසෙල් නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ වැඩමුළුව	300	පාසල් ශිෂ්‍යයන්, ගා/සවුත්ලන්ඩ් විද්‍යාලය, ගාල්ල
	පටක රෝපණ කෙසෙල් නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ වැඩමුළුව	75	පාසල් ශිෂ්‍යයන්, හ/මීගහජඳුර මහා විද්‍යාලය, සූරියවැව
	පටක රෝපණ කෙසෙල් නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ වැඩමුළුව	75	පාසල් ශිෂ්‍යයන්, ගා/නියාගම විජිත මහා විද්‍යාලය, තල්ගස්වල
වෙනත්	නව තාක්ෂණය හඳුන්වාදීම සඳහා දැණුවත් කිරීමේ වැඩසටහන	190	රිදියගම කලාපයේ ගොවීන්
	නව තාක්ෂණය හඳුන්වාදීම සඳහා දැණුවත් කිරීමේ වැඩසටහන	150	පාසල් ශිෂ්‍යයන්, හ/බඳගිරිය මහා විද්‍යාලය, වැලිගත්ත

2.3 2018 වර්ෂය තුල UCIARS හි තාක්ෂණිකමය සංවර්ධනයන්

- **බිම්මල් බෑග් පිරවීමේ යන්ත්‍රයක් සංවර්ධනය කිරීම**

මෙම යන්ත්‍රය හත්වන කණ්ඩායමේ උපාධි අපේක්ෂකයෙකු වන ජී. පැතුම් හෂාන් මහතා විසින් 25% ක කාර්යක්ෂමතාවයකින් යුත් අතින් ක්‍රියාකරන යන්ත්‍රයක් ලෙස සංවර්ධනය කර ඇත. අතින් ක්‍රියාත්මක වන මෙම යන්ත්‍රය විද්‍යුත් අනුවාදයක් (electrical version) බවට පරිවර්තනය කිරීමට ඔහු සැලසුම් කරයි. මෙම යන්ත්‍රය මගින් දිනකට පොලිතින් බෑග් 400 ක් පිරවිය හැකි අතර බෑගයක් පිරවීම සඳහා වැය වන්නේ රුපියල් 2.50 ක් පමණි. අතින් පිරවීමේදී එය දිනකට බෑග් 100 ක් පමණ වන අතර එක් බෑගයකට රුපියල් 10 ක් පමණ වැය වේ. ආයතනයේ අධ්‍යයන වැඩසටහනේ කොටසක් ලෙස මෙම යන්ත්‍රය මෙම ශිෂ්‍යයා විසින් සංවර්ධනය කර ඇති අතර වර්තමානයේ ඔහු ප්‍රධාන වශයෙන් හතු නිෂ්පාදනය සමඟ සම්බන්ධ වන ව්‍යවසායකයෙකි.

යන්ත්‍රයේ දර්ශන

- **ජෛවීය දවටන පදම් කිරීම සහ කෙසෙල් කොළ භාවිතයෙන් ජෛව ආවරණ (පිඟන්) පිරිසැකසුම් කිරීම සඳහා ද්විත්ව කාර්ය යන්ත්‍රයක් නිෂ්පාදනය කිරීම.**

කෙසෙල් කොළ සහිත පරිසර හිතකාමී ජෛව ආහාර ආවරණ මෙම යන්ත්‍රය භාවිතයෙන් වාණිජව නිපදවනු ලැබේ. මෙම යන්ත්‍රයේ ජෛව දවටන නිෂ්පාදනයේ ධාරිතාව වනුයේ පැය අටක වැඩ කරන දිනකට ජෛව දවටන 5,000 ක් පමණ නිෂ්පාදනය කිරීම වේ. නැවුම් කෙසෙල් කොළ මිලදී ගැනීම සහ යන්ත්‍රයෙන් පදම් කිරීම ඇතුළු නිෂ්පාදන පිරිවැය එක් දවටනයකට රුපියල් 6.50 ක් පමණ වේ. මෙම යන්ත්‍රය සංවර්ධනය කිරීම සඳහා සියලු විද්‍යාත්මක තොරතුරු, මූලධර්ම සහ තාක්ෂණය UCIARS හි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය සුජාතා වීරසිංහ මහත්මිය විසින් ලබා දුන් අතර එය එකලස් කර නිෂ්පාදනය කරන ලද්දේ බටඅත, හුංගම පදිංචි සුමිත් අමරවික්‍රම මහතා සහ බටඅත, හුංගම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ පරීක්ෂණ රසායනාගාරයේ ඩබ්ලිව්.ඩබ්ලිව්.ඒ. තමරා ධම්මිකා විසිනි. මෙම යන්ත්‍රය ද්විත්ව කාර්‍ය යන්ත්‍රයක් වන අතර එයට කෙසෙල් කොළ, ආහාර ආවරණයක් ලෙස පදම් කළ හැකි අතර ඊට සමගාමීව කෙසෙල් කොළේ වම් පැත්ත ජෛව පිඟන් ලෙස පිරිසැකසුම් කළ හැකිය. එමඟින් විදුලියෙහි ශක්තිය ඉතා ඵලදායී ලෙස භාවිත කල හැකිය.. මෙම යන්ත්‍රය ව්‍යවසායකයින් කිහිප දෙනෙකුගේ අවධානය ග්‍රහණය කර ගෙන ඇති අතර අමරවික්‍රම මහතා මෙම යන්ත්‍රය වාණිජමය වශයෙන් නිෂ්පාදනය කරයි. කුඩා පරිමාණ ව්‍යවසායකයින් අතර ගෘහ මට්ටමේ කර්මාන්තයක් ලෙස ජෛව දවටන අතින් නිෂ්පාදනය කිරීම ජනප්‍රිය වන අතර ඔවුන් දිනපතා කොළඹ හෝටල් සඳහා නිෂ්පාදනය කරයි. මෙම ජෛව පිඟන් හරිත කොළ, ඉදුණු කොළ, වියළි කොළ සහ ඉරුණු කොළ වලින් ද සෑදිය හැකිය. ඒවා බැලූ බැල්මට පරිසර හිතකාමී හා ආකර්ශනීය ය.

ජෛව පලතුරු දවටන නිෂ්පාදනය කිරීමේ යන්ත්‍රය

ගෘහ කර්මාන්ත ලෙස වාණිජමය ලෙස ජෛව දවටන නිෂ්පාදනය කරන්නන්

- **ක්ෂණික කොළ කැඳ හඳුන්වා දීම**

මෙම ආයතනය කරපින්චා, සාම්ප්‍රදායික සහල් සහ කුළුබඩු සුදුසු ප්‍රමාණයකට මිශ්‍ර කර ක්ෂණික කොළ කැඳ ලෙස සංවර්ධනය කර ඇත. මෙම නිෂ්පාදනය ආයතනය විසින් වාණිජකරණය කර ඇත්තේ මාතර හිත්තැටිය පදිංචි එන්.එල්. උඩුගමසූරිය යන තරුණයා ගේ ද සහාය සමඟය. ඔහු වාණිජ පරිමාණයෙන් මෙම නිෂ්පාදනය අඛණ්ඩව කරගෙන යයි.

3. පර්යේෂණ සහ නවෝත්පාදන

2018 වර්ෂයේ දී IARS මගින් සිදු කළ පර්යේෂණ (අධ්‍යයන අංශය)

පර්යේෂණ මාතෘකා වල තේරුම වෙනස් විය හැකි බැවින් එම මාතෘකා සිංහලට පරිවර්තනය නොකරන ලදී.

පශ්චාත් උපාධි පර්යේෂණ

1. Topic: Effect of K fertilizer, plant growth regulators and grafting on induction of female flowers of *Momordica diocia* (Thumba Kariwila)

   Progress: Research has already completed and thesis has submitted

2. Topic: Study on growth and yield of *abelmoschus esculentus* (okra) and *solanum melongena* (eggplant) as affected by application of different concentration of wood vinegar / pyroligneous acid produced by using different wood species

   Progress: Research has already completed

3. Topic: Growth and yield performances of *solanum melongena var. Insanum* (ela batu) as affected by type of planting materials, polythene mulching and drip irrigation

   Progress: Research has already completed

කෘෂි තාක්ෂණික අධ්‍යයන අංශය මගින් පහත දැක්වෙන මාතෘකා යටතේ පර්යේෂණ පවත්වන ලදී.

- Study of antagonistic effect of spent pleurotus mushroom substrate
- Enhancing Red Palm (*Crytostachys renda*) Seed germination by pre-plant treatments
- Development of a biscuit with ripe Embul banana as a value addition
- Identification of an effective vegetative propagation technique for *Bavunia cociana*
- Development of a machine for bagging rice to minimize the cost of production in rice
- Development of an automated drip irrigation system for the dry zone
- Identification of promising Banana accessions for fiber extraction from pseudostems of Banana

- Assembling of an effective machine to fabricate bio plates with banana leaves
- Development of a cost effective machine to cure banana leaves as bio food wrappers
- Evaluation of the effect of black coloured bags as bunch covers on performances of Cavendish banana

ප්‍රකාශන

1. Hirimburegama, K. and Vidanapathirana, N., 2018. Panel Keynote Speech. **Women** Participation in Tertiary Education in Sri Lanka with Special Emphasis on Science Education *H. Li, R. Suomi, Á. Pálsdóttir, R. Trill, H. Ahmadinia (Eds.)*, p.1.

2. B.P. Siriwardena, T.G.B. Dhanushka, N.P. Vidanapathirana (2018) THE ADOPTION OF E-LEARNING TECHNOLOGY FOR FARMERS USING EXTENSIONS TO TECHNOLOGY ACCEPTANCE MODEL (TAM), *EDULEARN18 Proceedings*, pp. 6461-6464.

3. T.G.B. Dhanushka, B.P. Siriwardena, N.P. Vidanapathirana (2018) EVALUATION OF E-LEARNING EFFECTIVENESS FOR FARMERS: THE RELATIONSHIP BETWEEN USER CHARACTERISTICS, DESIGN FEATURES AND USER SATISFACTION, *EDULEARN18 Proceedings*, pp. 6510-6515.

4. පුහුණු, වැඩමුළු සහ කාර්ය මණ්ඩල සංවර්ධනය

අධ්‍යයන කාර්යය මණ්ඩලය පහත සඳහන් පරිදි විශේෂ පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වී ඇත.

- රුහුණ විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ විශ්‍රාමලත් මහාචාර්යවරයෙකු වන ආචාර්ය එල්. නුගලියැද්ද මහතා විසින් "විද්‍යාත්මක ලිවීම" පිළිබඳ එක් දින පුහුණු වැඩසටහනක් 2018/09/28 දින IARS හිදී පවත්වන ලදී.
- "ආහාර සුරක්ෂිතතාව සහ පාරිසරික තිරසාරභාවය සඳහා කෘෂිකාර්මික නවෝත්පාදනයන්" යනුවෙන් 2018 අප්‍රේල් 3 සිට 5 දක්වා තායිවානයේ පැවති වැඩමුළුවක් සඳහා ආචාර්ය සුජාතා වීරසිංහ මහත්මිය සහභාගී විය.
- පළිබෝධනාශක කළමනාකරණයේ ගැටළු සහ ප්‍රවණතා පිලිබඳ වැඩසටහනක් 2018/09/08 දින IARS හි දී ක්‍රොප් ලයිෆ් සමාගම විසින් පවත්වා ඇත.
- පොහොර කළමනාකරණය සඳහා නව තාක්ෂණයන් පිලිබඳ වැඩසටහනක් 2018/12/10 දින යුනි පවර්ස් සමාගම විසින් IARS හිදී පවත්වා ඇත.
- ගොවිපල යන්ත්‍රෝපකරණ සහ ඒවායේ භාවිතයන් පිලිබඳ වැඩසටහනක් බ්‍රවුන්ස් සමාගම විසින් IARS හි දී 2018.12.18 සහ 19 දින වල පවත්වා ඇත.

අනධ්‍යයන කාර්යය මණ්ඩලය පහත සඳහන් පරිදි විශේෂ පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වී ඇත.

පරිපාලන කාර්යය මණ්ඩලය

සහකාර ලේඛකාධිකාරී, එස්.ඒ.එස්.ප්‍රියදර්ශනී මහත්මිය පහත සඳහන් වැඩසටහන් සඳහා සහභාගී වී ඇත;

- ඉන්දුනීසියාවේ ගජ මදා විශ්ව විද්‍යාලයේ 2018 ජනවාරි 28 සිට පෙබරවාරි 4 දක්වා පැවති කළමනාකරණය පිලිබඳ ජාත්‍යන්තර වැඩසටහන
- රාජ්‍ය අංශයේ විනය ක්‍රියා පටිපාටි පිළිබඳව මිලෝදා ආයතනයේ පැවති වැඩසටහන
- පොදු ප්‍රසම්පාදන කළමනාකරණයේ අවශ්‍යතාවය පිළිබඳව මිලෝදා ආයතනයේ පැවති වැඩසටහන

- තොරතුරු තාක්ෂණ ආශ්‍රිත භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදන සඳහා ලංසු ඇගයීම පිළිබඳව මිලෝදා ආයතනයේ පැවති වැඩසටහන
- ලංසු ලේඛන හා ටෙන්ඩර් පටිපාටි සකස් කිරීම පිළිබඳව මිලෝදා ආයතනයේ පැවති වැඩසටහන

අනෙකුත් අනධ්‍යයන කාර්යය මණ්ඩලය

- මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම පිළිබඳව මිලෝදා ආයතනයේ පැවති වැඩසටහන
- ගොනු කළමනාකරණය සහ සාමාන්‍ය කාර්යාල පරිපාලනය, ආයතන සංග්‍රහය පිළිබඳව මිලෝදා ආයතනයේ පැවති වැඩසටහන
- පුද්ගලික ගොනු කළමනාකරණය පිළිබඳව මිලෝදා ආයතනයේ පැවති වැඩසටහන
- රාජ්‍ය අංශයේ මූල්‍ය රෙගුලාසි පිළිබඳව මිලෝදා ආයතනයේ පැවති වැඩසටහන
- භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය සහ පාඩු හා පොත් වලින් ලියා හැරීම පිළිබඳව මිලෝදා ආයතනයේ පැවති වැඩසටහන
- රාජ්‍ය මූල්‍ය රෙගුලාසි පිළිබඳව මිලෝදා ආයතනයේ පැවති වැඩසටහන
- රජයේ විගණන ප්‍රමිති සහ විගණන විමසුම් වලට පිළිතුරු සැපයීම පිළිබඳව මිලෝදා ආයතනයේ පැවති වැඩසටහන

5. නවීකරණය කිරීම් සහ ඉදිකිරීම් ව්‍යාපෘති

වගු අංක 20 : නවීකරණය කිරීම් සහ ඉදිකිරීම් ව්‍යාපෘති

අංකය	ව්‍යාපෘති නාමය	වෙනත් කරුණු
01	පටක රෝපණ විද්‍යාගාරය සඳහා තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරිම (සැලසුම් කර ඉදිකිරිම)	ව්‍යාපෘති පිරිවැය: රුපියල් මිලියන 150 (VAT සහිතව) කොන්ත්‍රාත්කරු: KSJ ඉදිකිරීම් පුද්ගලික සමාගම භෞතික ප්‍රගතිය: 82% මූල්‍ය ප්‍රගතිය : 60%
02	පවත්නා පැළ තවාන පුළුල් කිරීම.	ව්‍යාපෘති පිරිවැය : රුපියල් මිලියන 2.3 (VAT සහිතව) කොන්ත්‍රාත්කරු: විදාන ආරච්චි ගොඩනැගිලි ඉදිකිරීම් ආයතනය භෞතික ප්‍රගතිය: 100% මූල්‍ය ප්‍රගතිය : 90%
03	පවත්නා නිල නිවාස ගොඩනැගිල්ල, කෘෂි තාක්ෂණික උපාධි වැඩසටහනේ දේශන ශාලා සහ මූලික රසායනාගාර ඉදි කිරීම සඳහා පුළුල් කිරීම සහ නවීකරණය කිරීම.	ව්‍යාපෘති පිරිවැය: රුපියල් මිලියන 26 (VAT සහිතව) කොන්ත්‍රාත්කරු: විදාන ආරච්චි ගොඩනැගිලි ඉදිකිරීම් ආයතනය භෞතික ප්‍රගතිය: 100% මූල්‍ය ප්‍රගතිය : 77%
04	ආපනශාලාව පුනරුත්ථාපනය කිරීම	ව්‍යාපෘති පිරිවැය: රුපියල් මිලියන 4.3 (VAT සහිතව) කොන්ත්‍රාත්කරු: විජේසිංහ කන්ස්ට්‍රක්ෂන් භෞතික ප්‍රගතිය: 100% මූල්‍ය ප්‍රගතිය : 91%

05	විදුලි වැට ඉදි කිරීම	ව්‍යාපෘති පිරිවැය: රුපියල් මිලියන 13.2 (VAT සහිතව) කොන්ත්‍රාත්කරු: ශාන් ඉලෙක්ට්‍රොනික් භෞතික ප්‍රගතිය: 60% මූල්‍ය ප්‍රගතිය : 59%
06	වැව පැත්තේ පොදු විදුලි පද්ධතිය ඉදිකිරීම	ව්‍යාපෘති පිරිවැය: රුපියල් මිලියන 1.8 (VAT සහිතව) කොන්ත්‍රාත්කරු: සන්පවර් ඉංජිනියරින් භෞතික ප්‍රගතිය: 100% මූල්‍ය ප්‍රගතිය : 97%
07	බිංදු ජල වාරිමාර්ග පද්ධතිය ස්ථාපිත කිරීම	ව්‍යාපෘති පිරිවැය: රුපියල් මිලියන 3.8 (VAT සහිතව) කොන්ත්‍රාත්කරු: ජිනසේන පුද්ගලික සමාගම භෞතික ප්‍රගතිය: 80% මූල්‍ය ප්‍රගතිය : 0%
08	පිවිසුම් මුර කුටිය සහ මායිම් වැට ඉදිකිරීම	ව්‍යාපෘති පිරිවැය: රුපියල් මිලියන 1.1 (VAT සහිතව) කොන්ත්‍රාත්කරු: එරෝදා එන්ටර්ප්‍රයිසස් භෞතික ප්‍රගතිය: 95% මූල්‍ය ප්‍රගතිය : 0%
09	බිම්මල් බීජ නිෂ්පාදන නිවස ඉදිකිරීම	ව්‍යාපෘති පිරිවැය: රුපියල් මිලියන 0.4 (VAT සහිතව) කොන්ත්‍රාත්කරු: විජේසිංහ කන්ස්ට්‍රක්ෂන් භෞතික ප්‍රගතිය: 90% මූල්‍ය ප්‍රගතිය : 0%
10	ගව මඩුව ඉදිකිරීම	ව්‍යාපෘති පිරිවැය: රුපියල් මිලියන 6.8 (VAT සහිතව) කොන්ත්‍රාත්කරු: විජේසිංහ කන්ස්ට්‍රක්ෂන් භෞතික ප්‍රගතිය: 35% මූල්‍ය ප්‍රගතිය : 16%
11	යෝජිත මාණ්ඩලික නිල නිවාස ඉදිකිරීම (පළමු අදියර)	ව්‍යාපෘති පිරිවැය: රුපියල් මිලියන 0.4 (VAT සහිතව) කොන්ත්‍රාත්කරු: එරෝදා එන්ටර්ප්‍රයිසස් භෞතික ප්‍රගතිය: 65% මූල්‍ය ප්‍රගතිය : 12%
12	වියළුම් නිවස ඉදිකිරීම	ව්‍යාපෘති පිරිවැය: රුපියල් මිලියන 0.6 (VAT සහිතව) කොන්ත්‍රාත්කරු: විජේසිංහ කන්ස්ට්‍රක්ෂන් භෞතික ප්‍රගතිය: 15% මූල්‍ය ප්‍රගතිය : 0%
13	මාණ්ඩලික නිල නිවාස ඉදිකිරීම සඳහා පැරණි පරිපාලන ගොඩනැගිල්ල පුනරුත්ථාපනය කිරීම	ව්‍යාපෘති පිරිවැය: රුපියල් මිලියන 14.2 (VAT සහිතව) කොන්ත්‍රාත්කරු: සමික්ටා කන්ස්ට්‍රක්ෂන් භෞතික ප්‍රගතිය: 10% මූල්‍ය ප්‍රගතිය : 0%

14	වාහන සහ මෝටර් බයිසිකල් සඳහා ගරාජය ඉදිකිරීම	ව්‍යාපෘති පිරිවැය: රුපියල් මිලියන 0.5 (VAT සහිතව) කොන්ත්‍රාත්කරු: කඹුරුපිටිය ඉන්ඩස්ට්‍රීස් භෞතික ප්‍රගතිය: 5% මූල්‍ය ප්‍රගතිය : 0%

6. මූල්‍ය

වගු අංක 21 : පුනරාවර්තන වියදම් විස්තර

විෂය	2017 (රු)	2018 (රු)
පෞද්ගලික පඩිනඩි	33,191,619.00	41,046,865.00
ගමන් වියදම්	887,150.00	919,723.00
සැපයුම්	4,298,109.00	4,323,763.00
නඩත්තු	949,250.00	1,471,764.00
ගිවිසුම්ගත සේවා	6,807,301.00	8,839,855.00
වෙනත්	4,714,783.00	5,109,697.00
මුළු එකතුව	**50,848,212.00**	**70,711,667.00**

වගු අංක 22 : ප්‍රාග්ධන වියදම් විස්තර

විෂය	2017 (රු)	2018 (රු)
ගොඩනැගිලි සහ ව්‍යූහයන් අත්පත් කරගැනීම සහ වැඩි දියුණු කිරීම්	24,791,520.00	3,042,186.00
ගොඩනැගිලි සහ ව්‍යූහයන් පුනරුත්ථාපනය	-	4,366,029.00
වාහන	-	35,000.00
රසායනාගාර සහ ඉගැන්වීම	252,305.00	539,905.00
පිරියත යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	1,103,540.00	900,563.00
සවිකිරීම් සහ උප මෙවලම්	-	-
ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ	-	-
නේවාසිකාගාර ව්‍යාපෘතිය	-	-
ගෘහ උපකරණ	-	623,316.00
කාර්යාල උපකරණ	3,406,700.00	4,287,200.00
ගෘහභාණ්ඩ සහ උප මෙවලම්	9,855,174.00	5,603,061.00
ක්‍රීඩා භාණ්ඩ	222,000.00	-
පොත්	430.00	-
ඉඩම් මූලික පිරිවැය	2,344,670.00	-
දැනට ක්‍රියාත්මක වැඩ (නොනිමි වැඩ)	-	131,627,625.00
සංගීත උපකරණ	-	373,925.00
මුළු එකතුව	**79,156,261.00**	**151,398,810.00**

වගු අංක 23 : ව්‍යාපෘති වියදම් විස්තර (දේශීය/ විදේශීය අරමුදල්)

නම	TCE රු.	2018 වර්ෂයේ වියදම	31.12.2018 වන විට සමුච්චිත වියදම	භෞතික ප්‍රගතිය % (2018)
පවත්නා විදාතා ගොඩනැගිල්ල (ශ්‍රී ලංකා රජය අරමුදල් සපයන) ව්‍යාප්ත කිරීම හා පුනරුත්ථාපනය කිරීම	29,079,639.60	1,250,177.50	26,041,697.91	100%
විදාතා ගොඩනැගිල්ලට (ශ්‍රී ලංකා රජය අරමුදල් සපයන) ව්‍යාප්ති කටයුතු අවසන් කිරීම	4,290,181.19	-	4,068,327.72	100%
දේශන ශාලා සහ මූලික විද්‍යාගාර ඉදිකිරීම සඳහා නිල නිවාස ගොඩනැගිල්ල පුළුල් කිරීම හා පුනරුත්ථාපනය කිරීම (ශ්‍රී ලංකා රජය අරමුදල් සපයන)	29,803,414.53	9,768,583.76	23,020,870.76	100%
පටක රෝපණ විද්‍යාගාරය සඳහා ගොඩනැගිලි සංකීර්ණය සැලසුම් කර ඉදිකිරීම (ශ්‍රී ලංකා රජය අරමුදල් සපයන)	150,000,000.00	48,499,628.95	86,726,717.95	82%
පවත්නා පැළ ගෘහය ව්‍යාප්ත කිරීම (ශ්‍රී ලංකා රජය අරමුදල් සපයන)	2,545,446.38	1,563,068.51	2,287,130.36	100%
ආපනශාලාව පුනරුත්ථාපනය කිරීම	4,363,542.75	4,002,049.01	4,002,049.01	100%
විදුලි වැට ඉදිකිරීම	13,207,746.00	7,921,763.23	7,921,763.23	60%
වැව පැත්තේ පොදු විදුලි පද්ධතිය ඉදිකිරීම	1,822,500.00	1,772,975.00	1,772,975.00	100%
බිංදු ජල වාරිමාර්ග පද්ධතිය ස්ථාපිත කිරීම	3,835,413.60	-	-	80%
පිවිසුම් මුර කුටිය සහ මායිම් වැට ඉදිකිරීම	1,176,701.87	-	-	95%
බිම්මල් බීජ නිෂ්පාදන නිවස	499,931.45	-	-	90%
ගව මඩුව ඉදිකිරීම	6,845,761.51	1,109,750.00	1,109,750.00	35%
යෝජිත මාණ්ඩලික නිල නිවාස ඉදිකිරීම (පළමු අදියර)	9,999,879.48	1,268,164.64	1,268,164.64	65%
වියළුම් නිවස ඉදිකිරීම	665,964.09	-	-	15%
මාණ්ඩලික නිල නිවාස ඉදිකිරීම සඳහා පැරණි පරිපාලන ගොඩනැගිල්ල පුනරුත්ථාපනය කිරීම (දෙවන අදියර)	14,274,961.32	-	-	10%
වාහන සහ මෝටර් බයිසිකල් සඳහා ගරාජය ඉදිකිරීම	577,788.75	-	-	5%
මුළු එකතුව	**272,988,872.52**	**77,156,160.06**	**158,219,446.58**	

වගු අංක 24 : මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (ඉපැයූ ආදායම්)

ආදායම් මූලාශ්‍රය	2018 වර්ෂයේ ප්‍රතිපාදන රු.	2018 වර්ෂයේ තුල එකතු කිරීම් රු.	(හිඟය)/අතිරික්තය රු.
IARS - සහතික පත්‍ර පාඨමාලා	24,835,000.00	16,224,075.00	(8,610,925.00)
පටක රෝපිත කෙසෙල් පැළ අලෙවි කිරීමෙන්	19,000,000.00	14,815,758.00	(4,184,242.00)
වෙනත් ආදායම්	2,276,200.00	2,896,319.00	620,119.00
මුළු එකතුව	**46,111,200.00**	**33,936,152.00**	**(12,175,048.00)**

වගු අංක 25 : මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය - 2018

විෂය	සූත්‍රය	එක් සිසුවකු සඳහා වන වියදම (රු.)
එක් සිසුවකු වෙනුවෙන් දරන පුනරාවර්තන වියදම (RE)	RE/ සිසුන් ගණන	243,798.41
එක් සිසුවකු වෙනුවෙන් දරන ප්‍රාග්ධන වියදම (CE)	CE/ සිසුන් ගණන	113,867.42
මුළු එකතුව		**357,665.83**

වගු අංක 26 : 2018 වර්ෂයේ දී ආයතනය ලැබූ යටිතල පහසුකම් පිළිබඳ විස්තර

යටිතල පහසුකම් තොරතුරු	වියදම (රු.)	භෞතික ප්‍රගතිය (%)
ගොඩනැගිලි සහ ව්‍යුහයන් පුළුල් කිරීම	නැත	නැත
වෙනත් (සඳහන් කරන්න)	නැත	නැත

අවසාන ගිණුම - 2018

කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය

2018/02/22.

නියෝජ්‍ය විගණකාධිපති,

විගණකාධිපති දෙපාර්තමේන්තුව,

නො: 306/72,

පොල්දූව පාර,

බත්තරමුල්ල.

මහත්මයාණනි,

මූල්‍ය ප්‍රකාශන - 2018

පහත සඳහන් ප්‍රකාශයන් සමඟ 2018 වසර සඳහා කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ අවසාන ගිණුම් මේ සමඟ ඉදිරිපත් කරමි.

01. 2018.12.31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය
02. 2018.12.31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා නිෂ්පාදනය හා වෙළෙඳාම පිළිබඳ ප්‍රකාශය
03. 2018.12.31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය
04. 2018.12.31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා ස්කන්ධයෙහි වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය
05. 2018.12.31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය
06. වගකීම පිළිබඳ ප්‍රකාශය
07. මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ සටහන්

ස්තූතියි

මහාචාර්ය එස්. සුබසිංහ
අධ්‍යක්ෂ
කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය

කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය

කොළඹ විශ්ව විද්‍යාලය

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

වගකීම පිළිබඳ ප්‍රකාශය

පිටු අංක 06 සිට 09 දක්වා පිටුවල ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 10 සිට 15 දක්වා පිටුවල සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්ගේ අත්‍යවශ්‍ය කොටසක් සාදයි. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටී. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලදුව අතර ඔවුන් අත්සන් කොට ඇත.

අධ්‍යක්ෂ
කොළඹ විශ්ව විද්‍යාලය
කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය

කළමනාකාරිත්ව මණ්ඩලයේ සාමාජිකයින්

නම		**අත්සන**
මහාචාර්ය කේ. ආර්. ආර්. මහානාම	පීඨාධිපති/ විද්‍යා පීඨය/ කොළඹ විශ්වවිද්‍යාලය	
ඒ.එස්.පී.වීරසූරිය මහත්මිය	උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා පත්කල සමාජික	
පී.එස්.කේ.ආර්.වීරකෝන්	කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයා පත්කල සමාජික	
මහාචාර්ය තාරා ද සිල්වා	විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව පත්කළ සමාජික	
මහාචාර්ය සමන් අබේසිංහ	විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව පත්කළ සමාජික	
අනිල් රාජකරුණා	පාලක සභාව පත්කළ සමාජික	
මහින්ද මඩිහහේවා	පාලක සභාව පත්කළ සමාජික	

පටුන

		පිටුව
01.	හැඳින්වීම	i – ii
02.	මූල්‍ය ප්‍රකාශන - මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	01
03.	මූල්‍ය ප්‍රකාශන -	
	මූල්‍ය කාර්යසාධනය සහ වෙනත් විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශය	02 - 05
04.	මූල්‍ය ප්‍රකාශන - නිෂ්පාදන හා වෙළඳ ගිණුම්	
05.	ස්කන්ධයෙහි වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය	06
06.	මූල්‍ය ප්‍රකාශන - මුදල් ප්‍රවාහ ප්‍රකාශය	07
07.	මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ සටහන්	08 -18

හැඳින්වීම

කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය ස්ථාපිත කිරීම තුළින් තොරතුරු තාක්ෂණය සහිත කෘෂි තාක්ෂණය පිළිබඳ නවීන දැනුම ඇති කිරීම තුළින් කීර්තිමත් රැකියාවක් ලෙස ශ්‍රී ලංකාවේ කෘෂි කර්මාන්තය නගා සිටුවීම සඳහා ශ්‍රී ලංකා රජය පැත්තෙන් සහතික කරන යුගයක් සඳහා පෙරමුණ ගෙන ඇත.

කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය (මෙහි මින්මතු ආයතනය ලෙස හඳුන්වන) 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 24 අ වගන්තිය සහ 18 වගන්තිය යටතේ සහ 2008 අංක 02 දරන කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතන පනත යටතේ වයස, අවකාශය, කාලය සහ අධ්‍යාපනික පසුබිම වැනි සීමාවන් හරහා කෘෂිකාර්මික/ගොවි ප්‍රජාවට උසස් අධ්‍යාපනය සඳහා අවස්ථාවන් ලබාදීම සඳහා ඉගෙනුම පිළිබඳ මිශ්‍රිත දුරස්ථ රටාව සහිත ආයතනයක් ලෙස පිහිටුවන ලදී. 24 අ වගන්තිය යටතේ නියෝගය 2008 අගෝස්තු මස 23 දින සිට ක්‍රියාත්මක විය.

විශ්ව විද්‍යාල කොමිසන් සභාව විසින් මෙම ආයතනය 2000 දී කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධිත හම්බන්තොට වැලිගත්ත මාගම්පුර කෘෂි තාක්ෂණික හා ප්‍රජා සේවා මධ්‍යස්ථානයේ ස්ථාපිත කරන ලදි. ආයතනය කොළඹ සිට කි.මී. 250ක් ඈතින් කොළඹ කතරගම මහා මාර්ගයට ඉතා සමීපව පිහිටා ඇත. විශ්ව විද්‍යාල පර්යේෂකයින් විසින් අවසාන පරිශීලකයින් වෙත සෘජුවම තාක්ෂණය/දැනුම සහ දැනුම් හැකියාව හුවමාරු කිරීම සහ කලාපය තුළ කෘෂිකර්මය සහ කෘෂි කර්මාන්තයේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම පිණිස ප්‍රජාව සමඟ සමීප සහයෝගී සම්බන්ධතා ගොඩ නඟන ලද ආයතනයකි. වසර කිහිපය අනුව බලන කළ මධ්‍යස්ථානයේ ඉතිහාසය 1998 දක්වා ඈතට දිවයයි.

කෘෂිකර්මය හා කෘෂි තාක්ෂණය, කෘෂි තාක්ෂණය හා ග්‍රාමීය විද්‍යා පුහුණුව පිළිබඳ උසස් අධ්‍යාපනය තුළ දැනට යෙදී සිටින පුද්ගලයින් වෙත දැනුම ලබාදීම, ප්‍රවර්ධනය කිරීමට සහ සංවර්ධනය කිරීමට මෙම ආයතනයට බලය ඇත.උසස් අධ්‍යාපනයේ බිහිදොර වෙත ඇතුළුවීමට කිසි දිනක සිහින නොදුටු ගොවි ප්‍රජාවගේ අභියසට මිශ්‍රිත ඉගෙනුම් ආකෘතියක් තුළින් අධ්‍යාපනය ලබාදෙමින් වෙනස්වන පුද්ගල සහ සමාජය අවශ්‍යතා සහ පහසුකම් සපයනු ඇත. මොවුන්ට උසස් අධ්‍යාපනය ලබාගැනීමට අපේක්ෂාවන් සහ හැකියාව තිබුනද, ඔවුන්ගේ පුද්ගලික, පවුලේ හෝ ආර්ථික පසුබිම් හේතු කොට ගෙන අවස්ථාවන් භාවිතා නොකරයි. ඇතුළත්වීමේ අවශ්‍යතා සහ පාඨමාලා තෝරා ගැනීමේ නම්‍යතාවය සහිත බැවින්, ග්‍රාමීය දිළිඳු අංශවල ආධුණිකයින් වෙත පහසු අවස්ථාවක, ස්ථානයකදී අධ්‍යාපනය ලබාගැනීම සහ ඔවුන්ගේ අධ්‍යාපනික, වෘත්තීමය සහ සමාජීය අපේක්ෂාවන් අවබෝධ කර ගැනීම සඳහා නවීන තොරතුරු සන්නිවේදනය භාවිතා කරමින් ගුණාත්මක ඉහළ අධ්‍යාපනය ලබාගැනීමට මේ මගින් හැකි වන බව ආයතනය පෙන්වා දේ.

සමාජය සමඟ කටයුතු කිරීම සඳහා ආයතනයේ කැමැත්ත සහ බැඳීම ආයතනික පර්මාර්ථ, උපායමාර්ගික සැලසුම් සහ ඉගෙනුම් සහ ඉගැන්වීම ක්‍රියාවලි පිළිබඳ පැහැදිලි ප්‍රකාශයන්ගෙන් තහවුරු කෙරේ.

සංවිධානය සහ කළමනාකරණය

අධ්‍යාපන ක්‍රමය ප්‍රභූ පිරිසෙන් සාමාන්‍ය ජනයා වෙතටත්, ඉගෙනීම මත අවධාරණයෙන් ඉගෙන ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම වෙතටත් මාරු වෙමින් පවත්නා බැවින්, සිසුන් වඩාත් වැදගත් ක්‍රියාකාරුවන් - එනම් ප්‍රාථමික සේවාලාභීන්, පාරිභෝගිකයින් සහ ආධුණිකයින් බවට පත්වී ඇත. එවැනි නව කාර්යභාරයන් සහ ඔවුන් නියෝජනය කරන නව අභියෝග මෙහෙයවීම සඳහා සුදුසු සංවිධානාත්මක සහ කළමනාකාරිත්ව යාන්ත්‍රණ ස්ථාපිත කිරීම් මෙම ඉගැන්වීම සඳහා අවශ්‍ය කෙරේ. සංවිධාන සටහන මගින් ආයතනයේ සංවිධාන ව්‍යුහය පෙන්නුම් කරයි.

පරිපාලන සංවිධානය

ආයතනයේ ප්‍රධානියා අධ්‍යක්ෂවරයෙක් වන අතර ඔහු ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන අධ්‍යාපන නිලධාරී මෙන්ම ගිණුම් නිලධාරියාද වේ. එමෙන්ම අධ්‍යක්ෂ ආයතනයේ කළමනාකාරිත්ව මණ්ඩලයේ, අධ්‍යාපනික පාලක මණ්ඩලයේ සහ සියලුම අධ්‍යයන මණ්ඩලවල නිල බලයෙන් සාමාජිකයෙක් වන අතර අධ්‍යක්ෂ

මණ්ඩලයේ සියලුම රැස්වීම්වලදී මූලිකත්වය දරයි. අධ්‍යක්ෂ ශාස්ත්‍රීය මණ්ඩලයේ සාමාජිකයෙක් ද වන අතර ආයතනයේ අධ්‍යාපනික කාර්යසාධනය පිළිබඳ ශාස්ත්‍රීය මණ්ඩලවෙත උපදෙස් ලබා දේ. කළමනාකාරිත්ව මණ්ඩලය ආයතනයේ අධ්‍යාපනික සහ විධායක මණ්ඩලය වේ. ආයතනයට විශ්ව විද්‍යාලයෙන් මූල්‍ය ස්වාධීනත්වය ඇති අතර කළමනාකාරිත්ව මණ්ඩලය මුදල් සඳහා වගකීමට බැඳී සිටී. අධ්‍යක්ෂ යටතේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙක් සිටී. අධ්‍යක්ෂ සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ ආයතනයේ නිලධාරීන් වේ.

කළමනාකාරිත්ව මණ්ඩලය වෙනුවෙන් පනතේ විධිවිධාන, ආඥාපනත හෝ වෙනත් යම් ලේඛණ විධිමත්ව අනුගමනය කෙරෙන බව සහතික කිරීම අධ්‍යක්ෂගේ රාජකාරියකි. එමෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ ක්‍රියාත්මක කිරීම අධ්‍යක්ෂගේ රාජකාරියක් වන අතර ආයතනය තුළ විනය පවත්වා ගැනිම සඳහා ඔහු වගකීමට බැඳී සිටී.

අධ්‍යාපනික සංවිධානය

ආයතනයට උපදෙස්දීම, ආයතනයේ පුහුණුව, පර්යේෂණ සහ විභාග පාලනය කිරීමේ සහ පොදු උපදෙස් ලබාදීමේ බලය අධ්‍යක්ෂ මූලිකත්වය දරන අධ්‍යාපනික පාලක මණ්ඩලය සතුය.

පර්යේෂණ උසස් උපාධි, අභ්‍යන්තර අධ්‍යාපනික වැඩසටහන්, බාහිර සහ ව්‍යාප්ති වැඩසටහන් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ විසින් මූලිකත්වය ගන්නා අධ්‍යයන මණ්ඩල තුනක් ඇත. අධ්‍යයන මණ්ඩලවලට ආයතනයට උපදෙස් දීම, ආයතනයේ පුහුණුව, පර්යේෂණ සහ විභාග පාලනය කිරීමේ සහ පොදු උපදෙස් ලබාදීමේ බලය ඇත.

ශික්ෂණය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු තුනක් ඇත. ඒවානම් (1) කෘෂි-තාක්ෂණය, (2) ආහාර තාක්ෂණය සහ (3) ව්‍යවසායකත්ව, කෘෂි-ව්‍යාපාර සහ ග්‍රාමීය විද්‍යාව වේ. සෑම අධ්‍යයන දෙපාර්තමේන්තුවක්ම ප්‍රධානියෙක් විසින් මෙහෙයවන ලැබේ.

මධ්‍යස්ථාන තුනක් එනම් කෘෂි ව්‍යාපාර සහ කර්මාන්ත කුටිය, විද්‍යා උයන, ව්‍යාප්ති වැඩසටහන් සම්බන්ධිකාරක විසින් මෙහෙයවයි.

ආයතනය සහ සහයෝගී හවුල්කාර ආයතන සහ විශ්ව විද්‍යාලවල පීය සහ සහය කාර්ය මණ්ඩලය ඉගෙනුම් විෂයය සංවර්ධනය කිරීම, අධ්‍යයන පාඨමාලා/වැඩසටහන් ලබාදීම සහ සහයෝගය දීම මගින් සහය ලබා දේ.

කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය

කොළඹ විශ්ව විද්‍යාලය

2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

(සංඛ්‍යා ආසන්න රුපියලට ගලපා ඇත.)

		2018	2017
		රු	රු
වත්කම්			
ජංගම වත්කම්			
බැංකු ශේෂය	සටහන -1	13,703,823	32,815,061
තොගය	සටහන - 2	6,385,138	4,799,056
ආයෝජන මත ලැබිය යුතු පොළී	සටහන - 3	365,902	1,221,933
ලැබිය යුතු ණය ගිණුම	සටහන -4	1,936,180	2,111,726
අත්තිකාරම්		129,580	75,000
වෙනත් ජංගම වත්කම්		129,589	25,000
		22,650,211	41,047,776
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත හා උපකරණ	සටහන - 5	297,112,139	300,319,539
විලම්භිත වියදම්	සටහන - 6	2,936,743	3,463,396
ට්‍රාන්ස්ෆෝමරය සඳහා තැන්පතු		500,000	500,000
කෙරීගෙන යන වැඩ		131,627,625	51,479,376
ආයෝජන		17,336,713	-
		449,513,219	355,762,311
මුළු වත්කම්		**472,163,430**	**396,810,087**
වගකීම්			
ජංගම වගකීම්			
උපචිත වියදම්	සටහන - 7	3,830,119	3,349,885
වෙනත් ජංගම වගකීම්		14,559	-
		3,844,678	3,349,885
ජංගම නොවන වගකීම්			
ජංගම නොවන වගකීම්	සටහන - 8	6,802,165	6,402,117
		6,802,165	6,402,117
මුළු වගකීම්		**10,646,842**	**9,752,002**
ශුද්ධ වත්කම්/ ස්කන්ධය		**461,516,588**	**387,058,085**
සමුච්චිත අරමුදල්			
වියදම් කළ ප්‍රාග්ධන දීමනා		217,873,391	152,287,459
වියදම් නොකළ ප්‍රාග්ධන දීමනා		1,376,143	5,118,024
තොරතුරු තාක්ෂණ දීමනා		3,160,390	3,160,390
වියදම් කළ අනිකුත් දීමනා		18,705,311	7,373,365
වියදම් නොකළ අනිකුත් දීමනා		5,916,580	769,672
රදවාගත් ඉපයුම්		762,450	5,072,990
ප්‍රත්‍යාගණන සංචිත		446,139	-
වියදම් කළ විශේෂ දීමනා		213,276,184	213,276,184
මුළු ස්කන්ධය		**461,516,588**	**387,058,085**

සහතික කළේ
ඒ.ඩී.පී.ද.සොයිසා

මහාචාර්ය සුභසිංහ
අධ්‍යක්ෂ (කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය)

කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය

කොළඹ විශ්ව විද්‍යාලය

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය

		2018	2017
		රු.	රු.
ආදායම		15,219,211	19,550,958
විකුණුම් පිරිවැය	සටහන 09-10	(16,641,606)	(16,732,360)
දළ ලාභය		(1,422,395)	2,818,598
වෙනත් ආදායම්			
පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන		30,000,000	28,100,000
උපදවන ලද ආදායම්	සටහන - 11	17,623,404	5,565,396
පොළී ආදායම	සටහන - 12	1,502,520	3,968,763
ක්‍රමක්ෂය		21,227,095	18,936,312
		68,930,624	**59,389,069**
අඩුකළා - වියදම්			
පුද්ගලික පඩිනඩි	සටහන -13	(28,762,248)	20,940,844
ගමන් වියදම්	සටහන - 14	(919,723)	887,150
සැපයීම්	සටහන -15	(4,323,763)	2,515,311
නඩත්තු වියදම්	සටහන -16	(1,471,764)	949,250
ගිවිසුම්ගත සේවාවන්	සටහන -17	(8,839,855)	6,807,301
අනෙකුත් පුනරාවර්තන වියදම්		(5,109,697)	4,714,783
මානව සංවර්ධන ප්‍රාග්ධනය		(325,160)	382,978
පාරිතෝෂික		(1,220,954)	798,729
විලම්බිත වියදම් කපාහැරීම		(526,653)	526,653
ක්ෂයවීම්		(21,896,299)	19,664,783
		(73,396,115)	58,187,782
අතිරික්තය/ඌනතාවය		(4,465,491)	1,201,287
වෙනත් විස්තීර්ණ ආදායම්			
ප්‍රත්‍යාගණන සංචිත ස්ථාවර වත්කම්		416,000	-
ප්‍රත්‍යාගණන සංචිත - සජීවී වත්කම්		30,139	-
සම්පූර්ණ විස්තීර්ණ ආදායම		**(4,019,352)**	**1,201,287**

තුඹ පැල
නිෂ්පාදන වියදම් සහ වෙළඳ ගිණුම
නිෂ්පාදන පිරිවැය සහ වෙළඳ ගිණුම

රු.		2018
දෙසැම්බර් 31 වලින් අවසන් වූ වර්ෂය සඳහා		
අමුද්‍රව්‍යවල පිරිවැය		7,414
වෙනත් සෘජු පිරිවැය	**Note - 09**	221,668
ප්‍රාථමික පිරිවැය		229,082
වක්‍ර / පොදු කාර්ය පිරිවැය	**Note - 10**	26,334
මුළු නිෂ්පාදන පිරිවැය		**255,417**
විකුණුම් පිරිවැය		
පැපොල් පැළ 2018.01.01 දිනට ඒකක 1178 ක් රු. 9.38		**11,050**
එකතු කරන්න: නිෂ්පාදන පිරිවැය		255,417
		266,467
තුඹ පැල 31.12.2018		
		266,467
විකුණුම් ආදායම		156,450
ලාභය / අලාභය		**110,017**

පැපොල් පැල

නිෂ්පාදන පිරිවැය සහ වෙළඳ ගිණුම

රු.		2018
දෙසැම්බර් 31 වලින් අවසන් වූ වර්ෂය සඳහා		
අමුද්‍රව්‍යවල පිරිවැය		11,161
වෙනත් ඍජු පිරිවැය	**Note - 09**	81,447
ප්‍රාථමික පිරිවැය		92,608
වක්‍ර / පොදු කාර්ය පිරිවැය	**Note - 10**	9,676
මුළු නිෂ්පාදන පිරිවැය		**102,284**
විකුණුම් පිරිවැය		
පැපොල් පැල 2018.01.01 දින වන විට ඒකක 549 ක් රු. 22.74		**12,484**
එකතු කරන්න: නිෂ්පාදන පිරිවැය		102,284
		114,768
2018.12.31 දිනට පැපොල් පැල		-
		114,768
විකුණුම් ආදායම		82,935
ලාභය / අලාභය		**(31,833)**

කෙසෙල් පැල
නිෂ්පාදන පිරිවැය සහ වෙළඳ ගිණුම

රු.	2018
දෙසැම්බර් 31 වලින් අවසන් වූ වර්ෂය සඳහා	
අමුද්‍රව්‍යවල පිරිවැය	2,352,049
වෙනත් සෘජු පිරිවැය	11,981,502
ප්‍රාථමික පිරිවැය	14,333,551
නොනිමි වැඩ (18,180)	835,070
නිමි වැඩ (30,009)	(816,917)
ප්‍රාථමික පිරිවැය	14,351,704
වක්‍ර / පොදු කාර්ය පිරිවැය	1,423,416
මුළු නිෂ්පාදන පිරිවැය (225,665)	**15,775,120**
	14,472,423
විකුණුම් පිරිවැය	
කෙසෙල් පැල 2018.01.01 දිනට ඒකක 20,169 ක් රු. 73.47 කි	**1,510,073**
එකතු කරන්න: නිෂ්පාදන පිරිවැය	15,775,120
	17,285,193
කෙසෙල් පැල 2016.12.31 දිනට ඒකක 38,750 ක් රු. 69.9	(2,708,820)
	14,576,373
ලාභය / අලාභය	**(103,950)**

කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය
කොළඹ විශ්ව විද්‍යාලය
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා
ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

	වියදම් කල ප්‍රාග්ධන ප්‍රදාන	වියදම් නොකල ප්‍රාග්ධන ප්‍රදාන	තොරතුරු තාක්ෂණ ප්‍රදාන	අනෙකුත් වියදම් කල ප්‍රදාන	අනෙකුත් වියදම් නොකල ප්‍රදාන	සමුච්චිත අතිරික්තය	විශේෂ ප්‍රදාන	සංචිත ප්‍රත්‍යාගණනය	එකතුව
2018.01.01 දිනටශේෂය	152,287,459	5,118,024	3,160,390	7,373,365	769,672	5,072,990	213,276,184		387,058,084
පෙර වසරේ හර ගැලපුම් සටහන						(4,981)			(4,981)
පෙර වසරේ බැර ගැලපුම් සටහන						159,931			159,931
නැවත ප්‍රකාශිත ශේෂය	**152,287,459**	**5,118,024**	**3,160,390**	**7,373,365**	**769,672**	**5,227,941**	**213,276,184**		**387,053,103**
<u>**2018 වසර සඳහා ස්කන්ධයෙහි වෙනස්වීම්**</u>									
කාලසීමාව සඳහා හිඟය/අතිරික්තය						(4,465,491)			(4,465,491)
වර්ෂය සඳහා ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම්		71,950,000			27,600,000				99,550,000
ප්‍රාග්ධන වියදම්	75,691,881	(75,691,881)		22,453,092	(22,453,092)				-
ක්‍රමක්ෂය	(10,105,949)			(11,121,146)					(21,227,095)
සජීවී කොටස් ප්‍රත්‍යාගණනය								**30,139**	**30,139**
දේපළ පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය								416,000	416,000
2017.12.31 දිනට ඉදිරියට ගෙන ගිය ශේෂය	**217,873,391**	**1,376,143**	**3,160,390**	**18,705,311**	**5,916,580**	**762,450**	**213,276,184**	**446,139**	**461,356,657**

කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය

කොළඹ විශ්ව විද්‍යාලය

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

		2018	2017
		රු.	රු.
වසරේ අතිරික්තය		(4,019,352)	1,201,286
අරමුදල් වෙනස්වීමට සම්බන්ධ නොවූ අයිතම සඳහා ගැලපීම්			
එකතුකළා	පෙර වසරේ ගැලපීම්		699,028
	ක්ෂයවීම	22,978,583	20,212,536
	විලම්බිත වියදම් කපාහැරි මුදල	526,653	526,653
	ක්‍රමක්ෂය	(21,227,095)	(18,936,312)
	පොළී ආදායම	(1,502,520)	(3,958,365)
	පාරිතෝෂික	1,220,954	798,729
	උපචිත වියදම්	3,830,119	-
	වෙනත් විස්තීර්ණ වියදම්	(446,139)	-
කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් කටයුතු		**1,361,203**	**543,555**
කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් අතිරික්තය			
	තොගය තුළ වැඩිවීම/අඩුවීම	(1,586,082)	(23,313)
	ලැබීම් වැඩිවීම/අඩුවීම	1,066,341	833,715
	ලැබිය යුතු ණය වැඩිවීම/අඩුවීම	621,686	621,199
	අනෙකුත් වත්කම් වැඩිවීම/අඩුවීම	(159,169)	2,208,391
	ගෙවීම් වැඩිවීම/අඩුවීම	(3,335,326)	27,540
මෙහෙයුම් කාර්යයන්ගෙන් ශුද්ධ මුදල් ප්‍රවාහය		**(2,031,347)**	**4,211,095**
ආයෝජන කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ			
	විලම්භිත වියදම් වැඩිවීම/අඩුවීම	-	(31,751,968)
	කෙරිගෙන වැඩ	(80,148,249)	-
	ණය වැඩිවීම/අඩුවීම	-	(47,032,352)
	ස්ථාවර වත්කම් අත්කර ගැනීම වැඩිවීම/අඩුවීම	(19,771,183)	3,958,365
	වසර සඳහා පොළී ආදායම	1,292,210	-
	ආයෝජන වැඩිවීම/අඩුවීම	(17,336,713)	-
ආයෝජන කාර්යයන්ගෙන් ශුද්ධ මුදල් ප්‍රවාහය		**(115,963,934)**	**(74,825,955)**

මූල්‍ය කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ		
පාරිතෝෂික ගෙවීම්	(237,576)	-
ප්‍රාග්ධන වියදම සඳහා රජයේ ප්‍රදාන	99,704,950	8,300,000
ණය ගැනීම් අඩුවීම්/වැඩිවීම්	(583,330)	(1,041,667)
ආයෝජන ආපසු ගැනීම	-	1,537,339
මූල්‍ය කාර්යයන්ගෙන් ශුද්ධ මුදල් ප්‍රවාහය	**98,884,044**	**8,795,672**
මුදල්වලට සමාන දෑ හි ශුද්ධ වැඩිවීම	**(19,111,238)**	**(61,819,188)**
කාලසීමාව ආරම්භයේදී මුදල් හා මුදලට සමාන දෑ	**32,815,061**	**94,634,249**
කාලසීමාව අවසානයේදී මුදල් හා මුදලට සමාන දෑ	**13,703,823**	**32,815,061**

මූල්‍ය ප්‍රකාශයන්ට සටහන්

කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය
කොළඹ විශ්ව විද්‍යාලය

1. **සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති**

1.1 වාර්තාකරන ආයතනය

කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය 2008 අංක 02 දරන ආඥාපනත යටතේ සංස්ථාගත කොට ඇති අතර 2008 ඔක්තෝබර් 16 දින ගැසට් කරන ලදී. ප්‍රධාන පරිපාලනය හම්බන්තොට නව නගරයේ වැලිගත්ත වේ. කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ 2018/12/31දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශයන් සකස් කෙරේ.

1.2 සකස් කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශයන් ගිණුම්කරණය පිළිබඳ ඓතිහාසික පදනම මත පිළියෙළ කරයි. ඒ අනුව ගනුදෙනු වත්කම් අත්කර ගනු ලැබූ, දරනු ලැබූ දිනයේදි පැවති වටිනාකමට වාර්තා කරන අතර ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරී ආයතනය විසින් දක්වා ඇති **ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට** අනුකූලව අරමුදල් ලබා ගනී.

මූල්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකා රුපියල් වලින් සකස් කෙරෙන අතර එය ක්‍රියාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල වේ. පසුගිය වසරට අදාළ සංඛ්‍යා සහ වාක්‍ය ඛණ්ඩ වර්තමාන වසරේ ඉදිරිපත් කිරීම සමඟ සැසැඳීම සඳහා අවශ්‍ය තැන්හිදී නැවත සඳහන් කොට ඇත.

1.3 වත්කම් සහ එහි වටිනාකම් පදනම

1.3.1 දේපල පිරියත හා උපකරණ

ඉඩම ලුණුගම්වෙහෙර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇත. එය 1988 සිට ආයතනය විසින් වසර 30ක බදු පදනමක් මත කුලියට දී ඇත.ගොඩනැගිලි හා ව්‍යුහයන්ගේ වටිනාකම තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබාදෙන ලද වටිනාකම මත පදනම් වී දක්වා ඇත.

දේපල, පිරියත සහ උපකරණ සහ විද්‍යාගාරය හා ඉගෙනුම් උපකරණවලට රජයේ ප්‍රදාන, පර්යේෂණ ප්‍රදාන සහ අභ්‍යන්තරව උපයන ලද අරමුදල්වලින් මිලදී ගත් අයිතම ඇතුළත්ය.

දේපල, පිරියත සහ උපකරණ එහි අහඹු වියදම් සහිතව මිලදී ගැනීමේ පිරිවැයට වාර්තා කෙරේ. වත්කම් දක්වා ඇත්තේ සමුච්චිත ක්ෂයවලින් අඩුකළ පිරිවැයටය.

පසුව සිදුවන වියදම්

පසුව සිදුවන වියදම්වලට වත්කමේ ඉදිරියට යන ප්‍රමාණය හෝ සුදුසු පරිදි වෙනම වත්කමක් ලෙස පිළිගත් අගය ඇතුළත් කෙරේ. එසේ වන්නේ අයිතම හා බැඳුණු අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබේනම් සහ අයිතම පිරිවැය සැබැවින්ම මැනිය හැකි නම් පමණි. අනිකුත් සියලුම අළුත්වැඩියා කිරීම් සහ නඩත්තු වියදම් ඒවා දරනු ලබන මුදල් කාලසීමාව තුළ ආදායම් ප්‍රකාශයට අය කෙරේ.

තොගය

2018.12.31 දිනට අමුද්‍රව්‍ය සහ පාරිභෝගික භාණ්ඩ, නොනිමි තොගය, පටක රෝපිත කෙසෙල් පැල තොගය අවම පිරිවැයට සහ ශුද්ධ මුදා හැරීමේ වටිනාකමට මනිනු ලැබේ. ශුද්ධ මුදා හැරීමේ වටිනාකම යනු නිම කිරීමේ සහ විකිණීමේ වියදම් පිළිබඳ ඇස්තමේන්තු ගත පිරිවැයයි. තොග ඇගයීමේ ක්‍රමය වන්නේ පෙර ඇතුළු පෙර පිටවීම් ක්‍රමයයි.

1.3.2 ක්ෂයවීම

ක්ෂයකිරීම් සියලූම දේපල,පිරියත සහ උපකරණ සහ විද්‍යාගාරය හා ඉගෙනුම් උපකරණඒවායේ ඇස්තමේන්තු ගත ප්‍රයෝජනවත් කාලසීමාව පුරා සරල මාර්ගික ක්ෂයකිරීම මත මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශයට අය කරනු ලැබ ඇත.

<u>විස්තරය</u>		<u>ඇස්තමේන්තු ගත ප්‍රයෝජනවත් කාලසීමාව</u>
ගොඩනැගිලි හා ව්‍යූහ	-	වසර 20
නේවාසික ගොඩනැගිල්ල	-	වසර 20
සවිකිරීම්සහස්ථාපනයන්	-	වසර 10
වාහන	-	වසර 5
විද්‍යාගාර සහ තාක්ෂණික උපකරණ	-	වසර 5
ඉලෙක්ට්‍රොනික උපකරණ	-	වසර 5
ගෘහභාණ්ඩ උපකරණ	-	වසර 10
කාර්යාලිය උපකරණ	-	වසර 10
ගෘහභාණ්ඩ හා සවිකිරීම්	-	වසර10
පිරියත, යන්ත්‍ර සහ උපකරණ	-	වසර10
පොත්	-	වසර10
ක්‍රීඩා භාණ්ඩ	-	වසර10

මිලදී ගත් මාසයද ඇතුළත්ව සහ අලෙවි කරන මාසයට ක්ෂය වෙන් කිරීම් සිදු නොකොට මිලදී ගනු ලැබූ වර්ෂයේ සිට භාවිතා කළ කාලසීමාව මත පදනම්වී විකුණන ලද වර්ෂය දක්වා කාලසීමාවට ක්ෂය කිරීම වෙන් කරනු ලැබේ.

1.3.3 ක්‍රමක්ෂය

රජයේ ප්‍රාග්ධන ප්‍රදාන භාවිතා කරමින් මිලදී ගනු ලැබූ ප්‍රාග්ධන වත්කම් සඳහා ක්ෂයකිරීම් වෙනුවෙන් ක්‍රමක්ෂය වෙන් කර ඇත.

1.3.4 විලම්බිත වියදම්

ලංකා විදුලිබල මණ්ඩලයේ පිරියත ට්‍රාන්ස්ෆෝමරය සඳහා දරන ලද වියදම විලම්බිත වියදමක් ලෙස හඳුනාගෙන ඇති අතර එය සමාන වාරික ලෙස මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශයෙන් කපා හරිනු ලැබේ.

පාරිතෝෂික

1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ ගෙවීම් යටතේ අදාළ අනුපාතයන්ට විශ්‍රාම පාරිතෝෂික සඳහා වෙන් කිරීම සිදු කරන අතර මෙම පනත යටතේ පාරිතෝෂික ගෙවීම සඳහා සුදුසුකම් ලැබීමට සේවකයින් විසින් අවම වශයෙන් අවුරුදු 05ක සේවා කාලයක් සම්පූර්ණ කළ යුතුය. සියලුම සේවකයින් සේවාවේ වසර 05ක් නියුක්තව සිටියේයැයි

උපකල්පනය කරමින් පළමු වසරේ සේවාව සම්පූර්ණ කිරීමෙන් පසු වෙනස් කිරීම සිදු කෙරේ.

1.4 ආදායම් සහ වියදම

1.4.1 රජයේ ප්‍රදානය

වසර වෙනුවෙන් ලද මුළු ප්‍රාග්ධන ප්‍රදානය රුපියල් මිලියන 71.95ක් විය. වසරේ මෙහෙයුම් කාර්යයන් සඳහා භාවිතා කොට ඇති පුනරාවර්තන ප්‍රදාන රුපියල් මිලියන 30 ක් වූ අතර ආදායම් ප්‍රකාශය තුළ ආදායම් ලෙස හඳුනාගෙන ඇත.

1.4.2. ආදායම් හඳුනාගැනීම

(අ) රජයේ ප්‍රදාන (පුනරාවර්තන)
රජයේ පුනරාවර්තන වියදම් ලැබෙන කාලසීමාව තුළ හඳුනාගනී

(ආ) පාඨමාලා ගාස්තු
පාඨමාලා ගාස්තු උපදේශන කාලසීමාව තුළ හඳුනාගනී. වෙනත් මුදල් කාලසීමාවක් සඳහා එවැනි වෙන්කිරීමක් සිදු කිරීමට ප්‍රමාණවත් තොරතුරු ලබාගත නොහැකි අවස්ථාවක, මුදල් පදනමක් මත ආදායම් ලෙස ගාස්තු හඳුනාගනී

(ඇ) ආයෝජන ආදායම
ආයෝජනවලින් ලැබෙන ආයෝජන ආදායම උපචිත පදනමක් මත ගණනය කෙරේ.

1.5 ලැබීම්

ලැබීම් මුදාහැරීමට ඇස්තමේන්තු කෙරෙන ප්‍රමාණයන්ට ප්‍රකාශ කෙරේ.

1.6 මුදල් හා මුදලට සමාන දෑ

මුදල් හා මුදලට සමාන දෑවලින් බැංකු ශේෂය සමන්විත වේ.

1.7 ජංගම වත්කම්

ශේෂ පත්‍රය තුළ වර්ගීකරණය කළ ජංගම වත්කම් ශේෂ පත්‍ර දිනයෙන් පසු එක් වසරක් ඇතුළත ආපසු ලැබෙන වත්කම්ය.

1.8 ජංගම වගකීම්

ශේෂ පත්‍රයේ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කර ඇති වගකීම් වන්නේ ශේෂ පත්‍රයේ දින සිට එක් වසරක් ඇතුළත ගෙවීම සඳහා ගෙවිය යුතු ය. සියළුම වගකීම් සියල්ල අවසන් ප්‍රකාශ සකස් කිරීම සඳහා ගිණුම්ගත කර ඇත.

1.9 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශයන්ගේ අරමුණු සඳහා "අක්‍රමවත් ක්‍රමයන්" භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශයන් සකස් කර ඇත. මුදල් හා මුදල් සමානකම් බැංකු ශේෂයන්ගෙන් සමන්විත වේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 2018

සටහන - 01	2018	2017
බැංකු ශේෂය	රු.	
හම්බන්තොට මහජන බැංකුවේ පැල විකිණීම් රැස්කිරීමේ ගිණුම - 007-1001-4-6432005	808,212	-
සහතිකපත් පාඨමාලා රැස්කිරීමේ ගිණුම - 007-1001-3-0005888	3,898,216	4,842,393
රජයේ පුනරාවර්තන ගිණුම - හම්බන්තොට මහජන බැංකුව 007-1001-2-0005006	7,697,722	9,202,828
ගොවි භාරකාර අරමුදල - 007-1001-3-012515	18,200	82,640
වැටුප් ජංගම ගිණුම - 007100326432005	1,068,191	803,980
පුනරාවර්තන වියදම්	213,282	7,762,324
කෙටිකාලීන තැන්පතු		
ඇණවුම් තැන්පතු	-	10,120,895
	13,703,823	**32,815,061**

සටහන - 02	2018	2017
තොග	රු.	
අමුද්‍රව්‍ය	478,966	960,586
නොනිමි වැඩ	816,917	816,917
කෙසෙල් පැල	2,708,820	1,510,073
පැපොල් පැල	-	12,484
තුඹ පැල	-	11,050
පාරිභෝගික ද්‍රව්‍ය - ලිපි ද්‍රව්‍ය	640,907	326,338
පාරිභෝගික ද්‍රව්‍ය - විදුලි සහ දෘඩාංග	625,929	839,096
පාරිභෝගික ද්‍රව්‍ය - පාරිභෝගික භාණ්ඩ හා වීදුරු උපකරණ	1,113,600	304,359
රසායනික ද්‍රව්‍ය හා කොහුබත්	**-**	**-**
	6,385,138	**4,780,903**

සටහන - 03	2018	2017
ලැබිය යුතු පොළිය	රු.	
ග්‍රාමීය ව්‍යවසායකත්ව සංවර්ධන (RED) වැඩසටහන් ණය	1,092	2,410
ගොවි භාරකාර අරමුදල් ණය	154,500	201,500
මාස 3 කෙටි කාලීන ආයෝජන පොලී	210,310	-
ඇණවුම් තැන්පතු		1,018,023
	365,902	**1,221,933**

සටහන - 04	2018	2017
ණය ගිණුම	රු.	
ග්‍රාමීය ව්‍යවසායකත්ව සංවර්ධන (RED) වැඩසටහන් ණය	49,174	84,416
ගොවි භාරකාර අරමුදල් ණය	1,346,215	1,769,385
ආපදා ණය	540,791	257,925
	1,936,180	**2,111,726**

කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය
කොළඹ විශ්ව විද්‍යාලය
මූල්‍ය ප්‍රකාශයන්ට සටහන් - 2018

සටහන - 05

ජංගම නොවන වත්කම් - පළමු වගුව

විස්තරය	විදුලි උපකරණ	නේවාසිකාගාර ව්‍යාපෘතිය	ගොඩනැගිලි හා ව්‍යූහ	ගොඩනැගිලි හා ව්‍යූහ අලුත්වැඩියා	මෝටර් රථ හා උපකරණ	විද්‍යාගාරය සහ තාක්ෂණික උපකරණ	**පිරියත, යන්ත්‍ර සහ උපකරණ**	**සංගීත භාණ්ඩ**	මුලු ගණන
ජංගම නොවන වත්කම 2018/01/01 දිනට ශේෂය	137,821	222,422,928	78,857,657	5,002,077	10,349,921	9,797,770	4,924,457	-	331,582,631
එකතුකිරීම්/ වැඩිදියුණු කිරීම්	-	-	3,042,186	4,366,029	-	539,905	700,563	373,925	9,022,608
වත්කම් තක්සේරු කිරීම					35,000		200,000		
ප්‍රාග්ධන ප්‍රදාන									
වෙනත් ප්‍රදාන									
බැහැරකිරීම්									
මුළු ගණන	**137,821**	**222,422,298**	**81,899,843**	**9,368,106**	**10,474,921**	**10,337,675**	**5,825,020**	**373,925**	**340,840,239**
ක්ෂය සඳහා වෙන්කිරීම ක්ෂය කිරීමේ අනුපාතය	20%	5%	5%	5%	20%	20%	10%	10%	
2018/01/01 දිනට ශේෂය	61,304	33,660,011	8,922,871	28,970	8,714,788	3,672,525	1,001,225		56,061,694
ආරම්භක ශේෂ ගැලපීම්									
වසරේ ක්ෂය කිරීම්	27,564	11,121,146	4,035,827	307,510	507,752	1,831,059	545,866	8,499	18,385,224
2018/12/31 දිනට ශේෂය	**88,868**	**44,781,157**	**12,958,698**	**336,480**	**9,222,540**	**5,503,584**	**1,547,091**	**8,499**	**74,446,918**
ශුද්ධ පොතේ වටිනාකම - 2018/12/31	**48,953**	**177,641,771**	**68,941,145**	**9,031,626**	**1,252,381**	**4,834,091**	**4,277,929**	**365,426**	**266,393,321**

කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය

කොළඹ විශ්ව විද්‍යාලය

මූල්‍ය ප්‍රකාශයන්ට සටහන් - 2018

සටහන - 05

ජංගම නොවන වත්කම් - දෙවන වගුව

විස්තරය	ගෘහස්ත උපකරණ	කාර්යාලීය උපකරණ	ගෘහභාණ්ඩ හා සවිකිරීම්	ක්‍රීඩා භාණ්ඩ	පොත්	ඉඩම් සඳහා මූලික වියදම්	වගු II න් ගෙන ආ එකතුව	වගු I න් ගෙන ආ එකතුව	මුලුගණන
ජංගම නොවන වත්කම									
2018/01/01 දිනට ශේෂය	372,184	11,748,572	16,790,196	223,200	643,498	2,928,385	32,706,035	**331,582,631**	**364,288,66**
එකතුකිරීම්/ වැඩිදියුණු කිරීම්	623,316	4,106,200	5,603,061	-	-	-	10,332,577	**9,022,608**	**19,355,185**
වත්කම් ප්‍රත්‍යාගණනය		181,000							
ප්‍රාග්ධන ප්‍රදාන									
වෙනත් ප්‍රදාන									
බැහැරකිරීම්									
මුළු ගණන	**995,500**	**16,035,772**	**22,393,257**	**223,200**	**643,498**	**2,928,385**	**43,038,612**	**340,840,239**	**383,643,851**
ක්ෂය සඳහා වෙන්කිරීම ක්ෂය කිරීමේ අනුපාතය	10%	**10%,20%**	10%	10%	10%				
2018/01/01 දිනට ශේෂය	149,395	4,484,861	3,182,748	902	89,529		7,907,434.71	56,061,694	63,969,129
වසරේ ක්ෂය කිරීම්	56,052	2,435,416	2,015,222	22,320	64,350		4,593,360	18,385,224	22,978,583
2018/12/31 දිනට ශේෂය	205,447	6,920,277	5,197,970	23,222	153,879		12,500,794	74,446,918	86,947,712
ශුද්ධ පොතේ වටිනාකම - **2018/12/31**	**790,053**	**9,115,495**	**17,195,287**	**199,978**	**489,619**	**2,928,385**	**30,537,817**	**266,393,321**	**296,696,139**

කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය
කොළඹ විශ්ව විද්‍යාලය
මූල්‍ය ප්‍රකාශයන්ට සටහන් - 2018 (ඉතිරි කොටස)

සටහන - 06	**2018**	**2017**
විලම්බීත වියදම්	රු.	
ට්‍රාන්ස්ෆෝමරය - ලංකා විදුලි බල මණ්ඩලය	1,299,300	1,559,160
විදුලි උපකරණ	1,637,443	1,778,116
	2,936,743	**3,463,396**

සටහන - 07	**2018**	**2017**
උපචිත වියදම්	රු.	
විදුලිය	238,080	161,529
ජලය	8,622	11,026
තැපැල් සහ සන්නිවේදනය	222,639	141,959
වැටුප්	220,652	194,575
සේවක අර්ථ සාධක අරමුදල	360,037	344,450
සේවක භාරකාර අරමුදල	78,598	64,013
අතිරේක වැඩකළ දින ගෙවීම්	60,672	39,867
දේශිය ගමන් වියදම්	43,546	7,200
ඉන්ධන හා ලිහිසි තෙල්	57,535	-
නඩත්තු වියදම් - ගොඩනැගිලි		-
විශ්ව විද්‍යාල අර්ථ සාධක අරමුදල ණය		2,470
විශ්ව විද්‍යාල අර්ථ සාධක අරමුදල		-
අතිකාල	61,021	29,067
ප්‍රවාහන	109,030	6,500
කාබනික නිෂ්පාදන ව්‍යාපෘතිය		
ව්‍යාපෘති කළමනාකාර ගාස්තු		135,661
සේවක සංවර්ධනය	17,000	
විභාග ගාස්තු	140,300	3,700
මුද්දර ගාස්තු		4,880
වෙනත් සේවා		2,238
වැටුප් වැඩිපුර ගෙවීම් අඩුකිරීම්	23,100	

වෙනත් නඩත්තු සේවා	116,000	2,176,400
සේවක වෘත්තීය ගාස්තු	17,650	2,250
ආරාධිත දේශන ගාස්තුව	10,125	10,800
සුභසාධන	11,000	11,300
උපයන විට බදු ගෙවීම		-
පිරිසිදු සේවා	461,440	
මුද්‍රණය හා ප්‍රචාරණය	214,711	
ක්ෂේත්‍ර සංචාරය	6,750	
සහතික පත්‍ර පාඨමාලා සඳහා වියදම්	7,330	
තොග ලිපිද්‍රව්‍ය	6,400	
පරිභෝජනය කළ හා වීදුරු භාණ්ඩ	50,010	
විනෝදස්වාද වියදම්	96,652	
විදුලි උපකරණ	1,430	
කාර්යාලීය උපකරණ	812,792	
ගෘහ උපකරණ	377,000	
	3,830,119	**3,349,885**

සටහන - 08	2018	2017
ජංගම නොවන වගකීම්	රු.	
ගොවි භාරකාර අරමුදල	875,003	1,458,333
පාරිතෝෂික	5,917,162	4,933,784
ආපසු ගෙවන තැන්පතු	10,000	10,000
	6,802,165	**6,402,117**

නිෂ්පාදන ඒකක වියදම්

සටහන - 09	2018	2017
පුද්ගලික දීමනා	රු.	
වැටුප් හා වේතන	10,682,276	10,657,335
සේවක අර්ථ සාධක අරමුදල	1,281,873	1,274,752
සේවක භාරකාර අරමුදල	320,468	318,688
	12,284,617	**12,250,775**

සටහන - 10	2018	2017
පොදු කාර්යය	රු.	
දුරකතන	36,473	41,554
වතුර	329,263	264,990
විද්‍යාගාර උපකරණ ක්ෂය වීම්	1,082,285	547,753
විදුලිය	1,614,178	1,308,955
පැල නිෂ්පාදන වියදම්	2,449,904	80,059
	5,512,103	**2,243,311**

සටහන - 11	2018	2017
ඉපයූ ආදායම්	රු.	
සහතිකපත්‍ර පාඨමාලාව-අයි.ඒ.ආර්.එස්.	11,206,250	4,978,750
පාඨමාලා ආදායම්	5,017,825	73,096
වෙනත් ආදායම්	399,079	5,750
හදුනා නොගත් ආදායම්- පාඨමාලාව		
ටෙන්ඩර් ගාස්තු	66,000	152,000
නේවාසික ගාස්තු	934,250	355,800
	17,623,404	**5,565,396**

සටහන - 12	2018	2017
පොලී ආදායම	රු.	
ආපදා ණය පොළිය	5,531	10,398
සේවක ණය පොළි		
ආයෝජන පොළි	1,496,990	3,958,365
	1,502,520	**3,968,763**

සටහන - 13	2018	2017
පුද්ගලික පඩිනඩි	රු.	
වැටුප් හා වේතන	25,410,849	17,899,258
සේවක අර්ථ සාධක අරමුදල	1,363,665	1,603,684
විශ්ව විද්‍යාල අර්ථ සාධක අරමුදල	650,365	377,629
විශ්‍රාම වැටුප්	254,261	182,642
සේවක භාරකාර අරමුදල	523,405	493,519
අතිරේක වැඩකළ දින ගෙවීම්	297,727	241,600
අතිරේක වැඩකළ දින ගෙවීම්	261,975	142,513
	28,762,248	**20,940,845**

සටහන - 14	2018	2017
ගමන් වියදම්	රු.	
දේශිය	423,451	350,000
විදේශිය	496,273	537,150
	919,723	**887,150**

සටහන - 15	2018	2017
සැපයුම්	රු.	
යාන්ත්‍රික සහ ඉලෙක්ට්‍රොනික භාණ්ඩ	781,004	100,711
ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා	738,851	428,382
වෛද්‍ය සැපයීම්		
නිල ඇඳුම්	77,560	48,750
ඉන්ධන හා ලිහිසි තෙල්	1,226,408	1,077,796
වෙනත්	740,935	665,640
පාරිභෝජන ද්‍රව්‍ය හා වීදුරු භාණ්ඩ	759,004	194,032
	4,323,763	**2,515,311**

සටහන - 16	2018	2017
නඩත්තු වියදම්	රු.	
පිරියත යන්ත්‍ර හා උපකරණ	253,747	113,733
ගෘහභාණ්ඩ		
මෝටර් වාහන	1,042,007	479,153
ගොඩනැගිලි හා ව්‍යුහ	15,570	33,535
විද්‍යුත් උපකරණ	124,750	
වෙනත්	35,690	322,830
	1,471,764	**949,251**

සටහන - 17	2018	2017
ගිවිසුම්ගත සේවා	රු.	
ප්‍රවාහනය	1,034,715	504,056
තැපැල් හා විදුලි සන්නිවේදනය	2,454,686	1,896,741
විදුලිය	869,173	546,413
ජලය	329,263	264,988
පිරිසිදු කිරීමේ සේවා	1,962,490	
කුලී, බදු සහ පලාත් පාලන ආයතන		
වෙනත්	1,521,376	2,933,500
මුද්‍රණය හා ප්‍රචාරණය යනාදිය	668,154	661,602
	8,839,855	**6,807,301**

සටහන - 18	2018	2017
වෙනත් පුනරාවර්තන වියදම්	රු.	
ආරාධිත දේශන ගාස්තු	189,975	178,650
විශේෂ සේවා - අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් හා කමිටු රැස්වීම	402,500	605,167
වැඩමුළු, සම්මන්ත්‍රණ	372,487	201,575
බැංකු ගාස්තු	6,433	1,000
ව්‍යාප්ති පාඨමාලා වියදම් IARS	1,436,693	432,600
විනෝදාස්වාද වියදම්	399,922	366,469

කාර්ය මණ්ඩල සංවර්ධනය	343,533	558,125
ග්‍රාමීය ව්‍යවසායකත්ව සංවර්ධන (RED) වැඩසටහන් වියදම		
අධ්‍යක්ෂ විනෝදාස්වාද වියදම		
ව්‍යාපෘති කළමනාකාර ගාස්තුව	1,178,190	974,845
කාබනික ගොවිතැන් කිරීමේ ව්‍යාපෘතිය		33,000
බිම්මල් විකිණීමේ වියදම	59,800	241,090
විභාග වියදම	422,200	281,610
ක්ෂේත්‍ර චාරිකා වියදම	11,550	17,400
සත්ව පාලනය	253,540	163,520
වෙනත්		638,899
ගෙවූ පොළී	11,670	20,833
සේවක අර්ථ සාධක අරමුදල් අධිභාර	21,204	
	5,109,697	**4,714,783**

සටහන - 19	**2018**	**2017**
මානව ප්‍රාග්ධන සංවර්ධන	**රු.**	
පර්යේෂණ දිරිගැන්වීම්	325,160	382,978
පාශ්චාත් උපාධි, ආචාර්ය උපාධි ව්‍යාපෘතිය	-	-
	325,160	**382,978**

තිරසර සංවර්ධනය මත පදනම් වූ අනාගත අපේක්ෂිත වාර්තාව

කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය උපාය මාර්ගික කළමනාකරණ සැලැස්ම සකස් කිරීමේදී තිරසාර සංවර්ධන අරමුණු ඉටු වන ආකාරයට සකස් කිරීමට පියවර ගෙන ඇත. ඒ අනුව 2019-2023 වර්ෂ සඳහා සකස් කල උපාය මාර්ගික කළමනාකරණ සැලැස්මේ පහත සඳහන් අරමුණු ස්ථාපිත කර ඇත්තේ පරිසරයට අවම ඍණාත්මක බලපෑමක් ඇති වන ආකාරයට සහ පරිසරය ආරක්ෂා වන අයුරිනි.

අරමුණ 01 : අත්‍යවශ්‍ය ගුණාංගයන්ගෙන් හෙබි උපාධිදාරීන් බිහි කිරීම ඉහළ නැංවීම
අරමුණ 02 : වැඩි දියුණු කළ ව්‍යාපාරිකමය හවුල් සම්බන්ධතා සහ අන්තර්ජාතික සහයෝගීතාවය

අරමුණ 03 : වැඩි දියුණු කළ ශාස්ත්‍රීය පැතිකඩ (academic profile) සහ පර්යේෂණ හා ව්‍යාප්තියේ බලපෑම
අරමුණ 04 : වැඩි දියුණු කළ යටිතල පහසුකම් හා පහසුකම්
අරමුණ 05 : වැඩිදියුණු කළ පාලනය සහ මූල්‍ය කළමනාකරණය/විනය සහ මූල්‍ය යැපීම අඩු කිරීම

මෙම ආයතනය කෘෂි තාක්ෂණය පදනම් කර ගත් ආයතනයක් වන බැවින් පරිසරය ආරක්ෂා කර ගැනීම පිලිබඳ වැඩි අවධානයක් පවතින සහ ප්‍රජාවට කෘෂිකර්මය පිළිබඳව ආදර්ශ සපයන ආයතනයකි.

ඒ අනුව 2018 වර්ෂය තුල දී ආයතනය විසින් පරිසරය ආරක්ෂා කර ගැනීම සහ තිරසාර සංවර්ධනය වෙනුවෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග පහත පරිදි සාරාංශ කොට දැක්විය හැකිය.

1. බිම්මල් බෑග් පිරවීමේ යන්ත්‍රයක් සංවර්ධනය කිරීම.

   මෙම ආයතනයේ කෘෂි තාක්ෂණික උපාධිය හදාරන 7 වන ශිෂ්‍ය කණ්ඩායමේ ශිෂ්‍යයකු වන ජී.පැතුම් හෂාන් මහතා විසින් මෙම යන්ත්‍රය සංවර්ධනය කර ඇති අතර මෙය 25% ක කාර්යක්ෂමතාවයකින් යුක්තව අතින් (manually) ක්‍රියාත්මක කල යුතු යන්ත්‍රයකි. මෙය අතින් ක්‍රියාකරවන බැවින් ඉන්ධන දහනයක් සිදු නොවන අතර එමගින් පරිසරයට සිදු වන හානියක් නොමැති තරම් ය.

2. ක්ෂණික කොළ කැඳ වාණිජමය මට්ටමින් හඳුන්වා දීම.

   මෙම ආයතනය, කරපිංචා, සාම්ප්‍රදායික සහල් සහ කුළුබඩු යෝග්‍ය ප්‍රමාණයන්ගෙන් මිශ්‍ර කර ක්ෂණික කොළ කැඳ වාණිජමය මට්ටමින් හඳුන්වා දී ඇති අතර මෙහි කිසිදු රසායනික සංයෝගයක් නොමැති බැවින් ශරීරයට අහිතකර නොවන බැවින් ඉන් ලැබෙන පෝෂණය ඉතා වැඩිය.

3. ජෛවීය දවටන පදම් කිරීම සහ කෙසෙල් කොළ භාවිතයෙන් ජෛව ආවරණ (පිඟන්) පිරිසැකසුම් කිරීම සඳහා ද්විත්ව කාර්ය යන්ත්‍රයක් නිෂ්පාදනය කිරීම.

   පරිසරයට හානිකර පොලිතීන් ආහාර දවටන භාවිතය අවම කිරීම සඳහා මෙම යන්ත්‍රය හඳුන්වා දී ඇත.

4. ගොවිපොළ පුහුණු පාඨමාලාව යටතේ ශිෂ්‍ය ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා, ආයතනයේ අක්කර 40කින් සමන්විත ගොවිබිම සංවර්ධනය කිරීමේ කටයුතු සඳහා අවශ්‍ය ජලය රැස් කිරීමට අක්කර අඩි 30කින් සමන්විත ජලාශයක් ඉදි කිරීම.

   මෙම ජලාශය ඉදි කර ඇත්තේ ලුණුගම්වෙහෙර ජලාශයෙන් කුඹුරු වලට ලබා දී ඉන් ඉවතට යන කලපුවට මුදා හරින ජලයෙන් ප්‍රයෝජනයක් ගැනීම සඳහා ය. ඒ තුලින් ආයතනය ජල සම්පත අපතේ නොයවා උපරිම ජල කළමනාකරණයක් සිදු කර ඇත.

5. එම ජලාශයේ ජලය උපයෝගී කරගෙන ආයතනයේ අක්කර 02ක වී වගා කල අතර එහි ප්‍රථම වී අස්වැන්න 2018 වර්ෂය තුල දී ලබා ගෙන ඇත. එසේම ආයතයේ ගොවිබිම තුල පටක රෝපණ කෙසෙල් වගාව සහ රෙඩ් ලේඩි නැමති ගස්ලබු වගාව සිදු කල අතර ඉන් ලද අස්වැන්නෙන් ආයතනයේ උපයා ගත් ආදායමට සැලකිය යුතු දායකත්වයක් ලැබිණි.

6. එසේම ආයතනය විසින් සිදු කරන ලද වගාවන් වල තවත් සුවිශේෂත්වයක් වන්නේ කාබනික භෝග නිෂ්පාදනය යි. එම නිසා පරිසර දූෂණය ඉතාමත් අවම මට්ටමක පවතී.

7. අත්‍යවශ්‍ය යටිතල පහසුකම් රාශියක් 2018 වර්ෂය තුල දී ඇති කිරීමට ආයතනයට හැකි විය.

   I. ආයතනයේ වසර ගණනාවක සිට විශාල අඩුපාඩුවක් ලෙස පැවති ආපනශාලාව ඉදි කොට 2018 වර්ෂය තුල විවෘත කිරීම මගින් ආයතනයේ ඉගෙනුම ලබන ශිෂ්‍යයින්ට මෙන්ම කාර්යමණ්ඩලයට ඉතාමත් අඩු මිලකට පෝෂණ ගුණයෙන් යුතු ආහාර ලබා ගැනීමට හැකියාව ලැබී ඇත. එසේම මෙම ආපනශාලාව තුල පාන්පිටි නිෂ්පාදන අලෙවිය මුළුමනින්ම තහනම් කොට ඇත. දේශීය ආහාර සඳහා ප්‍රමුඛතාවය ලබා දී ඇත.

   II. ඉතා දුෂ්කර ප්‍රදේශයක මෙම ආයතනය පිහිටා ඇති බැවින්, අධ්‍යයන සහ පරිපාලන නිලධාරීන් සඳහා විශාල අඩුපාඩුවක් ලෙස පැවති කාර්යමණ්ඩල නිලනිවාසය ඉදි කිරීමේ කටයුතු ආරම්භ කෙරිණි.

   III. අධ්‍යයන අංශයට පමණක් සීමිතව තිබූ වයි ෆයි අන්තර්ජාල පහසුකම් පරිපාලන ගොඩනැගිල්ල දක්වා පුළුල් කිරීම.

   IV. ආයතනයේ ආධ්‍යාත්මික ගුණ වගාව පෝෂණය කිරීම සඳහා බුදු මැදුර ඉදි කිරීමේ කටයුතු ආරම්භ කිරීම.

   V. කෘෂි තාක්ෂණික උපාධිය හදාරන ශිෂ්‍යයින් සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම් වල නිරත වීමට සහ ප්‍රයෝගිකව ඉගැන්වීමේ කටයුතු සිදු කිරීම සඳහා ගව ගාල (Dairy shed), වියළීමේ ඒකකය (Dryer house) සහ බිම්මල් නිෂ්පාදනය කිරීමේ ඒකකය (Mushroom) ඉදි කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී.

8. බයෝ ගෑස් සහ සූර්යය බලශක්තිය යනාදිය උපයෝගී කර ගැනීම. (අලි වැට සඳහා සූර්යය පැනල සවි කොට ඇත්තේ විදුලි බලශක්තිය පිරිමැසීම සඳහාය).

9. භෞමික පරිසර පද්ධති ආරක්ෂා කිරීම සඳහා ආයතනයේ අක්කර 40 ක ගොවිබිම සංවර්ධනය කිරීමේදී පසේ ගුණාත්මක බව විනාශ කරන කටු අන්දර ශාක ඉවත් කර පස ආරක්ෂා කල හැකි සුදුසු ශාක වගා කිරීම.

10. බිම සකස් කිරීමේ දී පස ඛාදනය අවම කිරීමට නිසි ස්ථාන වල කාණු පද්ධති සකස් කිරීම.

11. පරිසරය ආරක්ෂා වන පරිදි වාරිමාර්ග පද්ධති ආයතනය තුල සකස් කිරීම (drip irrigation system).

12. ආයතනය අවට ප්‍රධාන මාර්ගයේ වීදි ආලෝක පද්ධතිය වසර ගණනාවක සිට අබලන්ව පැවති බැවින් පොදුජන යහපත සඳහා වීදි ලාම්පු ආයතනයේ වියදමෙන් දැමීම සහ නඩත්තු කිරීම.

13. හම්බන්තොට ප්‍රදේශයේ ජලය බීමට සුදුසු තත්වයේ නොපවතින බැවින් (වකුගඩු රෝග සහ වෙනත් ආසාදන බහුල නිසා) ආයතනයේ නේවාසිකාගාරය තුල 400කට අසන්න ශිෂ්‍ය සංඛ්‍යාවක් සිටින බැවින් ද නෙවාසිකාරය සඳහා පානීය ජලය ලබා ගැනීමට ජල පිරිපහදු යන්ත්‍රයක් ලබා දීම මගින් ජල සුරක්ෂිතතාවය වැඩි කොට ඇත.

14. ආයතනයේ කෘෂි තාක්ෂණික ක්‍රමවේදයන් පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

15. කෘෂි පර්යේෂණ මගින් නව කෘෂිකාර්මික ක්‍රම වේදයන් හඳුන්වා දීම.

16. ආයතනයේ නිෂ්පාදිත පටක රෝපණ කෙසෙල් පැළ මිලදී ගන්නා ගොවි ව්‍යවසායකයින් සඳහා පසු විපරම් සේවාවක් ඔවුන් අස්වැන්න නෙලා ගන්නා තෙක් නොමිලේ ලබා දෙන බැවින් ගොවි ප්‍රජාවට වගා කටයුතු නිසි පරිදි නිවැරදි තාක්ෂණය භාවිතා කරමින් සිදු කර වැඩි අස්වැන්නක් ලබා ගැනීමට අවකාශය සලසා දී ඇත.

17. මෙම ආයතනයෙන් පිරිනමන කෘෂි තාක්ෂණික උපාධිය හැදෑරීම සඳහා බඳවා ගැනීමේ දී වයස් සීමාවක් නොමැති බැවින් කෘෂිකර්මය පිලිබඳ උනන්දුවක් දක්වන පාර්ශවයන්ට උසස් අධ්‍යාපනයට ප්‍රවේශ වීමේ අවකාශය හිමි වේ. ඒ තුලින් තිරසාර සංවර්ධන අරමුණක් වන සෑම දෙනාටම ජීවිත කාලය පුරාම ඉගෙනීම සඳහා දිරිගැන්වීම් ලබා දේ.

    උදා: ආයතනයේ මෙම වසරේ උපාධිය සම්පූර්ණ කල වයස්ගතම පුද්ගලයාගේ වයස අවුරුදු 52 පමණ වේ.

18. කාර්යාල කටයුතු වල දී කඩදාසි භාවිතය අවම කිරීම (email වැඩි වශයෙන් භාවිතය මගින්) සහ ඉවත දමන එක් පැත්තක් භාවිත කරන ලද කඩදාසි නැවත භාවිතයට ගැනීම (one side papers).

අනාගතයේ දී ආයතනය විසින් පරිසරය ආරක්ෂා කර ගැනීම සහ තිරසාර සංවර්ධනය වෙනුවෙන් ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග පහත පරිදි සාරාංශ කොට දැක්විය හැකිය.

1. ආයතනයේ අක්කර 40 ගොවිපොළ මුළුමනින්ම සංවර්ධනය කිරීමෙන් පසු වාණිජමය මට්ටමෙන් කාබනික ගොවිතැන සහ භෝග වගාව සිදු කිරීම තුලින් ප්‍රජාවට කාබනික ආහාර අලෙවිය මගින් සෞඛ්‍ය තත්වය ඉහළ නැංවීම සහ පෝෂණය ඉහළ නැංවීම.

2. කෘෂි තාක්ෂණික පර්යේෂණ මගින් වඩාත් නව තාක්ෂණික ක්‍රම වේදයන් කෘෂි ව්‍යවසායකයන් වෙත හඳුන්වා දීම.

3. සූර්ය බලශක්තිය මුළු ආයතනය සඳහාම හඳුන්වා දී ජල විදුලිය ඉතිරි කිරීමට පියවර ගැනීම.

4. මුළු ආයතනය සඳහාම ජල පිරිපහදු තාක්ෂනය හඳුන්වා දීම. එමඟින් පානීය ජලය පිටතින් ලබා ගැනීමට යන පිරිවැය අවම වන අතර ජල සංරක්ෂණයක් ද සිදු වේ.

5. භෞමික පරිසර පද්ධති ආරක්ෂා කිරීමට හැකි වන ආකාරයේ පස ආරක්ෂා වන වගාවන් වැඩි වැඩියෙන් හඳුන්වා දීම.

6. ආයතන පරිශ්‍රය තුල අත්‍යවශ්‍ය සෑම ස්ථානයකටම අන්තර්ජාල පහසුකම් ලබා දී ආයතනයේ ශිෂ්‍යයින් ඇතුළු සේවකයින්ට නවීන තාක්ෂණයට ප්‍රවේශ වීමේ අවකාශය ලබා දීම.

7. ආයතනයේ පරිපාලන කටයුතු වල දී මෙන්ම උත්සව අවස්ථාවල දී ද පරිසරය අපවිත්‍ර වන කටයුතු වලින් හැකි තරම් වැළකී සිටීම.

8. කොළ පැහැති වටපිටාවක් නිර්මාණය කිරීම සඳහා ශිෂ්‍යයින් හැකි තරම් ආයතනය තුල කෘෂි ප්‍රායෝගික ක්‍රියාකාරකම් වලදී ගස් සිටුවීමට යොමු කිරීම.

9. “ Minor Fruits and Medicinal Plants” මාතෘකාව ඔස්සේ ආයතනය තුල ජාත්‍යන්තර සමුළුවක් පැවැත්වීම. එම සමුළුවේ දී උක්ත මාතෘකාව යටතේ සිදු කල පර්යේෂණ ඉදිරිපත් කිරීමට හැකියාව ලැබේ.

10. ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට පෙර පාරිසරික බලපෑම් විශ්ලේෂණයක් සිදු කර පාරිසරික බලපෑම අවම වන්නේ නම් පමණක් ඉදි කිරීම් කටයුතු සිදු කිරීම.

11. ආර්ථික පිරිමැසුම්දායි ලෙස විදුලි බලශක්තිය සහ ජල සම්පත භාවිතා කිරීම.

මගේ අංකය / எனது இல. / My No. } එච්ඊඩී/බී/අයිඒආර්එස්/6/18/4 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2019 මැයි 31 දින

අධ්‍යක්ෂ,

කොළඹ විශ්වවිද්‍යාලීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

කොළඹ විශ්වවිද්‍යාලීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ නිෂ්පාදන හා වෙළඳ ප්‍රකාශනය සහ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට / ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

1.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කිරීම.

ජංගම නොවන වත්කම් වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.1,989,274 ක් වූ දේපල පිරියත උපකරණ සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි.ඒ අනුව ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

විස්තර පහත පරිදි විය.

(අ) භාණ්ඩාගාරයෙන් හා අනෙකුත් අංශ වලින් ලද ප්‍රාග්ධන ප්‍රදාන රු.99,704,950 ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ දක්වා තිබුණද, බැංකු ගිණුම අනුව වටිනාකම රු.99,550,000 ක් වීමෙන් මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ මුදල් ප්‍රවාහය රු.154,950 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව ස්ථාවර වත්කම් මිලදී ගැනීම් හා කෙරීගෙන යනු ලබන වැඩ සඳහා මුදල් ගලා යෑම රු.99,919,432 ක් ලෙස දක්වා තිබුණද වියදම් වවුචර් පරීක්ෂා කිරීමේදී එහි අගය රු.100,564,540 ක් වූයෙන් එහි රු.645,108 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) වර්ෂයට අදාල පාරිතෝෂිත වියදම රු.237,526 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) ස්ථාවර වත්කම් යටතේ දැක්වෙන ඵලදායී ජීවකාලය අවුරුදු 10 ක් වන පිරියත, යන්ත්‍ර සූත්‍ර සහ කාර්යාල උපකරණ අයිතම 38 ක ඵලදායී ජීව කාලය අවුරුදු 5 සහ 6 ලෙස සලකා ක්ෂය ගණනය කර තිබීමෙන් සමාලෝචිත වසර සඳහා වන ක්ෂය වියදම රු.87,374 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය සහ ලෙජර් ගිණුම් සැසඳීමේදී වෙනත් වැයකළ ප්‍රදාන ලෙජර් ගිණුම අනුව රු.11,121,146 ක් වැඩියෙන් දක්වා තිබූ අතර විශේෂ වැයකළ ප්‍රදාන ගිණුම එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) ආයතනයේ වත්කම් පරිත්‍යාග ගිණුම් දෙකක ශේෂ පිළිවෙලින් රු.213,276,184 ක් හා රු.3,160,390 ක් වූ අතර ඊට අදාළ වත්කම් ක්ෂය කිරීමට සමාන වටිනාකමකින් ක්‍රමක්ෂය කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට සහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්විතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්විතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .
  - 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.
  - 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනය ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
  - 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති රෙගුලාසි හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද විධිවිධාන වලට යොමුව	විස්තරය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ රෙගුලාසි 371 හා 2015 ජූලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	අත්තිකාරම් අදාළ කාර්යය කඩිනමින් නිමකොට පියවිය යුතු වුවත් අවස්ථා 08 කදී ලබාගෙන තිබූ එකතු වටිනාකම රු.477,500 ක අත්තිකාරම් පියවීම සඳහා දින 65 සිට දින 180 ක් දක්වා කාලයක් ප්‍රමාද වී තිබුණි.
(ආ)	2014 ඔක්තෝම්බර් 17 දිනැති අංක 2/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	සෑම මුදල් වර්ෂයකම ජනවාරි 15 දිනට පෙර භෞතික භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර මාර්තු 17 වන දිනට පෙර පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාට පිටපතක් සහිතව විගණකාධිපති වෙත යොමු කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.

2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) ගොවීන්ගේ භාරකාර අරමුදල මඟින් ගොවීන් 16 දෙනෙකු වෙත ලබාදී තිබුණු රු.3,024,000 ක් වටිනා ණය මුදලින් රු.1,582,935 ක ශේෂයක්ද, ග්‍රාමීය ව්‍යවසාය සංවර්ධන වැඩසටහන යටතේ ගොවීන් තිදෙනෙකු වෙත 2012 වර්ෂයේ ලබාදුන් රු.312,000 ක් වටිනා ණය මුදලින් රු.58,100 ක් සහ "Planting Material" යන ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබාගත් ගොවීන් 06 දෙනෙකුගෙන් රු.420,810 ක ණය ශේෂයක්ද අයකරගෙන නොතිබුණි.

(ආ) පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දල ලාභය රු.1,422,395 කින් අඩු වී තිබූ අතර එය සියයට 150 කින් මෙහෙයුම් ක්‍රියාකාරීත්වයේ අසාමාන්‍ය අඩු වීමක් සිදුවී තිබුණි.

(ඇ) ආයතනයෙහි ප්‍රසම්පාදන සැලැස්මට අනුව එකතු වටිනාකම රු.47,870,000 ක් වූ ප්‍රසම්පාදනයන් 21ක් සමාලෝචිත වර්ෂය තුළ ඉටු කර නොතිබුණ අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.11 මාර්ගෝපදේශය පරිදි ප්‍රසම්පාදනයන් වෙනුවෙන් සකස් කර ඇති පිරිවිතරයන් සමාලෝචනය කිරීම සහ අනුමත කිරීම තාක්ෂණික ඇගයීම් කමිටුවල වගකීම වුවද නියැදි පරීක්ෂාවේ දී ප්‍රසම්පාදනයන් 06 ක් සම්බන්ධව එසේ තාක්ෂණික ඇගයීම් කමිටු අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3 (ආ) මාර්ගෝපදේශය අනුව ලංසු කැඳවීම අවසන් වනවාත් සමගම හැකිතාක් ඉක්මණින් ලංසු විවෘත කළ යුතු වුවත් නියමිත දිනය ඉක්මවා දින 02 සිට දින 38 දක්වා ප්‍රමාද වී ලංසු විවෘත කළ අවස්ථා 06 ක් පැවතුණි.

(ඇ) ආයතනය සතුව 2016 සහ 2017 වර්ෂවලදී මිලදී ගත් රු.643,498 ක් වටිනා පුස්තකාල පොත් 145 ක් පැවති අතර ආයතනයේ පුස්තකාල පහසුකම් නොමැති වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම මෙම පොත් සිසුන්ට පරිහරණය කිරීමට නොහැකිව පැවතුණි.

3. වෙනත් නිරීක්ෂණ

(අ) 2018 වර්ෂයේ කාර්යසාධන දර්ශක අනුව ආයතනයේ ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් සහ ප්‍රගතිය පරීක්ෂා කිරීමේ දී ක්‍රියාකාරකම් 11 ක කිසිදු ප්‍රගතියක් නොතිබූ අතර ක්‍රියාකාරකම් 06 ක ප්‍රගතිය සියයට 2 සිට සියයට 33 ක් දක්වා අඩු මට්ටමක පැවතුණි.

(ආ) කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ආයතනයක් ලෙස පවත්වා ගෙන යනු ලබන මෙම ආයතනය කොළඹ විශ්වවිද්‍යාලයේ කෘෂි තාක්ෂණික පීඨය ලෙස හඳුන්වා දීමට 2018 වර්ෂයේ කටයුතු කර තිබුණි.මේ වන විට එක් උපාධියක් පමණක් පිරිනමනු ලබන අතර මෙම නව යෝජනාව අනුව පීඨය තුළ අධ්‍යයන අංශ 04 ක් පිහිටුවා එමගින් උපාධි පාඨමාලා 02 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද ඒ සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී නොතිබුණි.

(ඇ) ආයතනය පිහිටා ඇති අක්කර 50 ක භූමි භාගය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතුවන අතර එහි ඉදිකිරීම් සිදුකර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එහි අයිතිය නීත්‍යානුකූලව ආයතනයට පවරා නොතිබුණි.

(ඈ) 2018 වර්ෂයේ ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 36 ක් වන අතර තත්‍ය කාර්ය මණ්ඩලය නිලධාරීන් 11 ක් විය. ඒ අනුව සමස්ත කාර්ය මණ්ඩල ඌනතාවය 25 ක් වන අතර අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ආචාර්යවරු 05 දෙනෙකුගේ ඌනතාවයක් පැවතුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ අයවැය හා තත්‍ය වියදම් සැසඳීමේදී අභ්‍යන්තර ඉපයූ ආදායම ඇස්තමේන්තුගත ආදායමට වඩා සියයට 45 කින් අඩු වී තිබූ අතර වැය විෂයයන් 05 ක වියදම අයවැයගත සහ තථ්‍ය අගයන් අතර වෙනස සියයට 23 සිට සියයට 42 දක්වා පරාසයක පැවතුණි.

(ඊ) සහකාර පාඨමාලා සම්බන්ධීකාරවරයෙකු වෙත පර්යේෂණ කටයුතු සඳහා අයවැයගත රු.3,000,000 ක මුදලින් සමාලෝචිත වර්ෂයේ ප්‍රදාන ලෙස රු.30,302 ක මුදලක් ලබා දී තිබුණි. පර්යේෂණ යෝජනාව 2017 සැප්තැම්බර් 22 දින ලබා දී තිබූ අතර පර්යේෂණ කටයුතු 2018 සැප්තැම්බර් 22 දිනෙන් අවසන් විය යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අවසන් වී නොතිබුණු අතර කාලය දීර්ඝකර ගැනීමද සිදු වී නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

2018 විගණකාධිපති වර්තාව සඳහා පිළිතුරු

කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය

විගණන වාර්තා වේ ඡේද අංකය	විගණන විමසුමෙහි සඳහන් කරුණ	විගණන විමසුම සඳහා පිළිතුරු
1.	**ගිණුම්** ------------	
1.2.1	**ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත** --	
	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ජංගම නොවන වත්කම් වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.1,989,274 ක් වූ දේපල පිරියත උපකරණ සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි.ඒ අනුව ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.	ඔබගේ නිරීක්ෂණයන් සමඟ එකඟ වේ. 2019 වර්ෂයේ අවසාන ගිණුම් තුළින් මෙය නිවැරදි කරන බව දන්වා සිටිමි.
1.2.2	**ගිණුම්කරණ අඩුපාඩු** -----------------------	
	<u>මුදල් ප්‍රවාහ ප්‍රකාශය</u>	
(අ)	භාණ්ඩාගාරයෙන් හා අනෙකුත් අංශ වලින් ලද ප්‍රාග්ධන ප්‍රදාන රු.99,704,950 ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ දක්වා තිබුණද ,බැංකු ගිණුම අනුව වටිනාකම රු.99,550,000 ක් වීමෙන් මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ මුදල් ප්‍රවාහය රු.154,950 කින් වැඩියෙන් දක්වා තිබුණි.	හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය තුළ ආරම්භක ශේෂයට පසුගිය වර්ෂයේ ගැලපුම් රු. 154,950 වැරදීමකින් ප්‍රාග්ධන ලැබීම් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල සටහන් වී ඇති අතර ඉදිරි ගිණුම් වර්ෂය තුළ තවදුරටත් නිවැරදි කිරීමට කටුයුතු කරමි.
(ආ)	මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව ස්ථාවර වත්කම් මිලදී ගැනීම් හා කෙරීගෙන යනු ලබන වැඩ සඳහා මුදල් ගලා යෑම රු.99,919,432 ක් ලෙස දක්වා තිබුණද වියදම් වවුචර් පරීක්ෂා කිරීමේදී එහි අගය රු.100,564,540 ක් වූයෙන් එහි රු.645,108 ක වෙනසක් නිරීක්ෂණය විය.	මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව ස්ථාවර වත්කම් මිලදී ගැනීම හා කෙරීගෙන යනු ලබන වැඩ සඳහා මුදල් ගලා යෑම රු.99,919,432 ක් ලෙස දක්වා ඇති අතර වියදම්වවුවර් පරීක්ෂා කිරීමේදී එහි අගය රු.100,564,540 ක් වූ බවට නිරීක්ෂණයක් ඉදිරිපත් කර ඇත. වවුවර් පරීක්ෂා කිරීමේදී කාර්මික නිළධාරියට ගෙවූ මාස 12 ක වැටුප ද එකතු කර ඇති අතර එම අගයන් හැර වෙනත් වෙනස් කම් පිළිබඳ

		සොයා බලා ඉදිරියේ දී මෙම වෙනස්කම් ගිණුම් තුළින් ඉවත් කිරීමට කටයුතු කරනු ඇත.
(ඈ)	වර්ෂයට අදාල පාරිතෝෂිත වියදම රු.237,526 ක් අඩුවෙන් දක්වා තිබුණි.	මෙම මුදල සමන්විත වන්නේ එස්.වී. ජී. එන්. ප්‍රියදර්ශනී මෙනවියගේ පාරිතෝෂික ගෙවීම් සඳහා වූ ඌන ප්‍රතිපදනයන්ය. මෙම ඌන ප්‍රතිපදනයන් මීලග ගිණුම් වර්ෂයේ තවදුරටත් නිවැරදි කරනු ඇත.
(ඈ)	ස්ථාවර වත්කම් යටතේ දැක්වෙන ඵලදායී ජීවකාලය අවුරුදු 10 ක් වන පිරියත, යන්ත්‍රසූත්‍ර සහ කාර්යාල උපකරණ අයිතම 38 ක ඵලදායී ජීව කාලය අවුරුදු 5 සහ 6 ලෙස සලකා ක්ෂය ගණනය කර තිබීමෙන් සමාලෝචිත වසර සඳහා වන ක්ෂය වියදම රු.87,374 කින් අඩුවෙන් දක්වා තිබුණි.	ඔබගේ නිරීක්ෂණයන් සමඟ එකඟ වේ. 2019 වර්ෂයේ අවසාන ගිණුම් තුළින් මෙය නිවැරදි කරන බව දන්වා සිටිමි.
(ඉ)	හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ ලෙජර් ගිණුම් සැසඳීමේදී වෙනත් වැයකළ ප්‍රධාන ලෙජර් ගිණුම් අනුව රු.11,121,146 ක් වැඩියෙන් දක්වා තිබූ අතර විශේෂ වැය කළ ප්‍රධාන ගිණුම එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	විශේෂ වැයකළ ප්‍රදාන ගිණුමෙහි මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු.213,276,184 ක් වුවද ඊට අදාල ලෙජර් ගිණුම් අනුව ශේෂය රු.202,155,038 ක් වූ බැවින් එහි රු.11,121,146 ක නිරීක්ෂණය වූ වෙනස අදාල ලෙජර් ගිණුම වෙනස් විය යුතු අතර විශේෂ වැයකළ ප්‍රදාන ගිණුමෙහි මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය නිවැරදි වේ.
(ඊ)	ආයතනයේ වත්කම් පරිත්‍යාග ගිණුම් දෙකක ශේෂ පිළිවලින් රු.213,276,184 ක් හා රු.3,160,390 ක් වූ අතර ඊට අදාළ වත්කම් ක්ෂය කිරීමට සමාන වටිනාකමකින් කමක්ෂය කර නොතිබුණි.	ඔබගේ නිරීක්ෂණයන් සමඟ එකඟ වේ. 2019 වර්ෂයේ අවසාන ගිණුම් තුළින් මෙය නිවැරදි කරන බව දන්වා සිටිමි.
2.2	නීති රීති රෙගුලාසි	
(අ)	අත්තිකාරම් අදාළ කාර්යය කඩිනමින් නිමකොට පියවිය යුතු වුවත් අවස්ථා 08 කදී ලබාගෙන තිබූ එකතු වටිනාකම රු.477,500 ක අත්තිකාරම් පියවීම සඳහා දින 65 සිට දින 180 ක් දක්වා කාලයක් ප්‍රමාද වී තිබුණි..	අත්තිකාරම් පියවීමේදී මෙය මග හැරී ප්‍රමාද වී ඇති අතර ඉදිරියේ දී මෙවැනි දේ නොවීමට වග බලා ගනු ඇත.
(ආ)	**2014 ඔක්තෝම්බර් 17 දිනැති අංක 2/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය**	

	සෑම මුදල් වර්ෂයකම ජනවාරි 15 දිනට පෙර භෞතික භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර මාර්තු 17 වන දිනට පෙර පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට පිටපතක් සහිතව විගණකාධිපති වෙත යොමු කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.	සෑම මුදල් වර්ෂයකම ජනවාරි 15 දිනට පෙර භෞතික භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර මාර්තු 17 වන දිනට පෙර පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට පිටපතක් සහිතව විගණකාධිපති වෙත යොමු කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. මෙම කටයුත්ත ඉතාමත් විධිමත් භාවයෙන් ඉටු කිරීම සඳහා බාහිර පාර්ශවයක් ලෙස හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයට පාවරා ඇති අතර එම පාර්ශවයේ අධික රාජකාරි බහුලතාව මත මෙවර භෞතික භාණ්ඩ සමීක්ෂණ කටයුතු මදක් ප්‍රමාද වූ අතර එම තත්වය වලක්වා ගැනීමට ඔවුන් හට නිරන්තර සිහි කැඳවීම් සිදුකරමින් කටයුතු කළේය. නමුත් හදිසි රාජකාරි තත්වයන් මත ඔවුන්ගේ කටයුතු නිසි වෙලාවට සිදු කිරීම වැළකුණු අතර පිටපත් යැවීම ප්‍රමාද විය.මීලග ගිණුම් වර්ෂයේදී එම තත්වය මගහරිමින් කටයුතු කිරීමට ආයතනය කටයුතු කරනු ඇත.
2.4		
(අ)	ගොවීන්ගේ භාරකාර අරමුදල මඟින් ගොවීන් 16 දෙනෙකු වෙත ලබාදී තිබුණු රු.3,024,000 ක් වටිනා ණය මුදලින් රු.1,582,935 ක ශේෂයක් ද, ග්‍රාමීය ව්‍යවසාය සංවර්ධන වැඩසටහන යටතේ පුද්ගලයින් තිදෙනෙකු වෙත 2012 වර්ෂයේ ලබාදුන් රු.312,000 ක් වටිනා ණය මුදලින් රු.58,100 ක සහ යන ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබාගත් ගොවීන් 06 දෙනෙකුගෙන් රු.420,810 ක ණය ශේෂයක් ද අය කර ගෙන නොතිබුණි.	ඔබගේ නිරීක්ෂණයන් සමඟ එකඟ වෙමි. හිඟ ණය වාරික අය කර ගැනීමට ඇති අපහසුතාව හේතුවෙන් 2017.12.12 දින පැවති 56 වන කළමනාකරණ මණ්ඩල රැස්වීමේ දී ණය වාරික ගෙවීම් පැහැර හැර ඇති ශිෂ්‍යයින්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කළ අතර ඒ සඳහා කොළඹ විශ්ව විද්‍යාලයේ නීති නිලධාරිණියගෙන්, ඒ හා සම්බන්ධ නීතිමය තත්වය විමසා බැලීම සඳහා සියලු තොරතුරු යොමු කර ඇත. ඊට අදාල නීතිමය එකඟතාවය ලබා ගැනීම සඳහා එය නීති සම්පාදන කමිටුව (Legislation Committee) වෙත යොමු කර ඇති බව කොළඹ විශ්ව විද්‍යාලයේ නීති නිලධාරිණිය අප දැනුවත් කර ඇත. නීති සම්පාදන කමිටු අනුමැතිය ලද පසු ණය වාරික ගෙවීම් පැහැර හැර ඇති ශිෂ්‍යයින්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂා කෙරේ.
(ආ)	පසුගිය වර්ෂයට සාපේක්ෂව මෙම වර්ෂය තුළ දළ ලාභය රු.1,422,395 කින් අඩු වී තිබූ අතර එය 150% කින් මෙහෙයුම් ක්‍රියාකාරීත්වයේ අසාමාන්‍ය අඩු වීමක් සිදු වී තිබුණි.	පටක රෝපණ අංශයේ අනපේක්ෂිත අයුරින් සිදු වූ පසුබැසීම දළ ලාභය අඩු වීම සඳහා උග්‍ර ලෙස බලපා ඇත.

(ඇ)	ආයතනයෙහි ප්‍රසම්පාදන සැලැස්මට අනුව එකතු වටිනාකම රු.47,870,000 ක් වූ ප්‍රසම්පාදනයන් 21ක් සමාලෝචිත වර්ෂය තුළ ඉටු කර නොතිබුණ අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.11 මාර්ගෝපදේශය පරිදි ප්‍රසම්පාදනයන් වෙනුවෙන් සකස් කර ඇති පිරිවිතරයන් සමාලෝචනය කිරීම සහ අනුමත කිරීම තාක්ෂණික ඇගයීම් කමිටුවල වගකීම වුවද නියැදි පරීක්ෂාවේ දී ප්‍රසම්පාදනයන් 06 ක් සම්බන්ධව එසේ තාක්ෂණික ඇගයීම් කමිටු අනුමැතිය ලබාගෙන නොතිබුණි.තවද,ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3 (ආ) මාර්ගෝපදේශය අනුව ලංසු කැඳවීම අවසන් වනවාත් සමගම හැකිතාක් ඉක්මණින් ලංසු විවෘත කළ යුතු වුවත් නියමිත දිනය ඉක්මවා දින 02 සිට දින 38 දක්වා ප්‍රමාද වී ලංසු විවෘත කළ අවස්ථා 06 ක් පැවතුණි.	රජය විසින් දෙනු ලබන ප්‍රතිපාදන නිසි වෙලාවට නොලැබීම හා අනුමත මුළු මුදලම නොලැබීම ආදී කරුණු මත මුල්‍යමය අපහසුතා මධ්‍යයේ බොහෝ ප්‍රසම්පාදන සිදු කරන අතර එවැනි තත්වයන් තුල බොහෝ සැලසුම් ගත කරනු ලබන ප්‍රසම්පදනයන් ප්‍රමාද වන අතර 2018 වසර සඳහා ලැබිය යුතු රු . මිලියන 3.05 මේ වන තෙක් නිදහස් කර නැත. එසේම ආයතනය තුල සියලුම අංශයන්හි නිසියාකාරයෙන් ක්‍රියාකාරකම් සිදුකිරීමට පොදුවේ සීමාසහිත සේවක පිරිසක් සිටින බැවින් සියලු කාර්යන් සැලසුම් ගත අයුරින්ම සිදු කිරීම අපහසු බවට පත්ව ඇත. ඔබගේ නිරික්ෂණය හා එකග වෙමි.මින් ඉදිරියට මෙවැනි වැරදි සිදු නොවීමට කටයුතු කරමි. ඔබගේ නිරික්ෂණය හා එකග වෙමි.කාර්යයන් ඉටු කිරිම සඳහා ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් නොමැති බැවින් එම අවශ්‍යතාවයන් නිසි ආකාරයෙන් නොහැකි වී ඇති අතර ඉදිරියට මෙවැනි වැරදි සිදු නොවිමට කටයුතු කරමි.
(ඈ)	ආයතනය සතුව 2016 සහ 2017 වර්ෂවලදී මිලදී ගත් රු.643,498ක් වටිනා පුස්තකාල පොත් 145 ක් පැවති අතර ආයතනයේ පුස්තකාල පහසුකම් නොමැති වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම මෙම පොත් සිසුන්ට පරිහරණය කිරීමට නොහැකිව පැවතුණි.	මෙම පොත් මේ වන විට ආචාර්ය මණ්ඩලය හරහා සිසුන් ගේ පරිහරණයට ලබාදෙන අතර හැකි ඉක්මණින් මේ සඳහා ස්ථානයක් ලබාදීමට කටයුතු කරනු ඇත.
3	වෙනත් නිරීක්ෂණ	
(අ)	2018 වර්ෂයේ කාර්යසාධන දර්ශක අනුව ආයතනයේ ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් සහ ප්‍රගතිය පරීක්ෂා කිරීමේ දී ක්‍රියාකාරකම් 11 ක කිසිඳු ප්‍රගතියක් නොතිබූ අතර දී ක්‍රියාකාරකම් 06 ක ප්‍රගතිය සියයට 2 සිට සියයට 33 ක් දක්වා අඩු මට්ටමක පැවතුණි.	ක්‍රියාකාරීසැලැස්මේ දක්වා ඇති සමහර ක්‍රියාකාරකම් ප්‍රගතියකින් තොරව අවසන් වී ඇත්තේ ප්‍රාග්ධන අරමුදල් ප්‍රමාණවත් පරිදි ආයතනයට අනුමත නොවීම හා අනුමත මුලු මුදලම නොලැබිම නිසාය.මීළග ගිණුම් වර්ෂය තුල මෙම කටයුතු නිසි ආකාරයෙන් සිදු කිරිමට අදාල ක්‍රියාකාරී සැලසුම් සකස් කරනු ඇත.
(ආ)	කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ආයතනයක් ලෙස පවත්වා ගෙන යනු ලබන මෙම ආයතනය කොළඹ විශ්වවිද්‍යාලයේ කෘෂි තාක්ෂණික පීඨය ලෙස හඳුන්වා දීමට 2018 වර්ෂයේ කටයුතු කර තිබුණි.මේ වන විට එක් උපාධියක් පමණක් පිරිනමනු ලබන අතර මෙම නව යෝජනාව අනුව පීඨය තුළ අධ්‍යයන අංශ 04 ක් පිහිටුවා එමගින් උපාධි පාඨමාලා 02 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද ඒ සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී නොතිබුණි.	මේ වන විට මේ සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව පාලන අංශය (Quality Assurance Council)වෙත අනුමැතිය ලැබී ඇති අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේStanding Committee හී දී සාකච්ඡා වෙමින් පවතී

(ඇ)	ආයතනයේ පිහිටා ඇති අක්කර 50 ක භූමි භාගය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතුවන අතර එහි ඉදිකිරීම් සිදු කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එහි අයිතිය නීත්‍යානුකූලව ආයතනයට පවරා නොතිබුණි	ඔබගේ නිරීක්ෂණයන් සමඟ එකඟ වෙමි. අක්කර 50 ඉඩමේ නීත්‍යානුකූලඅයිතිය ලබා ගැනීමට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටි සියලුම වාර්තා (Contour survey, Master Plan, Drainage plan, Building plans, waste water management plan, landscape plan and etc.) විශාල පරිශ්‍රමයක් සහ විශාල පිරිවැයක් දරමින් සකස් කොට 2018.02.19 දින වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. කෙසේවෙතත්, මීට ප්‍රතිචාරයක් නොමැති නිසා 2018.10.12 දින ද සිහි කැඳවීම් ලිපියක් යොමු කර ඇත. අක්කර 50 ඉඩමේ නීත්‍යානුකූලඅයිතිය ආයතනයට පවරා ගැනීම සඳහා, දැනට ආයතනය පැත්තෙන්සිදු කල යුතු සියලු කටයුතු සිදු කර අවසන්ය. එසේම මෙම අක්කර 50 ඉඩම් කොටස සඳහා දැනට රු.1,080,000.00 ක බදු මුදලක් ද ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ගෙවා ඇත. එසේම , 2017 වර්ෂය අග භාගයේ දී, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ දී අක්කර 50ට අදාල නීත්‍යානුකූල ලියවිලි අත්සන් කල ද මේ වන තෙක් එම ලේඛන අප වෙත ලැබී නොමැත.
(ඈ)	2018 වර්ෂයේ ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 36 ක් වන අතර තත්‍ය කාර්ය මණ්ඩලය නිලධාරීන් 11 ක් විය. ඒ අනුව සමස්ත කාර්ය මණ්ඩල ඌනතාවය 25 ක් වන අතර අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ආචාර්යවරු 05 දෙනෙකුගේ ඌනතාවයක් පැවතුණි.	ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයෙන් තනතුරු 24ක් අනධ්‍යයන තනතුරු වන බැවින්, 876 චක්‍රලේඛය ප්‍රකාරව එම තනතුරු සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලැයිස්තුවකින් නියමිත ක්‍රමවේදය ප්‍රකාරව බඳවා ගත යුතුය. ඒ අනුව තනතුරු කිහිපයක් සඳහා පමණක් එකී නම් ලැයිස්තුව ආයතනය වෙත ලැබුණ ද එහි තරඟ විභාගයකින් බඳවා ගනීමට ප්‍රමාණවත් තරම් අයදුම්කරුවන් නොසිටි බැවින් නැවත ලැයිස්තුවක් ඉල්ලා සිටිය ද එය ලැබුනේ නැත. එම නිසා අනධ්‍යයන තනතුරු පුරප්පාඩු පිරවීමට නොහැකි වූ අතර නියමිත කාලයට සියලු පුරප්පාඩු සඳහා නාම ලේඛන ලැබුනහොත් 2019 වර්ෂය අවසන් වීමට පෙර අනධ්‍යයන තනතුරු සියලු පුරප්පාඩු පිරවීමට අපේක්ෂා කෙරේ. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ආචාර්යවරු 05දෙනාගෙන් 03 දෙනෙකු බඳවා ගැනීමට, නියමිත බඳවා ගැනීම් පටිපාටිය අනුගමනය කර එක් කථිකාචාර්යවරයෙකු බඳවා ගත් අතර, ඉතිරි දෙදෙනා බඳවා ගැනීමට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ අනුමැතියට යොමු කර දිගු කාලයක් සිටි අතර පසුව 2019 වසරේ මුල් භාගයේ ඒ සඳහා අනුමැතිය හිමි නොවන බව දැන් වූ බැවින් නැවත ඇබෑර්තු දැන්වීම් පල කර අයදුම්පත් කැඳවා ඇත. 2019 වර්ෂය අවසන් වීමට පෙර සියලු අධ්‍යයන තනතුරු වල පුරප්පාඩු පිරවීමට අපේක්ෂා කෙරේ. 2019 පෙබරවාරි මස අවසානයේ දී, 2018 වසරේ බඳවා ගත් කථිකාචාර්යවරයා ද ආයතනයෙන් ඉවත්ව ගොස් ඇත.

(ඉ)	සමාලෝචිත වර්ෂයේ අයවැය හා තත්‍ය වියදම් සැසඳීමේදී අභ්‍යන්තර ඉපයූ ආදායම ඇස්තමේන්තුගත ආදායමට වඩා සියයට 45 කින් අඩු වී තිබූ අතර වියදම් විෂයයන් 05 ක අයවැය ගත සහ තථ්‍ය අගයන් අතර වෙනස සියයට 23 සිට සියයට 42 දක්වා පරාසයක පැවතුණි.	සමාලෝචිත වර්ෂයේ අයවැය හා තත්‍ය වියදම් සැසඳීමේදී වියදම් අධි පුරෝකථනයක් සිදු කර තිබූ බව වූ නිරීක්ෂණය සමග එකඟ විය හැකි අතර ආයතනය තුල සිදුවන සීඝ්‍ර සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාශීලිව පැවතීමයි. එවැනි කටයුතු සිදු කිරීමේදී ප්‍රාග්ධන මෙන්ම පුනරාවර්තන වියදම්ද ඒ වෙනුවෙන් දැරීමට සිදුවන අතර අයවැයගත ප්‍රතිපාදන මතම කටයුතු කිරීම ප්‍රයෝගිකව ඉතාමත් අපහසු කාර්යකි. එසේම පටක රෝපණ අංශයේ අනපේක්ෂිත අයුරින් සිදු වූ පසුබැසීම අදායම් පුරෝකථන වෙනස් වීමට හේතුවූ අතර මීළඟ වර්ෂයේදී අයවැය සකස් කිරිමේදී මේ පිලිබඳ දැඩි අවධානයක් යොමු කරමින් කටයුතු කරනු ලැබේ.
(ඊ)	සහකාර පාඨමාලා සම්බන්ධීකාරවරයෙකු වෙත පර්යේෂණ කටයුතු සඳහා අයවැයගත රු.3,000,000 ක මුදලින් සමාලෝචිත වර්ෂයේ ප්‍රදාන ලෙස රු.30,302 ක මුදලක් ලබා දී තිබුණි.පර්යේෂණ යෝජනාව 2017.09.22 දින ලබා දී තිබූ අතර පර්යේෂණ කටයුතු 2018.09.22 දිනෙන් අවසන් විය යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසන් වී නොතිබුණු අතර කාලය දිගු කරගැනීම සිදු වී නොතිබුණි.	පර්යේෂණ කටයුතු අවසන් කිරීමට තවදුරටත් කාලය අවශ්‍ය වන බව දන්වා එය දික්කර දෙන ලෙස ඉල්ලා ලිපියක් අංශ ප්‍රධාන වෙත මේ වන විට ඉදිරිපත් කර ඇත. එහෙත් මෙම පර්යේෂණ කටයුතුසඳහා ආයතනය වෙත මෙම වසර සඳහා මුදල් ලැබී නොමැත.පර්යේෂණය තවදුරටත් සිදුවෙමින් පවතින අතර ආයතනයෙහි මුදල් මේ සඳහා ලබා නොගැනේ.